# මහව නගර සංවර්ධන සැලැස්ම
# 2018-2030
# වෙළුම I



නාගරික සංවර්ධන අධිකාරිය
“සෙත්සිරිපාය”
බත්තරමුල්ල

# වෙළුම I

# සංවර්ධන සැලැස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
‘‘සෙත්සිරිපාය‘‘
බත්තරමුල්ල
සංවර්ධන සැලැස්ම-2030

ලේඛන තොරතුරු

| | |
|---|---|
| වාර්තාවේ මාතෘකාව | : මහව නාගරික සංවර්ධන සැලැස්ම |
| ස්ථානගත මායිම් | : නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය |
| ගැසට් අංක | : |
| සේවාදායකයා / පාර්ශ්වකරු | : මහව ප්‍රාදේශීය සභාව, අදාළ ආයතන |
| ඉදිරිපත් කිරීමේ දිනය | : |
| ලේඛණ තත්ත්වය | : |

කර්තෘ : වයඹ පළාත් කාර්යාලය - නාගරික සංවර්ධන අධිකාරිය

**ලේඛන ඉදිරිපත් කිරීමේ විස්තර**

| සංස්කරණය අංකය | විස්තර | ඉදිරිපත් කරන දිනය | අනුමත කිරිම හා පවතින ගැටළු |
|---|---|---|---|
| 1 | කෙටුම්පත | | |
| 2 | අවසාන | | |

සියලුම හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශයනයේ කිසිදු කොටසක් පූර්ව ලිඛිත අවසරයකින් තොරව, ඕනෑම ආකාරයක ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම හෝ වෙනත් විද්‍යුත් හෝ යාන්ත්‍රික ක්‍රම ඇතුළුව ඕනෑම ආකාරයකින් බෙදා හැරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

ප්‍රකාශය

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව

6 සහ 7 වන මහල

සෙත්සිරිපාය

බත්තරමුල්ල.

වෙබ් අඩවිය - wwwudagove.lk

විද්‍යුත් තැපැල - Infoudagov.lk

දුරකථන - +94112873637

# පූර්විකාව

2008.02.08 වන දින අංක 1535/14 ගැසට් නිවේනයට යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් මහව නගරය හා අවට ග්‍රාම සේවා වසම් 24ක් නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ප්‍රදේශය කෘෂිකාර්මික ආර්ථිකය ප්‍රධාන කරගත් කෙත්වතු හා වැව් වලින් පෝෂිත ප්‍රදේශයක් ලෙස දැක්විය හැක. ඒ අනුව, ප්‍රදේශය තුළ පවතින තත්වය විද්‍යාත්මක විශ්ලේෂණයන් පදනම් කර සිදු කළ අධ්‍යයනය තුලින් හඳුනාගත් ප්‍රධාන ගැටළු අනුව අනාගත මහව නගර සංවර්ධන සැලැස්ම සකස් කොට ඇත. එහිදී මෙම ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථිකය වන කෘෂිකර්මාන්තය නගා සිටුවීමත්, යාපහුව හා බැඳුණු සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමටත් හා ප්‍රදේශයේ අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි කෘෂිකාර්මික සේවා සපයන නගරයක් ලෙස අනාගත දැක්ම සාක්ෂාත් කරගැනීම අපේකෂා කරනු ලැබේ.

මෙම අනාගත දැක්ම 2030 වසර වන විට අපේක්ෂා කරලීම උදෙසා අවශ්‍ය අරමුණු සහ පරමාර්ථ සකස් කර ඇති අතර, තිරසාර පාරිසරික උපාය මාර්ගයන් සහිතව වයඹ පළාත තුළ බිහිවන කෘෂිකාර්මික පුරවරයක් ලෙස මහව ප්‍රදේශය සංවර්ධනය කිරීම අරමුණු කෙරේ.

ඒ අනුව, කෘෂිකාර්මික ආර්ථික නාගරික සංවර්ධනයට උපරිම කිරීමත්, කෘෂිකාර්මික වෙළඳසල ක්‍රමය 100% ප්‍රදේශය තුළම ස්ථාපිත කිරීමත්, යාපහුව හා බැඳුණු ප්‍රදේශයේ අනන්‍යතාවට ආරක්ෂා කරමින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය හා ප්‍රදේශයේ ජල අවශ්‍යතාවය ඇතුලු අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් මෙම සැලසුමේ අන්තර්ගත වන අතර එය මෙම ප්‍රදේශයේ සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය මත ගොඩනැගී ඇත.

# ප්‍රණාමය

2019-2030 කාල පරාසය සඳහා මහව නාගරික බල ප්‍රදේශයේ අනාගත සංවර්ධන දිශානතිය හඳුනාගනිමින්, මහව ප්‍රදේශය සඳහා භෞතික, අර්ථික, සමාජීය හා පාරිසරික අංශයක් ඒකාබද්ධ වූ නගර සංවර්ධන සැලැස්මක් සකස් කරලීම උදෙසා ඍජුව මෙන්ම වක්‍රාකාරව සහය දැකවූ පාර්ශවයන් ගෞරවයෙන් සහ ස්තුති පූර්වකව සිහි ගැන්වීම අප සතු යුතුකමක් වේ.

ප්‍රධාන වශයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමන් වන එච්. පියසේන මහතා ඇතුළු මහජන නියෝජිතයන් මෙම සංවර්ධන සැලැස්ම සාර්ථක කර ගැනීම උදෙසා දැක්වූ නොමසුරු දායකත්වයට අපගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරන්නට කැමැත්තෙමු. එසේම, සංවර්ධන සැලැස්මේ මූලික පසුබිම ලෙස වර්ථමාන තත්වය විශ්ලේෂණය උදෙසා දත්ත හා තොරතුරු නොමසුරුව ලබා දෙමින් සහයෝගය පළ කළ මහව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඇතුලු සියලුම කාර්ය මණ්ඩලයත් මෙහිදී විශේෂයෙන් ස්තුතිය පළ කළ යුතුව ඇත.

එමෙන්ම, මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, දුම්රිය දෙපාර්තමේන්තුව , පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව(කුරුණෑගල) යන ආයතන ද විශේෂයෙන් ස්තුති පූර්වකව සඳහන් කළ යුතුය.

එසේම මෙම නගර සංවර්ධන සැලැස්ම උදෙසා මහජන අදහස් ලබාගැනීම අරමුණු කරගනිමින් පැවැත්වූ පාර්ශවකරුවන්ගේ රැස්වීම සඳහා සහභාගී වෙමින් තම අදහස් හා යෝජනා ඉදිරිපත් කළ සියලුම වගකිව යුතු රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි නිළධාරීන් උදෙසාද වෙළඳ සමිති හා සමාගම් නියෝජනය කරමින් පැමිණි ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු මහජනයාටද වඩාත් සාර්ථක සැලැස්මක් උදෙසා මග පෙන්වීම වෙනුවෙන් ගෞරවණීය ස්තුතිය හිමි විය යුතුය.

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ ඉහළ කළමණාකරන මණ්ඩලය ලෙස ගරු සභාපතිතුමන්, අධ්‍යක්ෂ ජනරාල්තුමා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්තුමා, නියේජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමා (සැලසුම්) සහ සංවර්ධන සැලසුම් අංශය, පර්යේෂණ හා සංවර්ධන ඒකකය, භූගෝලීය තොරතුරු පද්ධති අංශය සහ පාරිසරික හා භූ දර්ශන අංශයටද ඇතුලු සහයෝගය දැක්වූ සියලුම අංශ වෙතද අපගේ ගෞරව පූර්වකව ස්තුතිය හිමිවිය යුතුය. එසේම ප්‍රධාන කාර්යාලයේ සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයටත්, කුරුණෑගල පළාත් කාර්යාලෙය් අධ්‍යක්ෂ තුමා, නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා ඇතුළු සැලසුම් නිලධාරී කණ්ඩායමටත් සෙසු කාර්ය මණ්ඩලයටත් මෙහිදී ස්තුති පූර්වකව ප්‍රණාමය හිමිවේ.

# ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය

වර්ෂ 1978 දී නාගරික ප්‍රදේශවල පොදු සුභ සිද්ධිය උදෙසා වන සංවර්ධන ක්‍රියාදාමයන් ප්‍රවර්ධනය සඳහා ඒකාබද්ධ සැලසුම ක්‍රියාත්මක කිරීමේ හඳුන්වාදීම පෙරදැරිව බිහිවූ නාගරික සංවර්ධන අධිකාරිය සුසැදි, සුරැකි, සොඳුරු නාගරිකරණයක් ළඟාකර ගැනීමේ අරමුණින් තම වගකීම් සහ යුතුකම් සමුදාය ඉටුකරමින් පවතී. එහිදී නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් දිශානතිය උපාය මාර්ගික සැලසුම දිශානතියක් ලෙසට වෙනස් කරමින් කඩිනම් අවශ්‍යතාවය සහිත නාගරික බල ප්‍රදේශය උපදෙසා සංවර්ධන සැලසුම් සකස් කිරීමේ අභිප්‍රාය සාර්ථක කර ගැනීමට සමත්වී ඇත.

නාගරික පද්ධතීන්හි පවතින ගැටළු සඳහා උපාය මාර්ගික ව්‍යාපෘති හරහා සංවර්ධන විභවතාවයන් උත්ප්‍රේරණය කිරීම ඇතුලත්ව සම්පාදනය කරන ලද නාගරික සංවර්ධන සැලසුම් තුළින් මෙරටට සමාජීය, ආර්ථික ප්‍රතිලාභයන් හිමිකර දීමත්, තිරසාර පරිසර සංවර්ධන ඉලක්කයන් මුදුන් පමුණුවා ගැනීමටත් අපේක්ෂා කෙරේ.

ඒ අනුව, 2019 -2030 කාල පරිච්ඡේදය සඳහා සම්පාදනය කළ මහව නගර සංවර්ධන සැලසුම පාරිසරික පද්ධතීන්හි වටිනාකමද එක්කොට ගත් වයඹ පළාතේ ආදර්ශමත් තිරසාර කෘෂිකාර්මික පුරවරය බවට පත් කිරීම ප්‍රමුඛ අභිප්‍රායකොටගෙන ඇත. එමගින් මහව නාගරික ප්‍රදේශ තුළ ජීවත් වන ප්‍රජාව උදෙසා සුසැදි, සුරැකි සොඳුරු නාගරික පරිසරයක් නිර්මාණය වනු ඇත.

මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

# ගරු ප්‍රාදේශීය සභාපතිතුමාගේ පණිවිඩය

දශක හතරක් පුරාවට ශ්‍රී ලංකාවේ නගර සංවර්ධනයේ පුරෝගාමී මෙහෙවර ඉටු කරන නාගරික සංවර්ධන අධිකරිය ප්‍රාදේශීය පරිපාලන ආයතන සමගද ඒකාබද්ධ වෙමින් නිසි භූමි පරිහරණ රටාවකින් යුක්තව සියලු නාගරික අවශ්‍යතා සපුරාලන ජීවත් වීමට හිතකාමී නගර නිර්මාණ උදෙසා පෙළ ගැසී සිටී. මහව නගරය ඇතුලු තවත් ග්‍රාම නිලධාරී වසම් 24ක් 2008 වසරේදී නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් බවට පත් වීමත් සමග එම ප්‍රදේශයේ භෞතික , ආර්ථික, සමාජීය හා පාරිසරික අංශයන්හි ගුණාත්මක හා තුළනාත්මක සංවර්ධනය උදෙසා වඩා වැඩි බරක් එක් වූ අතර ප්‍රදේශීය සභාවද මෙම සංවර්ධන ක්‍රියාදාමය තුළ කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටුකරමින් පොදු මහජන සුභ සිද්ධිය උදෙසා නොපිරිහෙලා තම වගකීම් සමුදාය ඉටුකරන ලදී.

ඒ අනුව, 2019 -2030 කාල සීමාව තෙක් බල පැවැත්වෙන මහව නගර සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරියේ කුරුණෑගල පළාත් කාර්යාලය මගින් සම්පාදනය කර තවදුරටත් නෛතික රාමුවක් යටතේ ප්‍රදේශයේ සංවර්ධන තීව්‍රතාවය යහපත් දිශානතියට පත් කරලීමට කටයුතු කර ඇත. එමගින් අනාගත නේවාසික ප්‍රජාවද මෙන්ම එදිනෙදා තම ජීවන අවශ්‍යතා සහා ප්‍රදේශයට සංසරණය වන ජනතාවටද ඉලක්ක කර ඇති අතර පවතින සංවර්ධන විභවතාවයන් හරහා ආර්ථික , සමාජීය, ප්‍රතිලාභ එක් කරලීමටත් කටයුතු යොදා ඇත.

එපමණක් නොව ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය නගා සිටුවීමත්, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමටත් කටයුතු සලසා ඇත. එහිදී මෙම කලාපයේ සංවර්ධනය උදෙසා මා ඇතුලු මහව ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයින් කැපවී සිටින අතර එම උදාරතර අරමුණු වෙනුවෙන් තම වගකීම් සහ යුතුකම් නොපිරිහෙලා ඉටුකිරීමටද බලාපොරොත්තු වේ.

එච්. පියසේන

සභාපති

මහව ප්‍රාදේශීය සභාව

# පටුන


**සිතියම් ලැයිස්තුව ........................................................ 7**

**වගු ලැයිස්තුව ........................................................ 8**

**රූප ලැයිස්තුව ........................................................ 9**

**පළමු වන පරිච්ඡේදය ........................................................ 10**

**පළමුවන කොටස ........................................................ 1**

**1. හැඳින්වීම ........................................................ 10**

1.1 සංවර්ධන සැලැස්මේ පසුබිම ........................................................ 10

1.2 සැලසුම් කණ්ඩායම ........................................................ 12

1.3 විෂය පථය (Scope of the work) ........................................................ 14

1.4. සැලසුම් ක්‍රියාවලිය (The Planning Process ) ........................................................ 15

**සැලසුම් ක්‍රියාවලිය ........................................................ 16**

**2. මූලික සැලසුම් අධ්‍යයනය ........................................................ 18**

2.1 අධ්‍යයන ප්‍රදේශය - මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ........................................................ 18

2.2 සැලසුම් සංදර්භය හා තත්ව විශ්ලේෂණය ........................................................ 20

2.3 සැලසුම් ප්‍රදේශය නීර්ණය කිරීම ........................................................ 35

**3. සංවර්ධන සැලසුමක අවශ්‍යතාව ........................................................ 38**

**දෙවන කොටස ........................................................ 43**

**4. සැලසුම් පරාසය (Planning frame work ) ........................................................ 45**

4.1 දැක්ම (Vision) ........................................................ 45

4.2 දැක්ම ප්‍රකාශය ........................................................ 45

4.3 අරමුණු ........................................................ 46

4.4 පරමාර්ථ ........................................................ 46

**5. ශක්තීන්, දූර්වලතා, අවස්ථා, තර්ජන විශ්ලේෂණය හා තත්ව විශ්ලේෂණයේ සාරාංශය ........................................................ 48**

**6. සැලැස්ම (The Plan)** ........................................................ Error! Bookmark not defined.

**6.1** සංකල්පීය සැලැස්ම (Concept Plan) ........................................................ 80

6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම ........................................................ 83

6.3 භෞතික හා සමාජයීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය උපාය මාර්ග ........................................................ 84

**6.3.1** සේවා සැලැස්ම ........................................................ 84

**6.3.2** මාර්ග හා ගමනාගමන සැලැස්ම ........................................................ 90

**6.3.3** ජල සම්පාදනය ........................................................ 93

**6.3.4** විදුලි සැපයුම ........................................................ 95

**6.3.5** සන අපද්‍රව්‍ය කළමනාකරණය ....................95
6.4 ආර්ථික සංවර්ධන උපාය මාර්ග .................... 97
**6.4.1** කෘෂි කාර්මික හා ආර්ථික සංවර්ධන උපාය මාර්ග ....................97
**6.4.2** කර්මාන්ත සංවර්ධන සැලැස්ම ....................100
6.5 තිරසර පරිසර උපායමාර්ග .................... 102
**6.5.1** මහව නාගරික බල ප්‍රදේශය තුළ හඳුනාගත හැකි තෙත් බිම් ....................102
**6.5.2** පරිසර හා භූ දර්ශණන්ට අදාල කළමනාකරණ සැලැස්ම ....................104
**6.5.3** ආපදා අවම කිරීමේ සැලැස්ම- 2030....................104
**6.5.4.** මහව නාගරික බල ප්‍රදේශයේ යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ සැලැස්ම 106
6.6 ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික සංවර්ධන සැලැස්ම .................... 111
6.7 ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග (Implementation Strategy).................... 114
6.7.1 යෝජිත ව්‍යාපෘති (Strategic Action Project) ....................114
6.7.2 ආයතනික ව්‍යුහය ....................185
**7. ඇමුණුම් ....................188**

## සිතියම් ලැයිස්තුව


| | | |
|---|---|---|
| සිතියම් අංක | 1.1 | අධ්‍යයන ප්‍රදේශය - මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය |
| සිතියම් අංක | 2.2 | ප්‍රදේශයේ මාර්ග ජාලය |
| සිතියම් අංක | 2.3 | ඉඩම් පරිහරණ සිතියම |
| සිතියම් අංක | 2.4 | ස්වාභාවික පාරිසරික තත්වය පිළිබඳ අධ්‍යයනය |
| සිතියම් අංක | 2.5 | සංවර්ධන සම්පීඩන විශ්ලේෂණ සිතියම |
| සිතියම් අංක | 2.6 | ජීවත් වීමට යොග්‍ය කළාප හඳුනා ගැනීමේ දර්ශකය |
| සිතියම් අංක | 2.7 | සැලසුම් ප්‍රදේශය |
| සිතියම් අංක | 3.1 | ජල සැපයුම නොමැති ප්‍රදේශ |
| සිතියම් අංක | 5.1 | මහව නාගරික බල ප්‍රදේශයේ කෘෂිකාර්මික ඉඩම් පරිහරණය |
| සිතියම අංක | 5.2 | මහව නාගරික බල ප්‍රදේශයේ ජලාශ හා කුඹුරු ඉඩම් |
| සිතියම් අංක | 5.3 | පාංශු සිතියම ශ්‍රී ලංකාව |
| සිතියම් අංක | 5.4 | මහව කලාපයේ වැව් |
| සිතියම් අංක | 5.5 | අලි උවදුරු පවතින ප්‍රදේශ |
| සිතියම් අංක | 5.6 | මාර්ග හා දුම්රිය මාර්ග ජාලය |
| සිතියම් අංක | 5.7 | මහව නගරය තුළ සංවර්ධන සම්පීඩනය |
| සිතියම් අංක | 5.8 | ජල හිඟ පවතින ග්‍රාම නිලධාරී වසම් |
| සිතියම් අංක | 6.2.1 | යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම |
| සිතියම් අංක | 6.3.1 | නිවස සණත්ව සැලැස්ම |
| සිතියම් අංක | 6.3.2 | අධ්‍යාපන සැලැස්ම |
| සිතියම් අංක | 6.3.2.1 | මාර්ග හා ගමනාගමන සැලැස්ම |
| සිතියම් අංක | 6.4.1.1 | කෘෂි කාර්මික හා ආර්ථික සංවර්ධන උපාය මාර්ග |
| සිතියම් අංක | 6.4.2.1 | කර්මාන්ත සංවර්ධන උපාය මාර්ග |
| සිතියම් අංක | 6.5.1. | යෝජිත තෙත් බිම් කළමනාකරණ සැලැස්ම |
| සිතියම් අංක | 6.5.2 | යෝජිත ආපදා අවම කිරීමේ සැලැස්ම |
| සිතියම් අංක | 6.5.3 | විනෝද කටයුතු සඳහා සැලැස්ම |
| සිතියම් අංක | 6.6 | ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික සංවර්ධන සැලැස්ම |


## වගු ලැයිස්තුව


| | | |
|---|---|---|
| වගු අංක | 2.3 | මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල රැකියා නියුක්තිය |
| වගු අංක | 2.4 | මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල රැකියාවන්ගේ ආංශික ව්‍යාප්තිය |
| වගු අංක | 5.1 | කෘෂිකාර්මික ඉඩම් පරිහරණය-මහව |
| වගු අංක | 5.2 | පළතුරු වගාව සඳහා යෙදවී ඇති භූමි ප්‍රමාණ |

වගු අංක 5.3 කෘෂිකාර්මි සංවර්ධනය සඳහා යොදාගත හැකි වෙනත් භූමි ප්‍රමාණයන්
වගු අංක 5.4 සත්ත්ව පාලනය
වගු අංක 5.5 කෘෂිකර්මයේ නිරත පවුල් සංඛ්‍යාව - මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය
වගු අංක 5.6 වන සතුන් මගින් කෘෂිකාර්මික කටයුතු සඳහා එල්ලවන තර්ජන
වගු අංක 5.7 ප්‍රජාමූල ජල ව්‍යාපෘති
වගු අංක 5.8 මාර්ග ස්වභාවය
වගු අංක 6.3.1.1 නිවාස සැලැස්ම
වගු අංක 6.3.1.2 පාසල් පහසුකම්
වගු අංක 6.3.3.1 ජල සැපයුම - 2017
වගු අංක 6.3.3.2 ජල පරිභෝජන අවශ්‍යතාව
වගු අංක 6.5.1 පරිසර හා භූ දර්ශනයන්ට අදාල කළමනාකරණ සැලසුම
වගු අංක 6.5.2 මහව නාගරික බල ප්‍රදේශයේ සෘජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන
වගු අංක 6.5.3 මහව නාගරික බල ප්‍රදේශය සඳහා යෝජිත සෘජු විනෝද කටයුතු සඳහා සැලැස්ම

## රූප ලැයිස්තුව

රූපය 5.1 පාංශු සිතියම ශ්‍රී ලංකාව
රූපය 5.1 ශ්‍රම බලකාය
රූපය 5.2 මොරගහකන්ද වාරිමාර්ග ව්‍යාපෘතිය
රූපය 5.3 කසළ ප්‍රතිචක්‍රීකරණය ව්‍යාපෘතිය
රූපය 5.4 යාපහුව රාජධානිය
රූපය 5.5 ප්‍රදේශයේ පවතින සුන්දර ස්ථාන
රූපය 5.6 ප්‍රදේශයේ පවතින දේශීය ආයුර්වේද ක්‍රමය
රූපය 5.7 ප්‍රදේශයේ පවතින අංගම්පොර සටන් කලාව
රූපය 5.8 ප්‍රකට නොවූ පුරාවිද්‍යාත්මක ස්ථාන පැවතීම
රූපය 5.9 ‘‘පැරඩයිස්’’ හෝටලය
රූපය 5.10 අංගම්පොර ක්‍රීඩා පුහුණු කිරීමේ මධ්‍යස්ථානය.
රූපය 5.11 ප්‍රධාන මාර්ග හා දුම්රිය මාර්ග
රූපය 5.12 දුම්රිය මාර්ග
රූපය 5.13 ප්‍රධාන මාර්ගය මහව නගරයට පිටතින් දළදාගම මංසන්ධියේ පිහිටා තිබීම
රූපය 6.1 සංකල්පීය සැලැස්ම
රූපය 6.2.1. යෝජිත නාගරික ආකෘතිය 1 - හරස් පැතිකඩ - මහව මඩගල්ල මාර්ගය
රූපය 6.2.2. යෝජිත නාගරික ආකෘතිය 2 - හරස් පැතිකඩ - අනුරාධපුර මාර්ගය
රූපය 6.2.3.1 යෝජිත නාගරික ආකෘතිය 3 - නේවාසික කලාපය
රූපය 6.3.3.1 යෝජිත ජල සැපයුම් සිතියම
සිතියම් අංක 6.3.3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

# පළමුවන පරිච්ඡේදය

## පළමුවන කොටස

## 1.හැඳින්වීම

### 1.1 සංවර්ධන සැලැස්මේ පසුබිම

සංවර්ධන සැලැස්මක් යනු යම් ප්‍රදේශයක පවතින භෞතික,සමාජයීය, ආර්ථික හා පාරිසරික සාධක විධිමත් සැලැස්මකට අනුව මෙහෙයවීමේ නීත්‍යානුකූල ලියවිල්ලක් මෙන්ම ප්‍රදේශයේ ඇති සංවර්ධන උපාය මාර්ග මගින් ප්‍රදේශයේ ජන ජීවිතය තිරසාර පැවැත්මක් කරා මෙහෙයවීම සඳහා සකස් කරන ලද නීතිමය රාමුවකි. ඉහත බලතල අනුව සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමේදී නගරයේ භෞතික සංවර්ධනය කරා ළඟාවීම සඳහා ප්‍රමුඛත්වය දෙන ලදී.

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 1982 අංක 04 දරන සංශෝධන පනතේ II (අ) කොටසේ 8(අ) අනුව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ භෞතික වශයෙන් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ බලතල නාගරික සංවර්ධන අධිකාරිය සතුව පවතී.

1981.11.13 වන දින අංක 166/19 ගැසට් නිවේදනය යටතේ, ග්‍රාම නිලධාරී වසම් 10ක් මහව නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. දළදාගම හන්දිය ආශ්‍රිතව සිදුවන වාණිජ සංවර්ධනයත් යාපහුව ඇතුළු පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම හා ඒ වෙත සංචාරක සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් සිදුවන සංවර්ධන කටයුතු දිරිගැන්වීම උදෙසා 2008.02.08 වන දින අංක 1535/14 ගැසට් නිවේදනයට අනුව මහව නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය ග්‍රාම නිලධාරී වසම් 24කට අයත් හෙක්ටයාර් 7441 ක භූමි ප්‍රදේශයක් දක්වා පුළුල් කරන ලදී.

එසේම යෝජිත ප්‍රදේශය සාරවත් කෘෂිකාර්මික ප්‍රදේශයක් වන බැවින්, එම කෘෂිකාර්මික ආර්ථිකය පදනම් කරගනිමින් සංවර්ධනය වන නගරයක් වශයෙන් ද ඓතිහාසික පසුබිම ප්‍රයෝජනයට ගෙන සංචාරක ආකර්ශනය ඇතිවන පරිදි විධිමත් සැලැස්මකට අනුව සංවර්ධනය කළයුතු නගරයක් වශයෙන්ද මහව නගරය හඳුනාගනිමින් සංවර්ධනය කිරීම සඳහා නගර සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය බවට නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගන්නා ලදී.

2017 වසර දක්වා මහව නගරය සඳහා ව්‍යාපෘති වාර්තාවක් පමණක් සකස් කර තිබූ අතර නගර සංවර්ධන සැලැස්මකට අනුව ප්‍රදේශයේ සංවර්ධන කටයුතු විධිමත් කිරීමක් සිදු නොවීය. ඒ අනුව 2017 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා විධිමත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම ආරම්භ කරන ලදී. එමගින් මහව නගරයට 2030 වර්ෂය වන විට අපේක්ෂිත භෞතික, ආර්ථික, පාරිසරික හා සමාජීය සංවර්ධන ඉලක්කය කරා ළඟාවීමට අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් හා මාර්ගෝපදේශන යෝජනා කෙරේ.

## 1.2 සැලසුම් කණ්ඩායම

<u>**පාර්ශවකරුවන්**</u>

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව | - | මහව |

<u>**උපදේශන ආයතන**</u>

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | මහව |
| මාර්ග සංවර්ධන අධිකාරිය | - | මහව |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | - | කුරුණෑගල |
| ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | - | කුරුණෑගල |
| ජල සම්පාදන මණ්ඩලය | - | කුරුණෑගල |
| දුම්රිය දෙපාර්තමේන්තුව | - | අනුරාධපුර |
| ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය | - | මහව |
| මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | - | මහව |
| විදුලිබල මණ්ඩලය | - | කුරුණෑගල |
| වන ජීවි දෙපාර්තමේන්තුව | - | කුරුණෑගල |
| මධ්‍යම පරිසර අධිකාරිය | - | කුරුණෑගල |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | - | කුරුණෑගල |
| ශ්‍රී ලංකා පොලීසිය | - | මහව |
| අධ්‍යාපන දෙපාර්තමේන්තුව | - | මහව |
| පුරා විද්‍යා දෙපාර්තමේන්තුව | - | හෙට්ටිපොල |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - | කුරුණෑගල |
| වෙළඳ සංගමය | - | මහව |

**නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම**

නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ වයඹ පළාත් අධ්‍යක්ෂතුමාගේ මෙහෙයවීම යටතේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය මගින් සැලසුම් කරන ලද මහව නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය සඳහා වන මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී පහත සඳහන් නිළධාරීන්ගෙන් සමන්විත විය.

1. ඩබ්ලිව්.ජේ . සෙනෙවිරත්න මහතා - අධ්‍යක්ෂ(වයඹ)
2. කේ.එම්. සේනාරත්න මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)
3. ඩබ්ලිව්.ඒ.එම්.කේ . චන්ද්‍රසේන මිය - සැලසුම් නිලධාරී (වරලත් නගර නිර්මාණ ශිල්පී හා කණ්ඩායම් නායක)
4. බී.ජී.යූ . දයාංගනී මිය - සැලසුම් නිලධාරී (වරලත් නගර නිර්මාණ ශිල්පී)
5. එම්.බී.ආර්. දමයන්ති මාපා මිය - සැලසුම් නිලධාරී (භූගෝල විද්‍යා විශේෂඥවේදී)
6. පී .පී ඩී . රාජපක්ෂ මිය - සහකාර සැලසුම් නිලධාරී (නගර සැලසුම්කරණය පිළිබඳ උපාධිධාරී)
7. එන්.පී.ඒ. කුමාරිහාමි මිය - සැලසුම් ශිල්පිණී

මෙම සංවර්ධන සැලසුම සකස් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ,

1. සංවර්ධන සැලසුම් අංශය
2. භූගෝලීය හා තොරතුරු පද්ධති අංශය
3. භූ දර්ශන අංශය

සහාය ලබාදෙන ලදී. (ඇමුණුම් අංක 1)

## 1.3 විෂය පථය (Scope of the work)

සංවර්ධන සැලැස්මක් යනු යම් ප්‍රදේශයක පවතින භෞතික, සමාජීය ආර්ථික හා පාරිසරික සාධක විධිමත් සැලැස්මකට අනුව මෙහෙයවීමේ නීත්‍යානුකූල ලියවිල්ලකි. මෙමගින් එම ප්‍රදේශයේ සංවර්ධන විභවතාවයන් උපායමාර්ග මගින් ප්‍රදේශයේ ජන ජීවිතය තිරසාර පැවැත්මක් කරා මෙහෙයවීම සිදුකරනු ලබයි.

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 1982 අංක 04 දරන සංශෝධන පනතේ II (අ) කොටසේ 8 අනුව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයක භෞතික වශයෙන් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ බලතල නාගරික සංවර්ධන අධිකාරිය සතුව පවතී. ඉහත බලතල අනුව මහව නගරය සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමේදී නගරයේ භෞතික සංවර්ධනය කරා ළඟාවීම සඳහා ප්‍රමුඛත්වය දෙන ලදී.

ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයට අයත් වූ මහව නගරය ඇතුලු ග්‍රාම නිලධාරී වසම් 24ක් තුළ පවතින භෞතික සමාජ ආර්ථික හා පාරිසරික අංශ පිළිබඳ අධ්‍යයනය කොට එයට සුදුසු ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් සකස් කිරීම මෙහිදී අරමුණු කරන ලදී. මෙහිදී ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය (2030) ට අනුව මහව නගරයට හිමි විය යුතු ස්ථානය, ජාතික හා ප්‍රාදේශීය වශයෙන් සම්බන්ධතාවය ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින හා යෝජිත සංවර්ධන ව්‍යාපෘති අදාළ කර ගන්නා ලදී.

2030 වර්ෂයේදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද සංවර්ධන සැලැස්මට යටතේ මහව දුම්රිය මංසන්ධියෙන් ආරම්භ වී පුත්තලම දක්වා විහිදෙන නව දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට යෝජිතය. මහව සතිපොල ව්‍යාපෘතිය, බස් නැවතුම්පොල සංවර්ධන ව්‍යාපෘතිය, වයඹ ඇළ සංවර්ධන ව්‍යාපෘතිය සහ දැදුරු ඔය පානීය ජල ව්‍යාපෘතිය මෙම ප්‍රදේශයේ ප්‍රාදේශීය සංවර්ධනය ඔජනංවන ව්‍යාපෘතිය ලෙස දැක්විය හැක.

කෘෂිකාර්මික නගරයක් වශයෙන් සංවර්ධනය කිරීම මහව නගර සංවර්ධන සැලැස්මේ මූලික දැක්ම වේ. කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය, ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ පාරිසරික සංවේදී ස්ථාන සංරක්ෂණය සහ සංචාරක ආකර්ශණය ලබාගැනීම, ප්‍රදේශයේ ගමනා ගමන පහසුකම් විධිමත් කිරීම ,යටිතල පහසුකම් සංවර්ධනය යන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නාගරික ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළයුතු සංවර්ධනය උපාය මාර්ගය සහ යෝජිත ව්‍යාපෘති මෙහිදී හඳුනාගන්නා ලදී. ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක වීම තුළින් වර්ෂ 2030 දී කෘෂි කාර්මික සේවා සපයන නගරයක් වශයෙන් මහව නගරය සංවර්ධනය වනු ඇත. එහිදී, මනා භෞතික සමාජ ආර්ථික හා පාරිසරික තත්වයෙන් පෝෂණය වූ ප්‍රදේශයක් බවට මහව ප්‍රදේශය සංවර්ධනය කිරීමත් එ තුළින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන මට්ටම ඉහල නැංවීම මෙම සංවර්ධන සැලැස්මේ විෂය පථය හා සැසඳේ.

## 1.4. සැලසුම් ක්‍රියාවලිය (The Planning Process )

| | |
|---|---|
| පියවර 01 | මූලික අධ්‍යයනය<br>Background study |
| පියවර 02 | විෂය පථය<br>(Scoping) |
| පියවර 03 | ප්‍රශ්ණ හා සංවර්ධන විභවතා **හඳුනාගැනීම**<br>Problem & Potential definition |
| පියවර 04 | දැක්ම, අරමුණු හා පරමාර්ථ හඳුනාගැනීම<br>.Vision & Goal formulation |
| පියවර 05 | සවිස්තරාත්මක විග්‍රහය |
| පියවර 06 | සංවර්ධන සැලැස්ම හා උපාය මාර්ග හඳුනාගැනීම |
| පියවර 07 | නීති හා රෙගුලාසි සකස් කිරීම |
| පියවර 08 | පලාත් පාලන ආයතනයේ එකඟතාවය |
| පියවර 09 | ලේඛණගත සැලැස්ම නා: සං: අ: සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම හා අනුමැතිය ලබා ගැනීම |
| පියවර 10 | ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම |

## සැලසුම් ක්‍රියාවලිය

### මූලික අධ්‍යයනය

මහව නගරයේ සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මූලික වශයෙන් ප්‍රාථමික , ද්වීතීක, භෞතික සමාජීය, ආර්ථික හා පාරිසරික සේවා අංශය දත්ත විශ්ලේෂණය කරන ලදී .මෙහිදී භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සෞඛ්‍ය, අධ්‍යාපනික කාර්යාල, විදුලිබල නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාල වැනි විවිධ ආයතනයන් මගින් අවශ්‍ය කරන දත්ත ලබා ගනිමින්, නාගරික ප්‍රදේශයේ ඉඩම් භාවිතය, අපරව්‍යුහ පහසුකම් ව්‍යාප්තිය, නිවාස ව්‍යාප්තිය හා ජනගහනය, පුරාවිද්‍යාත්මක ස්ථාන වල පිහිටීම සහ පාරිසරික තත්වය පිළිබඳ සිතියම් ආශ්‍රයෙන් විශ්ලේෂණය කරන ලදී.

### විෂය පථය හඳුනා ගැනීම

මෙහිදී නාගරික ධූරාවලියට අනුව නගරයේ ස්ථානගත වීම ජාතික මට්ටමේ සැලසුම් මගින් මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පිළිබඳ හඳුනාගෙන ඇති අවශ්‍යතාවයන් හා දැනට ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන හා යෝජිත සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය කරන ලදී. (මහව නගර සභා ශාලාවේ 2017.10.30 දින සම්පත් දායකයින් පාර්ශ්වකරුවන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නියෝජිතයන් හා මහජන නියෝජිතයින්ගේ අදහස් ලබාගැනීමේ රැස්වීම පවත්වන ලදී.)

### ප්‍රශ්ණ හා සංවර්ධන විභවතා හඳුනාගැනීම

මෙහිදී නගරය තුළ පවතින එක් එක් ආයතනයන් නගරයේ ඇති සංවර්ධන විභවතාවයන් වැඩි දියුණු කිරීම සඳහා දායක වී ඇති ආකාරය ද පැන නැගී ඇති ගැටළුකාරී තත්වයක් හා ඒවා මගහරවා ගත හැකි ආකාරය පිළිබඳව සම්පත් දායකයින්, පාර්ශවකරුවන්, රාජ්‍ය හා පෞද්ගලික අංශයන් හා සමිති සමාගම් හා එක් එක් අංශයන්හි පාර්ශවකරුවන් නගරය දියුණු කිරීමේ ඇති හැකියාව පිළිබඳ දක්වන අදහස් සැලකිල්ලට ගනිමින් ඒවා විශ්ලේෂණය කිරීම මගින් නගරය තුළ පවතින සංවර්ධන විභවතාවයන් හා ගැටළුකාරී තත්ත්වයන් හඳුනා ගැණුනි.

### දැක්ම, අරමුණු හා පරමාර්ථ හඳුනාගැනීම.

මෙහිදී ප්‍රදේශය තුළ පවතින සංවර්ධන විභවතාවයන්ගෙන් මනා ලෙස ප්‍රයෝජන ගැනීමටත්, ප්‍රදේශය තුළ ඇති ගැටළුකාරී තත්ත්වයන් මගහරවා ගනිමින් පාරිසරික, ආර්ථික, සාමාජයීය හා භෞතික වන අංශයන්ගේ සමබර සංවර්ධනය තුළින් නගරය දියුණුව කරා රැගෙන යාම සඳහා අවශ්‍ය දැක්ම, අරමුණු හා පරමාර්ථ සකස් කරනු ලැබීය.

**සවිස්තරාත්මක විශ්ලේෂණය**

මෙහිදී ප්‍රදේශය සඳහා සැලසුම් කරව ලද දැක්ම ළඟා කර ගැනීම සඳහා අරමුණු සකස් කර ගැනීමෙන් අනතුරුව, එම අරමුණු ඉටු කර ගැනීම සඳහා තිබෙන ශක්තීන්, දුර්වලතා අවස්ථා සහ තර්ජන SWOT විශ්ලේෂණය කරන ලදී.

**සංවර්ධන සැලැස්ම හා උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම**

මෙහිදී අරමුණු ළඟා කර ගැනීම සඳහා භෞතික, පාරිසරික, ආර්ථික, සාමාජයීය යන ආකාරයට යෝජිත භූමි පරිහරණ සැලැස්ම, යෝජිත කලාපීයකරණ සැලැස්ම, යෝජිත මාර්ග සහ ප්‍රවාහන සැලැස්ම, කෘෂි ආර්ථික සංවර්ධන සැලසුම් සකස් කරන ලදී.

**නීති රෙගුලාසි සකස් කිරීම.**

සංවර්ධන සැලැස්ම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධ නීති හා රෙගුලාසි, ඉඩම් පරිහරණයන් සම්බන්ධයෙන් වන නීති හා රෙගුලාසි ද සංවර්ධන සැලස්මේ දැක්ම කරා ළඟා වීම සඳහා දැනට හඳුනාගත් ගැටළු හා ඉදිරියේදී උද්ගත වේ යැයි විශ්ලේෂණය මගින් අපේක්ෂා කරනු ලබන ගැටළු ද අවම කරගැනීම සඳහා නීත්‍යානුකූල රාමුවක් ඇති කිරීමට මෙහිදී කටයුතු කරන ලදී.

**පලාත් පාලන ආයතනයේ එකඟතාවය**

සංවර්ධන සැලැස්ම සකස් කිරීමෙන් පසු එම සැලැස්මට අනුගත වන මහව ප්‍රාදේශීය සභාවේ අදහස්, යෝජනා හා එකඟතාවය ලබා ගැනීම සඳහා යොමු කිරීම මෙහිදී අපේක්ෂා කරන ලදී. (මහව නගර සභා ශාලාවේ 2018.05.17 දින සම්පත් දායකයින් පාර්ශ්වකරුවන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නියෝජිතයන් හා මහජන නියෝජිතයින්ගේ එකඟතාවය මහව නගර සංවර්ධන සැලස්ම සඳහා ලබාගන්නා ලදී.)

**ලේඛණගත සැලැස්ම නා: ස: අ: සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම හා අනුමැතිය ලබා ගැනීම**

ලේඛණගත කරන සංවර්ධන සැලැස්ම තවදුරටත් නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා යෝජනා ලබා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කර අනුමත කිරීම සහ ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීම.

**ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම**

සංශෝධිත සැලැස්මේ කෙටුම්පත නීත්‍යානුකූල සැලැස්මක් බවට ප්‍රකාශයට පත් කිරීම.

# 2. මූලික සැලසුම් අධ්‍යයනය

## 2.1 අධ්‍යයන ප්‍රදේශය - මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල කුරුණෑගල නගරයේ සිට කිලෝමීටර් 50ක් දුරින්ද අනුරාධපුර නගරයේ සිට කිලෝ මීටර් 55ක් දුරින්ද මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පිහිටා ඇත.

මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අඹන්පොල සහ මහව යන ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ වලින් හා ග්‍රාම නිලධාරී කොට්ඨාශ 96 සමන්විත වන අතර එහි මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 410කි.මහව නගරය එම බල ප්‍රදේශයේ ප්‍රධාන නගරය වේ. කුරුණෑගල සිට අනුරාධපුර දක්වා දිවෙන පාදෙණිය - අනුරාධපුර ප්‍රධාන මාර්ගය හා නිකවැරටිය සිට මඩගල්ල දක්වා දිවෙන මාර්ගයද මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හරහා ගමන් කරයි. එසේම, කොළඹ සිට යාපනය දක්වා දිවෙන ප්‍රධාන දුම්රිය මාර්ගය සහ මහව සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව දක්වා දිවෙන නැගෙනහිර දුම්රිය මාර්ගයද මහව නගරය හරහා ගමන් කරන හෙයින් මහව නගරය දුම්රිය මංසන්ධි නගරයක් වශයෙන් සුවිශේෂි වේ.

***සිතියම් අංක 2.1 අධ්‍යයන ප්‍රදේශය - මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය***



## 2.2 සැලසුම් සංදර්භය හා තත්ව විශ්ලේෂණය

මුහුදු මට්ටමේ සිට උසින් අඩි 300ක් පමණ වූ ගොඩබිමේ සිට උසින් අඩි 400ක් පමණ ඉක්මවා පිහිටි පාෂාණ උද්ගතය කේන්ද්‍ර කර බිහිවූ යාපහුව රාජධානිය මහව ප්‍රදේශයේ ඓතිහාසික හා පුරා විද්‍යාත්මක පසුබිම විදහා දක්වන ප්‍රධාන සාධකයයි. පුරා විද්‍යාත්මක සාධක අනුව යාපහුව රාජධානිය පිළිබඳ මුල් වරට හෙලිවූයේ 13වන සියවස හා බැඳි වංශ කථාවලට අනුවය. ඊට අමතරව යාපහුව ප්‍රදේශය පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන භූමි සංකීර්ණයක් යාපහුවට ආසන්න පින්වැව ගල් සොහොන් කොත් කනත්ත නමින් පිහිටා තිබීම තුළින් මෙම ප්‍රදේශය පූර්ව ඓතිහාසික යුගයේදීත් ජනාවාස පිහිටි කලාපයක් වූ බව තහවුරු කිරීමට සාක්ෂි වේ. විශාල ප්‍රමාණයේ ගල් භාවිතා කරමින් සෙහොන් කොත් සැකසීම මෙම යුගයේ විශේෂ ලක්ෂණයකි.

13 වන සියවස යාපහුව රාජධානිය බිහිවීමට පෙර අනුරාධපුර යුගයේදී බෞද්ධ ආරාම සංකීර්ණයක් පිහිටුවා තිබූ බවට සාධක රාශියක් යාපහුව තුල පිහිටා ඇත. ගල් කටාරම් ක්‍රි.පූ. යුගයට අයත් ලෙන් ලිපි හා අනුරාධපුර යුගයට අයත් බුද්ධ ප්‍රතිමා හා මුරගල පිහිටා තිබීම එහිලා සාධක වේ. මහා වංශයේ සඳහන් වන පරිදි යාපුහව පිළිබඳ ඓතිහාසික ප්‍රවෘත්තිය හමුවන්නේ ක්‍රි.ව. 1214 කාලයේදී ය. එනම් සුභ නම් සෙනෙවියෙකු යාපහුව අරක්ෂිත ස්ථානයක් ලෙස යොදා ගනිමින් කාලිංග මාඝ ආක්‍රමණයට විරුද්ධව කටයුතු මෙහෙයවූ බවයි. ඉන් අනතුරුව 4වන විජයබාහු ක්‍රි.ව. 1270- 1272) චන්ද්‍රබාහු නම් ආක්‍රමනිකයා පරදවා යාපහුව සංවර්ධනයට සිය සොහොයුරු බුවනෙකබාහු රැඳවීය. යාපහුවේ සවර්ණමය යුගය බුවනෙකබාහු රජ සමය (ක්‍රි.ව 1284) වන අතර වංශ කථාවේ සඳහන් වන පරිදි සෞභාග්‍යයෙන් බබලන අතිශයින් විස්තීර්ණ වූ රාජ්‍යයක් මේ සමයේ වූ අතර ශ්‍රී දන්ත ධාතුන් වහන්සේගේ ආරක්ෂිත ස්ථානය වූයේද යාපහුවයි. අතීත විදෙස් සබඳතා පිළිබඳව යාපහුව වැදගත් වන අතර චීනය සමග පැවති සබඳතා මේ අතරින් විශේෂිත වන්නේ පුරා විද්‍යා කැණීම් වලින් ලැබී ඇති චීන කාසි හා චීනයේ නිශ්පාදිත මැටි බඳුන් මේ පිළිබඳව සාක්ෂි සපයයි. ඒ අනුව යාපහුව ශ්‍රී ලංකාවේ සුවිශේෂි බලකොටු රාජධානියක් බවට පත්ව තිබූ බවට යාපහුව රාජධානිය ආසන්යේ පිහිටා තිබෙන කෞතුකාගාර නටඹුන් මගින් තහවුරු වේ.

යාපහුව රාජධානිය හා බැඳී ඓතිහාසික ජනාවාසකරණයට අමතරව මහව නාගරික කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය වීම ආරම්භ වනුයේ 1093.11.01 දින මහව දුම්රිය ස්ථානය පිහිටුවීමත් සමගය. එහිදී මහව ප්‍රදේශය හරහා අනුරාධපුරය දක්වා දිවෙන දුම්රිය මාර්ගය හා මහව දුම්රිය ස්ථානය ආරම්භ වීම මෙහිදී ප්‍රධාන වේ. ඉන් අනතුරුව 1920 දී නැවතත් මහව දුම්රිය ස්ථානය ත්‍රිකුණාමලය දක්වා දිවෙන දුම්රිය මංසන්ධියක් බවට දියුණු වීම මත මහව නගරයක් වශයෙන් සංවර්ධනය වීම ආරම්භ වන්නේ මෙම වකවානුව වන විට ප්‍රධාන ප්‍රවාහන මාධ්‍ය දුම්රිය මාර්ග පද්ධතිය වීම හේතුවෙනි. 1955 වර්ෂය වන විට නැවතත් ත්‍රිකුණාමලය දුම්රිය මාර්ගය සංවර්ධනය කළ අතර මහව දුම්රිය මංසන්ධිය තවදුරටත් සංවර්ධනය විය.

එසේම යාපහුව රාජධානිය මහව නාගරික ප්‍රදේශය තුල පිහිටා තිබීම හේතු කොටගෙන මහව නගරයේ ඓතිහාසික වැදගත්කම වැඩි කිරීමට හේතුවී ඇති අතර එය දේශීය සහ විදේශීය සංචාරකයින්ගේ ආකර්ශනයට හේතු වී ඇත.

වර්ෂ 2030 දක්වා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වයඹ පළාත සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම අනුව මහව ප්‍රදේශය ග්‍රාමීය ජනාවාස කලාපයක් ලෙස හඳුනාගෙන ඇති අතර, නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික ධූරාවලිය අනුව මහව නගරය තෙවැනි ගණයේ (Third Order) නගරයක් වන අතර කලාපයේ පිහිටි වාරියපොල, ගල්ගමුව වැනි නගර හා සමාන මට්ටමේ නගරයකි.

ප්‍රාදේශීය වශයෙන් වැදගත් ව්‍යාපෘතීන් වන බස් නැවතුම්පොල ව්‍යාපෘතිය, මහව සතිපොල සංවර්ධනය ව්‍යාපෘතිය මේ වන විට නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී. මීට අමරතව කලාපීය වශයෙන් වැදගත් වන වයඹ ඇල සංවර්ධන ව්‍යාපෘතිය, දැදුරු ඔය පානීය ජල ව්‍යාපෘතියද මෙම ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. ඊට අමතරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සකස් කරන ලද වර්ෂ 2030 දක්වා වූ සංවර්ධන සැලැස්මට අනුව මහව නගරයෙන් ආරම්භ වී පුත්තලම දක්වා විහිදෙන නව දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට යෝජනා කර ඇත.

වියළි කලාපයේ පිහිටි ප්‍රදේශයක් වන මෙම ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතනය මි.මී.700 ක් වන අතර සාමාන්‍යයෙන් ඔක්තෝබර් නොවැම්බර් මාසවලදී මි.මී. 1400ක පමණ වර්ෂාපතනයක් ලැබේ. වාර්ෂික උෂ්ණත්වය සාමාන්‍යයෙන් සෙන්ටිග්‍රේඩ් අංශක 28($^0$C)ක් වන අතර අගෝස්තු, සැප්තැම්බර් මාසවලදී එය සෙන්ටිග්‍රේඩ් අංශක 30($^0$C) වේ. ප්‍රදේශයේ භූගෝලීය පසුබිම සලකා බැලීමේදී බොහෝ දුරට සමතලා භූමියක් පවතින අතර රතු කහ පොඩ්සොලික් පසෙන් යුක්ත වේ. එය වී වගාව මෙන්ම පොල්, එළවළු හා පලතුරු වගාව ඇතුළු කෘෂිකාර්මික වගාවන් සඳහා වඩාත් යෝග්‍ය වේ.

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනගහනය වර්ෂ 2016 දී 85,304 කි. එය කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් (1,618,465) 4.9%ක් වන අතර ජනගහන වර්ධන වේගය 0.9වේ. මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වැඩිම ජන ඝනත්වයක් ඇති ප්‍රදේශ ලෙස මහව නගරයට ආසන්න ප්‍රදේශ, දළදාගම මංසන්ධිය සහ උපන නගරයක් වශයෙන් පවත්නා අඹන්පොල නගරය ආශ්‍රිතව ව්‍යාප්ත වී ඇත. එම ප්‍රදේශ තුල ජනගහන ඝනත්වය හෙක්ටයාර් එකකට පුද්ගලයින් 16ක් වැඩි වේ. (ඇමුණුම් අංක 3)

ප්‍රදේශයේ මුළු ජන සංඛ්‍යාවෙන් 43,505ක් (51%) ස්ත්‍රී ජනගහනය වන අතර 41,798ක් එනම් 49%ක් පුරුෂ ජනගහනය නියෝජනය කරයි. වයස් කාණ්ඩ අනුව ජනගහනය සලකා බැලීමේදී අවුරුදු 05 අඩු ජනගහනය මුළු ජනගහනයෙන් 10%ක් වන අතර පාසල් යන වයසේ ජනගහනය 20%කි. එසේම, අවුරුදු 18-60 අතර ශ්‍රම බලකායට අයත් ජනගහනය 58%ක් වන අතර අවුරුදු 60 වැඩි ජනගහනය 12%කි.

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජාතීන් අනුව ජනගහනය සලකා බැලීමේදී 94%ක් සිංහල ජාතීන් වන අතර මුස්ලිම් ජනගහනය 5%ක් වේ. දෙමළ ජනගහනය 1%කි. (ඇමුණුම් අංක 3)

මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුළු නිවාස ප්‍රමාණය 18,956 (2016) ක් වන අතර නිවාස ඝනත්වය හෙක්ටයාර් 01ක් සඳහා නිවාස එකකි. නිවාස ඝනත්වය නගරයට ආසන්න ප්‍රදේශ සහ අඹන්පොල උප නාගරික මධ්‍යස්ථානය ආශ්‍රිත වැනි ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇත. (ඇමුණුම් අංක 4)

මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කෘෂි අංශය පිළිබඳව අවධානය යොමු කිරීමේදී කැපී පෙනෙ ලක්ෂණයක් වනුයේ කලාපය පුරා කුඩා වැව් සහ ඒ ආශ්‍රිත කුඹුරු ව්‍යාප්තවී පැවතිමයි. වැසි ජලය මගින් පෝෂණය වන වැව් ප්‍රමාණය 811ක් ද 314ක්ද වන අතර අමුණු 22 ක් වේ. ඒ මගින් වගාකරනු ලබන කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 7185කි . එමෙන්ම මහා පරිමාණ වාරි කර්මාන්ත 2ක් පවතින අතර ඒ යටතේ වගා කරනු ලබන කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 2076.97ක් වන අතර මුළු ගොවි පවුල් සංඛ්‍යාව 2,283 ක් වේ. මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වාර්ෂික වී නිශ්පාදනය මෙ.ටො.1375ක අගයක් වේ.

මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වී වගාවට අමතරව පොල් එළවළු පලතුරු ධාන්‍ය වගාව බහුල වශයෙන් ව්‍යාප්ත වී ඇත. මුළු භූමියෙන් පොල් වගාව සඳහා 5% (හෙක්. 1240) ක්ද එළවළු වගාව සඳහා 8%ක (හෙක්ටයාර් 332.66) ක්ද ධාන්‍ය වගාව සඳහා 4% (හෙක්. 1608)ක්ද පලතුරු වගාව සඳහා 4% (හෙක්.2805ක්) වශයෙන් භූමි ප්‍රමාණයක් වෙන්වී ඇත.

වී වගාව සඳහා ප්‍රමාණවත් ජල සැපයුමක් නොමැති නිසා කුඹුරු ගොවිතැන අඩාල වුවද අතිරේක බෝග වගාව සඳහා ගොවීන්ගේ නැඹුරු වීම සතුටුදායක මෙන්ම පොල් වගාව ව්‍යාප්ත වීම ප්‍රධාන මුළු භූමි ප්‍රමාණයෙන් 5% ක් වන අතර කෙසෙල්, අඹ, කජු, ගස්ලබු ආදි පලතුරු හෙක්ටායර් 285ක පමණ වගාකර ඇත. තවද, මීට අමතරව රටකජු, මුං, කව්පි, ආදි රනිල බෝග මෙම කලාපයේ සාර්ථකව වගා කරනු ලබයි. (ඇමුණුම් අංක 05)

එසේ වුවද, කලාපයේ කෘෂි නිශ්පාදන අලෙවි කිරීම සඳහා සාර්ථක වෙළඳපොලක් නොමැතිකම, වගා කටයුතු සඳහා වන සතුන්ගෙන් හානි සිදුවීම, කාලීනව ඇතිවන නියඟ තත්වය හා ජල හිඟය කෘෂිකාර්මික අංශයට බලපාන ප්‍රධාන ගැටලු ලෙස හඳුනාගත හැක. කාලගුණික ගැටලු හා වන සත්ව උවදුර නිසා කෘෂිකාර්මික කටයුතු වලට අමතරව සත්ත්ව පාලන කටයුතු සඳහා යොමුවීමේ ප්‍රවනාතාවක් පවතී. ඒ අතරින් කිරි නිශ්පාදන මස්, බිත්තර, ආශ්‍රිත සත්ත්ව නිශ්පාදන කර්මාන්ත ප්‍රධාන වේ. . එමෙන්ම සත්ව පාලන කටයුතුද ව්‍යාප්තව පවතින අතර කුකුලන්, එළ ගවයින් ප්‍රධාන වේ. සත්ව පාලන සිදුකරන ගොවිපොලවල් 3547 ක් පමණ ව්‍යාප්ත වී පවතී.

සත්ව පාලන අංශයේ මූලික ගැටළු ලෙස වියලි කාලවලදී තෘණ වගාව විනාශ වීම, අභිජනන ද්‍රව්‍ය හිඟකම,තෘණ වගා කිරීමට උචිත ඉඩම් හිඟකම, සතත්ව පාලන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් අඩුකම ගැටලු ලෙස හඳුනාගත හැක. (ඇමුණුම් අංක 05)

මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල රැකියා නියුක්තිය පිළිබඳ සැලකීමේදී එය 59%කි.

*වගු අංක 2.1 මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල රැකියා නියුක්තිය*




මූලාශ්‍රය :- සම්පත් පැතිකඩ

රැකියාවන්ගේ ආංශික ව්‍යාප්තිය පිළිබඳව සැලකීමේදී කෘෂි අංශය සඳහා සේවා නියුක්තිය 40%ක් අගයක් ගන්නා අතර එය ප්‍රදේශයේ කෘෂි කර්මාන්තය බහුලව ව්‍යාප්ත වීම නිසා සිදුවී ඇත. අනෙකුත් අංශයන් සැලකීමේදී රාජ්‍ය අංශයේ 17% ක්ද පෞද්ගලික අංශයේ 15% ක් ස්වයං රැකියා 12% ක් හා අනෙකුත් සුළු රැකියා සඳහා 11%ක ප්‍රමාණයන් දායකත්වය ලබාදෙයි. එමෙන්ම විදේශ රැකියා සඳහා දායක වන ප්‍රමාණය 5%ක අගයක් ගනී.

*වගු අංක 2.2 මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල රැකියාවන්ගේ ආංශික ව්‍යාප්තිය*




මූලාශ්‍රය: - සම්පත් පැතිකඩ

ප්‍රදේශයේ කර්මාන්ත ව්‍යාප්ත වීම සම්බන්ධයෙන් සැලකීමේදී ඇඟළුම් කර්මාන්ත ශාලා ව්‍යාප්ත වී ඇති අතර කුඩා පරිමාණයේ කර්මාන්ත ශාලා 1160ක් පමණ ඇත. ඉන් 40%ක් පමණ කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත වේ එමෙන්ම කෘෂි සේවා හා නිශ්පාදන හා අමුද්‍රව්‍ය සපයන පෞද්ගලික ආයතනයක් වශයෙන් සීඅයිසී "CIC " කර්මාන්ත ශාලාවක්ද ප්‍රදේශයේ ස්ථානගත වී ඇත.

ප්‍රදේශයේ කෘෂිකාර්මික සංවර්ධනයට යොදාගත හැකි ඉඩම් සුලබව පැවතීමත් ඒ ආශ්‍රිත නිශ්පාදන බහුල වීමත්, හේතුවෙන් කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීමේ හැකියාව මෙම කලාපය තුල පවතී.

මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මාර්ග ව්‍යාප්තිය පිළිබඳ සැලකීමේදී කුරුණෑගල - අනුරාධපුරය මාර්ගය, නිකවැරටිය - මඩගල්ල මාර්ගය, මහව - නාගොල්ලාගම මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරියට අයත් A ශ්‍රේණියේ මාර්ග මගින් මහව නගරය අනෙකුත් ප්‍රධාන නගර සමග සම්බන්ධ වන අතර අනෙකුත් මාර්ග හරහා ප්‍රාදේශීය හා කලාපීය සම්බන්ධතාවය වැඩිදියුණු කරයි. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය මගින් නඩත්තු කරන Aශ්‍රේණියේ මාර්ග කි.මී. 272 ක්ද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග දිගින් කි.මී. 223 දිගින් යුතුව ව්‍යාප්ත වී ඇත. එසේම ප්‍රාදේශීය සභාව යටතේ නඩත්තු කරනු ලබන දිගින් කි.මී. 978ක් පමණ මාර්ග පද්ධතියක් ප්‍රදේශය පුරා ව්‍යාප්ත වී ඇත. (ඇමුණුම් අංක 06)

අධ්‍යයන ප්‍රදේශයේ මාර්ග ජාලය ආශ්‍රයෙන් සිදුකරන ලද මාර්ග සම්බන්ධතා විශ්ලේෂණය මගින් තහවුරු වන්නේ, ප්‍රදේශයේ වැඩි මාර්ග ප්‍රමාණයක් ඒකාබද්ධ සම්බන්ධතාවයක් පවතින්නේ දළදාගම හන්දිය

කේන්ද්‍ර කොටගෙනය. මාර්ග පද්ධතියේ සම්බන්ධතාව දෙවන තැන හිමි වන්නේ මහව නාගරික කේන්ද්‍රය හා අඹන්පොල හන්දිය කේන්ද්‍ර කොටගෙනය.

***සිතියම් අංක 2.2 ප්‍රදේශයේ මාර්ග ජාලය***



මහව නාගරික ප්‍රදේශයේ පානීය ජල අවශතාවයෙන් 56%ක් පමණ ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් සපුරන අතර ඉතිරි 44% ප්‍රමාණය භූගත ළිං, වැව්, ඇළ මාර්ග මගින් සපයා ගනී. මහව නගරය තුල ජල සම්පාදනය කිරීම සඳහා ප්‍රධාන ජලමූලාශ්‍රයක් නොමැති අතර නිකවැරටිය නගරයේ මාගල්ල වැව මගින් මහව නගරයට ජල සම්පාදනය සිදුකරනු ලබයි. (ඇමුණුම් අංක 06)

මහව නගරයේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා දැදුරු ඔය ජලාශය සම්බන්ධ කර ගනිමින් ජල සැපයුම් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර මහව නාගරික සංවර්ධණ අධිකාරි බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 24ක් ආවරණය කිරීමට යෝජිතව ඇත. ඒ අනුව ජලය ඝන මීටර් 1,000ක ජල ගබඩා කිරීමේ කුළුනක් ඉදිකර පානීය ජලය අවශතාවය සපුරාලීම අරමුණු වී ඇත. වර්ෂ 2020 දී මෙම ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව කලාපයේ පවත්නාජල හිඟයට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමත් සමග විසඳුම් ලැබෙනු ඇත.

මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ලංකා විදුලි බල මණ්ඩලය මගින් විදුලි බල සැපයුම සිදුකරනු ලබයි. අනාගත විදුලි බල සැපයුම් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් පහසුකම් දැනට ලංකා විදුලි බල මණ්ඩලය සතුව පවතින අතර ඉල්ලුම් කර සතියක් තුල නව විදුලි සම්බන්ධතා ලබාදීම සිදු කෙරේ.

මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නගර මධ්‍යයේ සංවර්ධිත ප්‍රදේශය තුල පමණක් කසල එකතු කරනු ලබන අතර බැහැර කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීම සියෝදාගම පිහිටි අක්කර 02ක පමණ භූමි ප්‍රදේශයක පැතිරී පවතින කසළ ප්‍රතිචක්‍රීකරණය ව්‍යාපෘතිය මගින් සිදුකරනු ලබයි.

මේ සම්බන්ධයෙන් පවතින ගැටළු ලෙස නාගරික ප්‍රදේශයෙන් බැහැරව කසල එක් රැස් නොකිරීම සහ ඒ සඳහා අවශ්‍ය මිනිස් ශ්‍රමය නොමැති වීම ආදිය හඳුනාගත හැක.

මහව නගරයේ භූමි පරිහරණය අනුව ක්‍රීඩා සහ විනෝද කටයුතු සඳහා හෙක්ටයාර් 6.8ක පමණ භූමි ප්‍රමාණයක් වෙන්වී ඇති අතර, එය මුළු භූමි ප්‍රමාණයෙන් 0.1%ක් පමණ වේ. නගරයේ ජනගහනයට අනුව (පුද්ගලයින් 1000කට හෙක්ටයාර් 1 ක් ලෙස සම්මතයට අනුව තිබිය යුතු මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 23කි.) එසේ වුවද වර්තමානයේ පවතින්නේ හෙක්ටයාර් 6.8කි. කලාපයේ පවත්නා භූමි පරිහරණ රටාව අනුව සම්මත ප්‍රමාණයට අනුව අවශ්‍යතාවය සම්පූර්ණ නොවුවද තවදුරටත් විවේක හා විනෝද පහසුකම් සඳහා ඉඩකඩ වෙන්කිරීමේ අවශ්‍යතාවය පවතී. (ඇමුණුම් අංක 05)

මහව ප්‍රදේශයේ සෞඛ්‍ය පහසුකම් සැපයීම සම්බන්ධයෙන් මහව දිසා රෝහල මගින් මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබයි. තවද මධ්‍යම බෙහෙත් ශාලාවක්, ආයුර්වේද බෙහෙත් ශාලාවක් මෙන්ම දිසා රෝහල මගින් ක්‍රියාත්මක වෛද්‍ය සායනය මගින් ප්‍රදේශයේ සෞඛ්‍ය සේවා සැපයීම සිදුකරයි. විශේෂයෙන්ම මහව

ප්‍රදේශය තුල රෝග ප්‍රතිකාර ලබා ගැනීමට පවතිනුයේ එක් දිසා රෝහලක් බැවින් ජනතාව නිකවැරටිය, ගල්ගමුව ,කුරුණෑගල රෝහල් වෙත සේවා ලබාගැනීම සඳහා යොමු වීමක් දක්නට ලැබේ.

එමෙන්ම ප්‍රදේශයේ  රෝග වැලැක්වීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය මගින් අවශ්‍ය රෝග නිවාරන, පවුල් සෞඛ්‍ය සේවා හා සෞඛ්‍යාරක්ෂිත වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ප්‍රදේශයට පවත්නා දිසා රෝහල ඉතාමත් අඩු පහසුකම් සහිතව ක්‍රියාත්මක වේ.  එසේම කලාපය සඳහා ආයුර්වේද රෝහලක අවශ්‍යතාවයක්ද පවතී.

මහව නගර සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය තුල අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තිය පිළිබඳව සැලකීමේදී රජයේ පාසල් 09ක්ද පිරිවෙන් 02ක්ද වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන (සුළු පරිමාන) 01ක් ද පවතී. (ඇමුණුම් අංක 06)

රජයේ පාසල් වල ගුරු  සිසු අනුපාතය පිළිබඳ සැලකීමේදී 1:20 වේ.  පොදුවේ ගත්කල මහව විජයබා ජාතික පාසල, යූ.බී. වන්නිනායක මධ්‍ය මහා විද්‍යාලය හැරුණු විට අනෙකුත් පාසල්  ඉතාමත් අඩු  පහසුකම් සහිතව ක්‍රියාත්මක වේ.

මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉඩම් මිල පිළිබඳව අධ්‍යයනයේදී මහව නගර මධ්‍යය සහ දළදාගම මංසන්ධිය, අඹන්පොල නගරය ආශ්‍රිත ප්‍රදේශ වල ඉඩම් පර්චස් එකක් ලක්ෂ 10 කට  වඩා වැඩි අගයක් ගනී.

නගරයෙන් බාහිර ප්‍රදේශ වල  ඉඩම් පර්චසයක් රු. 50,000ක  අගයක් ගන්නා අතර අවම යටිතල පහසුකම් නගරයේ අභ්‍යන්තර ප්‍රදේශ වලට ව්‍යාප්ත වීම මෙසේ වීමට හේතු වී ඇත. (ඇමුණුම් අංක 09)

මහව නාගරික ප්‍රදේශය ඉඩම් භාවිතය පිළිබඳව අධ්‍යයනයේදී පහත සඳහන් සුවිශේෂී අංග දක්නට ලැබේ. මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 7441.8 ක් වන අතර  ඉන් 42%ක් කෘෂිකාර්මික ඉඩම් වේ.  එසේම 23%ක භූමි ප්‍රමාණයක් ගෙවතු සඳහාද 9.5%ක් ප්‍රමාණයක් ජල රැඳවුම් ප්‍රදේශ ලෙසද 8%ක් ප්‍රමාණයක් ලඳු කැලෑ වශයෙන්ද 6%ක් ප්‍රමාණයක් නේවාසික කටයුතු සඳහාද වෙන්වී ඇත.  වාණිජ භාවිතයන් ඇත්තේ  1.5% පමණ ප්‍රමාණයකි.  ඒ අනුව නාගරික ප්‍රදේශයේ  වැඩිම ඉඩම් භාවිතයක් කෘෂිකාර්මික කටයුතු සඳහා වෙන්වී ඇති බව තහවුරු වේ.  මහව නාගරික ප්‍රදේශයේ තෙත් බිම් කලාප වශයෙන් වැව්, කුඹුරු සහ තෙත් බිම් වශයෙන් ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ පිළිබඳව අධ්‍යයනයට ලක් කෙරේ.  මෙම ප්‍රදේශයේ අනෙකුත් ප්‍රදේශ වලට සාපේක්ෂව කැපී පෙනෙන අංගයක් වනුයේ ප්‍රදේශය පුරා කුඩා සහ මධ්‍යම පරිමාණ වැව් රාශියක් ව්‍යාප්තව පැවතීමයි.  එම වැව් ආශ්‍රිත වැව් වලින් පෝෂණය වන කුඹුරු පවතී.

නාගරික ප්‍රදේශය පුරා ව්‍යාප්තව වී පවතින කුඩා වැව් සඳහා වෙන්වී ඇති භූමි ප්‍රමාණය හෙක්ටයාර් 701.262කි. එනම් මුළු භූමියෙන් 9.24%ක් මෙම සියළුම වැව් සඳහා වාරිමාර්ග ක්‍රමයක් නොමැති අතර වර්ෂා

ජලය පමණක් වගා කටයුතු කරනු ලබයි. මේ නිසා වසරේ වැඩි කාලයක් එම වැව් වලින් වැඩි භූමි ප්‍රමාණයක් විවෘත ඉඩකඩ වශයෙන් පවතී.

කුඹුරු සඳහා වෙන්වී ඇති භූමිය හෙක්ටයාර් 2000.95ක් වේ. එනම් මුළු භූමියෙන් 26.40%කි. මෙම භූමියද කාලීන ඇතිවන නියඟය හේතුවෙන් කටු පඳුරු වශයෙන් පවත්නා අවස්ථා නිරීක්ෂණය වේ. මඩ වගුරු වශයෙන් හෙක්. 0.40535 භූමි ප්‍රමාණයෙන් පවතින අතර එය මුළු භූමියෙන් 0.01%ක ප්‍රතිශතයකි.

නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුල සංරක්ෂිත ප්‍රදේශ ලෙස විලව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වන රක්ෂිත සහ වැලියාය ප්‍රදේශයේ පවතින වන රක්ෂිත ප්‍රදේශය හඳුනාගත හැක. මේ සඳහා වෙන්වී ඇති මුළු භූමි ප්‍රදේශය හෙක්ටයාර් 140.151ක් එනම් මුළු භූමියෙන් 1.85%කි. (ඇමුණුම් අංක 08)

*සිතියම් අංක 2.3 ඉඩම් පරිහරණ සිතියම*



මහව නාගරික බල ප්‍රදේශය තුල වැඩි වශයෙන් දක්නට ලැබෙනුයේ කුඹුරු ඉඩම්, තෙත් බිම් හා වැව්ය. මේ අනුව මෙම ප්‍රදේශය පරිසර සංවේදීතාවය අතින් ඉහල මට්ටමක පවතී. මෙම විශ්ලේෂණය මගින්ද එය මනාව තහවුරු වේ . (සිතියම් අංක 2.4 ස්වාභාවික පාරිසරික තත්වය පිළිබඳ අධ්‍යයනය)

මානුෂික පරිසර සැලසුම් හා ස්වාභාවික පරිසර පද්ධතිය යන උප ලක්ෂනය අනුව අඳුරු තද කොළ පැහැයෙන් වඩාත් පරිසර සංවේදී කළාප පෙන්නුම් කරනු ලබන අතර, එම කළාපය තුළට රක්ෂිත වගා බිම්, තෙත් බිම් හා ජල මූලාශ්‍ර පද්ධතිය අයත්වේ. පරිසර සංවේදී අඩු කලාප කහ පැහැති වර්ණයෙන් පෙන්නුම් කරන අතර එම කළාපය තුලට නිර්මිත පරිසර සැලසුම් කලාපය අයත් වේ. (ඇමුණුම් අංක 10)

සංවර්ධන සම්පීඩන විශ්ලේෂණය (සිතියම් අංක 2.5 සංවර්ධන සම්පීඩන විශ්ලේෂණ සිතියම )මගින් මෙම නගරයේ සංවර්ධනය කුමන දිශාවට පැතිර යන්නේද යන්නත්, සංවර්ධන සම්පීඩනය කුමන ප්‍රදේශ වල බහුලව පවතින්නේද යන්නත් පැහැදිලි කරනු ලබයි. මෙහි ප්‍රතිඵලයට අනුව මෙම ප්‍රදේශයේ මහව නගරය තුළ සංවර්ධන සම්පීඩනය, ඉහළ අගයක් ගන්නා අතර ඊට සාපේක්ෂව දළදාගම හන්දිය හා ඊට ආසන්න ප්‍රදේශයේද, සංවර්ධන සම්පීඩනයක් පෙන්නුම් කරයි. තවද, මෙම විශ්ලේෂණයට අනුව මෙම ප්‍රදේශය තුළ ප්‍රධාන මාර්ගයක් වන පාදෙනිය - අනුරාධපුර මාර්ගය, නිකවැරටිය- මඩගල්ල මාර්ගය, දළදාගම මන්සන්ධියේ සිට යාපහුව දක්වා රේඛීය සංවර්ධනයක් පෙන්නුම් කරනු ලබයි.

මෙම විශ්ලේෂණය සඳහා යොදා ගනු ලැබූ නිර්නායක (Indicates) වනුයේ,

- මාර්ග පද්ධතිය හා එහි සම්බන්ධතාව - (Road and Railway net work and Road Connectivity)
- අනෙකුත් යටිතල පහසුකම් (ජල සැපයුම හා විදුලි බල සැපයුම)
- ජන ඝනත්වය -(Population Density)
- ගොඩනැගිලි ඝනත්වය -(Building Density)
- ඉඩම් භාවිතය (Land use)

යන ආදියයි. (ඇමුණුම් අංක 11)

මෙහිදී තද රතු වර්ණයෙන් සංවර්ධන සම්පීඩනය වැඩි ප්‍රදේශයන් තද කොළ වර්ණයෙන් සංවර්ධනය සම්පීඩනය ඉතා අඩු ප්‍රදේශයක් පෙන්නුම් කරනු ලබයි.

ජීවත්වීමට යෝග්‍ය කලාප හඳුනාගැනීමේ දර්ශකය (සිතියම් අංක 2.6 ජීවත් විමට යොග්‍ය කළාප හඳුනා ගැනිමේ දර්ශකය) මගින් මෙම නගරය ආශ්‍රිතව ජනතාවට ජීවත්වීමට සුදුසුම කලාපය පෙන්නුම් කරනු ලබයි. එහිදී තද දුඹුරු පැහැයෙන් යුතු කලාපය සියළුම පහසුකම් සපුරාගනිමින් ජනයාට ජීවත්වීමට යෝග්‍ය කලාපය ලෙස හඳුනාගත හැක.

***සිතියම් අංක 2.4 ස්වාභාවික පාරිසරික තත්වය පිළිබඳ අධ්‍යයනය (Environmental Sensitivity Analysis)***



***සිතියම් අංක 2.5 සංවර්ධන සම්පීඩන විශ්ලේෂණ සිතියම (Development Pressure Analysis)***



***සිතියම් අංක 2.6 ජීවත් විමට යොගා කළාප හදුනා ගැනිමේ දර්ශකය (Livability index)***



මෙම පරිච්ඡේදය තුලින් ප්‍රදේශයේ මූලික පසුබිම පිළිබඳ තොරතුරු වන භෞතික, පාරිසරික, ආර්ථික හා සමාජීය තත්වයන් අධ්‍යයනය කරන ලදී. එම අධ්‍යයනයන්ට අනුව මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය කෘෂි ආර්ථිකය පදනම් කරගෙන ස්වයංපෝෂිත ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන හැකි අතර සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීමේ ප්‍රවනතාවය ද පවතී.

## 2.3 සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම.

නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා සැලසුම් සීමාවන් පරිදි මූලික සාධකයන් මත නිර්ණය කරන ලදී.

**ප්‍රදේශයේ ක්‍රියාකාරී සීමාවන්**

මහව නගරය කෘෂි කාර්මික පෝෂක ප්‍රදේශයක් සඳහා සේවා නගරයක් ලෙස සැලකීමේදී ප්‍රදේශයේ නාගරික භාවිතයන් ප්‍රධාන වශයෙන් මහව නගර මධ්‍යය හා දළදාගම මං සන්ධිය ආශ්‍රිත ව්‍යාප්ත වී ඇති බවත් දක්නට ලැබේ. එමෙන්ම වාණිජ භාවිතයන්, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ගොඩනැගිලි, පෞද්ගලික හා මූල්‍ය ආයතන මෙම ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇත. එමෙන්ම සංවර්ධන සම්පීඩන විශ්ලේෂණය (Development pressure analysis_සිතියම් අංක 2.5) මගින් මෙම නගරයේ සංවර්ධනය කුමන දිශාවට පැතිර යන්නේද යන්නත්, සංවර්ධන සම්පීඩනය කුමන ප්‍රදේශ වල බහුලව පවතින්නේද යන්නත් පැහැදිලි කරන අතර, ඒ තුළින් මහව නාගරික සංවර්ධන බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශය, දළදාගම හන්දිය හා ඊට ආසන්න ප්‍රදේශයේද, මෙම ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වෙත බල පෑමක් එල්ල කළ හැකි ප්‍රදේශ ලෙස හඳුනා ගන්නා ලදී. එබැවින් මහව නගර සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී නාගරික ප්‍රදේශය වශයෙන් මෙම ප්‍රදේශය තෝරා ගන්නා ලදී.

**භූගෝලීය සීමාවන්**

සංවර්ධන සම්පීඩන විශ්ලේෂණය මගින් හඳුනා ගත් සංවර්ධිත ප්‍රදේශය හා නගරයේ සංවර්ධනය පැතිර යන ප්‍රදේශයත්, මහව නාගරික බල ප්‍රදේශය තුල වැඩි වශයෙන් දක්නට ලැබෙන කුඹුරු ඉඩම්, තෙත් බිම් හා වැව් ආශ්‍රිත පරිසර සංවේදීතාවය අතින් ඉහල මට්ටමක පවතින ප්‍රදේශයත් මහව නගරයේ සංවර්ධන සැලැස්ම සකස් කිරිමේ භූගෝලීය සීමාවන් ලෙස තොරා ගන්නා ලදී.

විශේෂයෙන්ම යාපහුව රාජධානිය හා ඒ ආශ්‍රිත පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු ප්‍රදේශ සංරක්ෂණය කිරීමත් සංචාරක ආකර්ශණය ලබාගැනීමට හැකිවන පරිදි සැලැසුම් සකස් කිරීමට යෝජිත කලාපයක් වශයෙන් හඳුනාගන්නා ලදී.

**පරිපාලන සීමාවන්**

නගර සංවර්ධන සැලැස්ම සකස් කිරිමේ සැලසුම් ප්‍රදේශය වශයෙන් 2008.02.08 වන දින හා අංක 166/19 දින දරන නාගරික සංවර්ධන බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශය වන හෙක්ටායර් 7441.8 කින් යුක්ත වූ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 24කින් යුක්ත වූ ප්‍රදේශය තෝරාගන්නා ලදී.

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 1982 අංක 04 හා දරණ සංශෝධන පනතේ 2 වන කොටස (අ) 8 අ(i) ට අනුව නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8A වගන්තියේ සංශෝධනය අනුව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති භූමි ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා විධිවිධාන යොදා ඇත. ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය සඳහා නගර සංවර්ධන සැලැස්ම සකස් කරන ලදී.

***සිතියම් අංක 2.7 සැලසුම් ප්‍රදේශය***




මූලාශ්‍ර:

# 3. සංවර්ධන සැලසුමක අවශ්‍යතාව

මහව නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය සඳහා ප්‍රකාශයට පත් කරන ලද නගර සංවර්ධන සැලැස්මේ වර්තමානය වන විට සැකසී නොමැති වීම මත ප්‍රදේශයේ ඇති විය හැකි අවිධිමත් සංවර්ධනය පාලනය කිරීම හා නව සංවර්ධන ප්‍රවණතාවයන්ට ශක්තිමත්ව මුහුණ දීම සඳහාත් නගර සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය මතුවී ඇත.

ඒ අනුව, 2030 මහව නගර සංවර්ධන සැලැස්ම සැකසීමේ මූලික අරමුණ වන්නේ සංවර්ධන විභවතාවයන් හා ගැටළු හඳුනාගැනීම තුලින් සංවර්ධන නැම්යාව මත සිදුවන සංවර්ධනයේ අවාසිදායක බලපෑම හීන කර ගැනීමත් වර්තමානයේ පවතින ගැටළුවලට විසඳුම් ලබාදීමත් එමගින් අනාගත සංවර්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය වන ව්‍යාපෘතීන් හා ප්‍රදේශයේ අවශ්‍යතා පිළිබඳ වන නීති හා රෙගුලාසි සම්පාදනය කිරීමය.

මහව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයේ මූලික ආර්ථික සංරචකය වන්නේ කෘෂි කර්මාන්තයයි. (මුළු ශ්‍රම බලකාය 18%ක් කෘෂීකාර්මික ආර්ථක කටයුතු වල නියැලේ.) කෘෂි කර්මාන්තය සඳහා වෙන්වී ඇති ඉඩම් ප්‍රමාණය නාගරික ඉඩම් භාවිතයෙන් 44% කි. ඉන් 26% කුඹුරු ඉඩම්ය. එසේම අනෙකුත් කෘෂිකාර්මික බෝග වගාව සඳහා යොදා ගන්නා භූමි ප්‍රමාණය 17.47% කි. (හේන් වගාව, පොල් වගාව,පලතුරු හා එළවළු වගාව) එමෙන්ම, කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය සාරවත් පසක් ප්‍රදේශයේ අන්තර්ගත වීමත් ජල රැඳවුම් ප්‍රදේශ බහුලව පිහිටා තිබීමත් (මුළු භූමි ප්‍රමාණයෙන් 10%ක් ජල රැඳවුම් ප්‍රදේශ සඳහා වෙන් වී ඇත. (වැව් 314 කි, අමුණු 19කි, වගා ළිං 175කි ) ) කෘෂි කර්මාන්තය මෙම ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික සංරචකය වීමට බලපා ඇත. වර්තමානයේ පවතින වියලි දේශගුණික තත්වය හා සැලසුම් සහගත වාර්මාර්ග පද්ධතියක් නොමැති වීම මත 2016 වර්ෂයේ මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 38%ක ප්‍රමාණයක් මහ කන්නයේ වගා කර නොමැති අතර එය 58% දක්වා යල කන්නයේදී වර්ධනය වී ඇත. 2017 වර්ෂය වන විට කුඹුරු වගා කටයුතු සිදුකරන්නේ එක් කන්නයකදී පමණි. අනෙකුත් කුඹුරු ඉඩම් පුරන් වූ කුඹුරු ලෙස අත්හැර දමා තිබීම ප්‍රදේශයේ ආර්ථිකය පහල බැසීමට ප්‍රධාන කරුණක් වී ඇත. එමෙන්ම, අනෙකුත් වගාවන් සඳහා වෙන්වී ඇති භූමියද කාලීන වගා කටයුතු කරන භූමියක් බවට පත්වී ඇත.

මහව නාගරික බල ප්‍රදේශය තුල කෘෂි කාර්මික නිශ්පාදන මෙන්ම සත්ව නිශ්පාදන අලෙවිකර ගැනීම සඳහා හොඳ වෙළඳපොලක් නොමැතිකම ප්‍රබල ගැටළුවක්ව පවතී. කලාපයේ නිශ්පාදන කුරුණෑගල, තඹුත්තේගම හා දඹුල්ල වැනි නගරයන් කරා ( කි.මී. 20ට වඩා වැඩි දුරක් වූ ප්‍රදේශ වලට ) ප්‍රවාහනය කිරීමට සිදුවේ.

එසේම කෘෂි නිශ්පාදන ආශ්‍රිතව පවත්නා මූලික ගැටළු වලට විසඳුම් ලබාදෙමින් තවදුරටත් සංවර්ධනය කිරීමේ හැකියාව පවතින අතර නගර සංවර්ධන සැලැස්මක දායකත්වය ලබාදීම හා සුදුසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් එම ආංශය සංවර්ධනය කල හැකිවනු ඇත.

මහව නාගරික ප්‍රදේශයේ පවත්නා විශේෂ වූ සංවර්ධන විභවතාවන් වනුයේ යාපහුව රාජධානිය ඇතුළු පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබීමය. යාපහුව රාජධානිය දේශීය සහ විදේශීය සංචාරකයින් ගේ ආකර්ශනයක් පැවතියද (පෙහොය දිනවලදී සංචාරකයින්ගේ පැමිණීම 80,000 ඉක්මවයි. - මූලාශ්‍රය - සංචාරක මණ්ඩලය 2016) ඒ ආශ්‍රිතව පවත්නා යාපහුව ගල් සොහොන්කොත් වැනි පුරාවිද්‍යාත්මක ස්ථාන වලට සංචාරකයින් ආකර්ශනය ඉතාමත් අඩුවේ.(පෙහොය දිනවලදී සංචාරකයින්ගේ පැමිණීම 100ට වඩා අඩුය - මූලාශ්‍රය -සංචාරක මණ්ඩලය 2016) ) එම ස්ථාන පිළිබඳව ප්‍රසිද්ධියක් හා දැනුවත් බවක් සංචාරකයින් වෙත ලබානොදීම එම ස්ථාන හුදකලාවූ මෙන්ම අත්හැර දමා ඇති ස්ථාන වශයෙන් පැවතීමත් අපරව්‍යුහ පහසුකම් (මාර්ග, ජල සැපයුම, නවාතැන් පහසුකම් ආදී.) සංවර්ධනය කර නොතිබීමත් සංචාරක ආකර්ශනය අඩුවීමට හේතුවී ඇත.

එමෙන්ම මහව ප්‍රදේශයට ආවේණිකව පවතින පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රමය හා ප්‍රාදේශීය සටන් කලාවක් වන අංගම්පොර සටන් කලාවට ප්‍රවීන වූ ප්‍රජාවක් මෙම ප්‍රදේශය තුල ජීවත්වීමද සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට පවතින සංවර්ධන විභවතාවයකි.

ඓතිහාසික රාජධානිය, ඒ ආශ්‍රිතව පවත්නා පුරාවිද්‍යාත්මක ස්ථාන, දේශීය වෛද්‍ය ක්‍රමය හා අංගම්පොර සටන් ක්‍රමය ප්‍රවර්ධනය යන අංශයන් මූලික කරගෙන දේශීය මෙන්ම විදේශීය සංචාරකයින් ගේ ආකර්ශනය ලබාගත් ප්‍රදේශයක් ලෙස මහව ප්‍රදේශය සංවර්ධනය කළ හැකිය.

මහව නගරයේ අභ්‍යන්තර ප්‍රදේශ වල ඌන සංවර්ධනයක් පැවතීම ද මෙම ප්‍රදේශයට සංවර්ධන සැලස්මක අවශ්‍යතාවය පෙන්නුම් කරන්නකි. පවත්නා භූමි පරිහරණ රටාව අනුව ප්‍රදේශයේ අභ්‍යන්තරික ප්‍රදේශ වල සංවර්ධනය කල හැකි ඉඩම් වැඩි වශයෙන් කිසිදු භාවිතයක් නොමැතිව ලඳු කැලෑ 12% වශයෙන් පැවතීම දක්නට ලැබේ. එමෙන්ම ගෙවතු වශයෙන් පවත්නා ඉඩම්වැඩි වශයෙන් සංවර්ධන සඳහා යොදා නොගෙන ඇති අතර ඒවා මුඩු ඉඩම් බවට පත් වී ඇත.

ප්‍රදේශයේ පවතින උග්‍ර ජල හිඟය මෙන්ම ප්‍රදේශයේ අභ්‍යන්තරික මාර්ග ග්‍රාමීය ප්‍රදේශ වලට ව්‍යාප්ත නොවීම හා පවත්නා මාර්ග එකිනෙක සම්බන්ධ නොවීම මෙන්ම ඒවා නිසි ලෙස නඩත්තු නොකිරීම වැනි කරුණු මෙම ඉඩම් වල අව භාවිතය සඳහා හේතු වී ඇත.

මහව ප්‍රදේශයේ භෞතික යටිතල පහසුකම් ව්‍යාප්ත වීම සලකා බැලීමේදී මාර්ග පද්ධතිය ප්‍රදේශයේ අභ්‍යන්තර ප්‍රදේශ වෙත ව්‍යාප්ත නොවීමක් දක්නට ඇත. එසේ ව්‍යාප්තවී ඇති මාර්ග ඉතා අබලන් තත්වයක පවතින අතර (ප්‍රදේශය සහ මාර්ගයන්) මාර්ගයන්ගෙන් 80%ක් පමණ බොරළු මාවත් වේ. මෙසේ මාර්ග වල අභ්‍යන්තර ප්‍රදේශ වලට ව්‍යාප්ත නොවීම පවත්නා මාර්ග අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් නොවීම, මෙන්ම එම මාර්ග නිසි ලෙස නඩත්තු නොකිරීම පවත්නා මර්ග එකිනෙක සම්බන්ධ නොවීම වැනි ගැටළු මෙහිදී දක්නට ලැබේ. අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීම හා පවත්නා මාර්ග සම්බන්ධ කිරීම, ඒවා නඩත්තු කිරීම තුලින් ප්‍රදේශයේ ජීවන කටයුතු පහසු කිරීමට මහත් පිටුවහලක් වන අතර සංවර්ධන කටයුතු අභ්‍යන්තර ව්‍යාප්ත වීමටද හේතුවනු ඇත.

ජල සම්පාදන මණ්ඩලයේ දත්ත වලට අනුව ජල ඉල්ලුමට සාපේක්ෂව ජල සැපයුම ඉතා අඩු බව පැහැදිලි වේ. කිසිදු ආකාරයේ ජල සැපයුමක් නොමැති (ජල සම්පාදන මණ්ඩලයේ හා ප්‍රජාමූල ව්‍යාපෘතිවශයෙන් ) ප්‍රදේශ මෙහි පවති. ප්‍රදේශයේ පවතින වියළි කාළගුණික තත්වයන්ට අනුව කාලීනව ඇතිවන ජල හිඟය ප්‍රදේශයට ප්‍රබල ගැටළුවක් වී ඇත.

ප්‍රදේශයේ පවතින උග්‍ර ජල ගැටළුව සම්බන්ධයෙන් සඳහන් කිරීමේදී මහව ප්‍රදේශයට ප්‍රධාන ජල මූලාශ්‍රයක් නොමැතිවීම මෙන්ම ප්‍රදේශයේ පවතින වියලි කාලගුණික තත්වය හේතු වී ඇත. ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතාවයෙන් 56% ක් පමණ සපුරාලිමට ජාතික ජල සම්පාදන මණ්ඩලයට හැකි වී ඇති බැවින් ඉතිරිව 44%ක් ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා සුදුසු ජල යෝජනා ක්‍රමයක අවශ්‍යතාවය මූලිකව හඳුනා ගෙන ඇත.

ජල හිඟ පවතින ග්‍රාම නිලධාරී වසම්

- කෝන්වැව ලියනගම තලම්බුව
- උදාගම ඇඹෝගම තිස්නම්පලගම විලව

***සිතියම් අංක 3.1 ජල සැපයුම නොමැති ප්‍රදේශ***



ඒ අනුව, නගරයේ පවත්නා සංවර්ධන විභවතාවයන් උපයෝගී කරගෙන නගරයට ප්‍රබල වශයෙන් බලපානු ලබන ගැටළු සඳහා විසඳුම් ලබාදෙමින් නගරය තුල සැලසුම් සහගත සංවර්ධනයක් ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව පවතී.

# ඇමතිතුමාගේ අනුමැතිය

# ගැසට් නිවේදනය

# දෙවන කොටස

# 4. සැලසුම් පරාසය (Planning frame work )

## 4.1 දැක්ම (Vision)

**"කෘෂි ගොවිපොල රාජධානිය"**

**(The Agro farmstead Kingdom)**

## 4.2 දැක්ම ප්‍රකාශය

මහව නගරයේ දත්ත විග්‍රහය හා සංවර්ධන විභවතාවයන් අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ මෙම ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථීක සාධකය කෘෂි කර්මාන්තය මත පදනම් වි ඇති බවයි. එබැවින් කෘෂිකර්මාන්තය ප්‍රමුඛ කර ගත් ආර්ථීක විභවතාවය උපයෝගි කරගෙන මෙම සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

"කෘෂි ගොවිපොල රාජධානිය"
(The Agro farmstead Kingdom)

මෙහිදී **"කෘෂි ගොවිපොල"** යන්නෙන් අදහස් කරනු ලබන්නේ කෘෂිකර්මය පදනම් කරගත් ආර්ථීක රටාවයි. එනම් වි වගාව, සත්ව පාලනය , හේන් වගාව, එළවළු පළතුරු ආදි වගාවන්ය. මෙම කෘෂිකාර්මික කටයුතු මගින් ජාතික ආර්ථීකයට 5%ක දායකත්වයක් ලබාදීමයි.

මොරගහකන්ද බහු කාර්ය වාරි ව්‍යාපෘතිය මඟින් මහව ප්‍රදේශයේ පවත්නා වැව් 300 සඳහා වයඹ ඇළ ව්‍යාපෘතිය මගින් ජල සම්පාදනය ලබා දිමට යෝජිතව ඇත. එමගින් ජල හිඟයට විසඳුමක් ලැබෙන අතර, ප්‍රදේශයේ පවතින භාවිතය නොගන්නා සාරවත් ඉඩම් කෘෂිකාර්මික කටයුතු සඳහා යෙදවිමේ හැකියාව ලැබි ඇත.

**"රාජධානිය"**යනුවෙන් හඳුන්වනු ලබන්නේ ශ්‍රි ලංකාවේ 4 වන අග නගරය වශයෙන් ඓතිහාසිකව පෙර රජවරුන් මෙම රාජධානිය භාවිතාකොට ඇත. එබැවින් මෙම ප්‍රදේශය ඓතිහාසිකව මෙන්ම පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ප්‍රදේශයක් බව තහවුරු වේ. එසේම ප්‍රාග් ඓතිහාසික යුගයේ ගල් සොහොන් කොත් ස්ථානගත විම නිසා මෙම ප්‍රදේශයේ එම යුගයේ පටන් ජනාවාස ප්‍රදේශයක් වශයෙන් පැවති බවට තහවුරු වි ඇත.

ඉහත සාධක මත කෘෂිකර්මාන්තය හා සංචාරක කටයුතු  පදනම් කරගත් ප්‍රදේශයේ ප්‍රධාන නගරය වශයෙන් 2030 වන විට  මහව නගර සංවර්ධය කිරිම මෙම සැලැස්මේ දැක්මයි.

2030 මහව නගර සංවර්ධන සැලැස්මට අනුව ප්‍රදේශයේ පවතින කෘෂි කාර්මික සංවර්ධන විභවතාවයන් ඔප්නැංවීම, පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික  වටිනාකම ආරක්ෂා කිරිම හා එය ජනතාව අතර ප්‍රචලිත කිරීමට අවශ්‍ය සැලසුම් ඉදිරිපත් කිරීමද මෙහිදී සිදුකරනු ලබයි.

## 4.3 අරමුණු

මහව නගරය සංවර්ධනය කිරිම සඳහා යෝජිත දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා පහත අරමුණු සම්පූර්ණ කරලීම ප්‍රධාන වේ.

01. නාගරික ආර්ථිකයට කෘෂි කාර්මික අංශයේ උපරිම  දායකත්වය ලබාගැනීම.

02. පුරාවිද්‍යාත්මක, ඓතිහාසික හා දර්ශනීය ස්ථාන සංරක්ෂණය කිරීමත් සමඟ සංචාරක ආකර්ෂණය ඉස්මතු කිරිම

03. ප්‍රදේශයේ  අවශ්‍යතා සපුරාලීම සඳහා  ප්‍රමාණවත් යටිතල පහසුකම් සැපයීම.

## 4.4 පරමාර්ථ

**අරමුණු 01**

- වර්ෂ 2030 වන විට නව ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමෙන් ප්‍රදේශයේ කෘෂිකාර්මික නිශ්පාදන සඳහා 100% ක් වෙළඳපල ප්‍රවේශයක් ලබාදීම.

- 2022 වර්ෂය වන විට මොරගහකන්ද වාරිමාර්ග ව්‍යාපෘතියේ දායකත්වයෙන් ප්‍රදේශයේ පවතින කුඹුරු ඉඩම් 100%ක්  (හෙක්ටයාර් 2000 ) ප්‍රමාණයක් වගාකිරීම.

- ඉදිරි වර්ෂ 05 තුල (2018 - 2023) වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානයක් පිහිටුවීම මගින් කෘෂිකාර්මික අංශයේ පුහුණු හා තාක්ෂණික දැනුම සහිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම.

**අරමුණු 02**

- 2030 වර්ෂය වන විට යාපහුව රාජධානිය හා අනෙකුත් සංස්කෘතික උරුමයන් හා ස්ථාන වල අනන්‍යතාවය සුරක්ෂිත කිරීම සහ සංචාරක ආකර්ශණය වර්ධනය කිරීම.

**අරමුණු 03**

- 2030 වර්ෂය වන විට කාර්යක්ෂම සහ සුරක්ෂිත ප්‍රවාහන ජාලයක් ඇති කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග කි.මී. 30ක් සංවර්ධනය කිරීම.

- 2030 වර්ෂය වන විට මහව දුම්රිය මංසන්ධිය හේතුවෙන් ඇතිවන වාහන තදබදය අවම කිරීම සඳහා ගුවන් පාලමක් ඉදිකිරීම.

- 2022 වර්ෂය වන විට දැදුරු ඔය ජලසම්පාදන ව්‍යාපෘතිය මගින් මහව නාගරික සහා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 24ක් සඳහා 100%ක ප්‍රමාණවත් පානීය ජල සැපයුමක් ලබාදීම.

# 5. ශක්තීන්, දූර්වලතා, අවස්ථා, තර්ජන විශ්ලේෂණය හා තත්ව විශ්ලේෂණයේ සාරාංශය

## 5.1. අරමුණු - 01 - නාගරික ආර්ථිකයට කෘෂි කාර්මික අංශය දායකත්වය උපරිම කිරීම.

| ශක්තීන් | දූර්වලතා |
|---|---|
| 1. කෘෂි කාර්මික ඉඩම් බහුලව පැවතීම.(මුළු ඉඩම් ප්‍රමාණයෙන් 44.47%ක්)<br>2. ප්‍රදේශයේ කෘෂි නිෂ්පාදන තුලින් දළ දේශිය නිෂ්පාදනයට දායකත්වයක් ලබාදීම<br>3. කෘෂි කාර්මික අංශයට ජලය ලබාගත හැකි ජල රැඳවුම් ප්‍රදේශ බහුලව පැවතීම.<br>4. කෘෂි කාර්මික කටයුතු සඳහා යෝග්‍ය පසක් පැවතීම.<br>5. සමස්ථ ශ්‍රම බලකායෙන් 18%ක සේවා නියුක්ති ප්‍රමාණයක් කෘෂි කර්මය ආශ්‍රිත කටයුතු වල නිරත වීම.<br>6. කෘෂිකාර්මික අංශය විවිධාංගීකරණය කිරීමට ඇති හැකියාව. | 1. ක්‍රමවත් වාරි පද්ධතියක් නොමැති වීම<br>2. කාලීන දේශගුණික විපර්යාස හමුවේ කෘෂිකාර්මික කටයුතු විවිධාංගීකරණය නොකිරීම.<br>3. කෘෂි නිෂ්පාදන සඳහා දූර්වල වෙළඳපොල අවස්ථා පැවතීම.<br>4. වන සතුන් මගින් කෘෂිකාර්මික කටයුතු සඳහා තර්ජන එල්ලවීම.<br>5. කෘෂිකර්මාන්තය ආශ්‍රිත නව තාක්ෂණික දැනුම, පුහුණු ශ්‍රමය හා ප්‍රමාණවත් ශ්‍රම බලකායක් නොමැති වීම. |
| **අවස්ථා** | **තර්ජන** |
| 1. වර්තමානයේ ක්‍රියාත්මක වන මොරගහකන්ද වාරිමාර්ග ව්‍යාපෘතිය<br>2. කාබනික පොහොර නිෂ්පාදනය හා ඒවා කෘෂි කාර්මික කටයුතු සඳහා යොදාගැනීමට අවස්ථාව පැවතීම. | **1.** වියළි කාලගුණය |

### 5.1.1. ශක්තීන්

#### i. කෘෂිකාර්මික ඉඩම්පැවතීම

ප්‍රදේශයේ සමස්ථ ඉඩම් පරිහරණයෙන් 44.47%ක භූමි ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය සඳහා වෙන්වී පැවතීම, හේතුවෙන් මහව නගරයේ ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා ඉන් උපරිම දායකත්වයක් ලබාගත හැකිය.

*වගු අංක **5.1** කෘෂිකාර්මික ඉඩම් පරිහරණය-මහව*

| භාවිතය | | ප්‍රතිශතය |
|---|---|---|
| කුඹුරු | | **26.88%** |
| වෙනත් කෘෂිකාර්මික ඉඩම් | | |
| හේන් | 3.48% | |
| පොල් | 5.31% | 17.59 |
| වෙනත් | 8.80% | |
| මුළු ගනන | | 44.47% |

මූලාශ්‍රය - සම්පත් පැතිකඩ - 2016

මුළු ප්‍රමාණයෙන් 44.47% ක් කෘෂිකාර්මික කටයුතු සඳහා යෙදවී ඇති අතර ඉන් 26% (හෙක්ටයාර් 2000)ක් කුඹුරු වගාව සඳහා වෙන්වී ඇත.

*වගු අංක **5.2** පළතුරු වගාව සඳහා යෙදවී ඇති භූමි ප්‍රමාණ*

| පළතුරු වගාව | භූමි ප්‍රමාණ (හෙක්) |
|---|---|
| | |
| දොඩම් | 13.4 |
| කෙසෙල් | 149.6 |
| අඹ | 35 |
| කජු | 42 |
| පැපොල් | 39.4 |
| දෙළුම් | 4 |
| පේර | 6 |
| අන්නාසි | 2.4 |
| එකතුව | 291.8 |

මූලාශ්‍රය - සම්පත් පැතිකඩ - 2016

*වගු අංක 5.3 කෘෂිකාර්මික සංවර්ධනය සඳහා යොදාගත හැකි වෙනත් භූමි ප්‍රමාණයන්*

| භාවිතය | ප්‍රතිශතය |
|---|---|
| ලඳු කැලෑ | 12.12% |
| ගෙවතු | 22.22% |
| **මුළු ගනන** | **34.34%** |

මූලාශ්‍රය - සම්පත් පැතිකඩ - 2016

තවදුරටත් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා යොදාගත හැකි භූමිය (ලඳු කැලෑ හා ගෙවතු) මුළු ඉඩම් වලින් 34%ක ප්‍රතිශතයක් වේ.

කෘෂිකාර්මික වගාවන්ට අමතරව මෙම ප්‍රදේශයේ සත්ව පාලන කටයුතුද සිදුකරනු ලබයි. ඒ අනුව, මහව ප්‍රදේශය තුල සත්ව පාලන කටයුතු පිළිබඳව පහත වගුවෙන් දැක්වෙන අතර කුකුළන් සහ ගවයන් ඇති කිරීම සඳහා වැඩි ප්‍රවනතාවක් පවතින බව පැහැදිලි වේ.

*වගු අංක 5.4 සත්ත්ව පාලනය*

| වර්ගය | ගොවිපොලවල් ගණන |
|---|---|
| කුකුළන් | 578 |
| ගවයින් | 2755 |
| ඌරන් | 33 |
| එළුවන් | 147 |
| එකතුව | 3513 |

මූලාශ්‍රය - සම්පත් පැතිකඩ - 2016

ඉහත කෘෂිකර්මාන්තය හා බැඳි ශක්තීන් අනුව මෙම ප්‍රදේශය කෘෂිකාර්මික වශයෙන් සංවර්ධනය කළ හැකි බවත්, එය නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීමට උපරිම වශයෙන් දායක කර ගත හැකි බවත් තහවුරු වේ.

***සිතියම් අංක -5.1 මහව නාගරික බල ප්‍රදේශයේ කෘෂිකාර්මික ඉඩම් පරිහරණය***



### ii. ප්‍රදේශයේ කෘෂි නිශ්පාදන තුලින් දල දේශිය නිෂ්පාදනයට ලබාදෙනු ලබන දායකත්වය

මහව ප්‍රදේශයේ කෘෂිකාර්මික නිෂ්පාදන තුළින් දළ ජාතික නිෂ්පාදනයට ලබාදෙන දායකත්වය, මහව නගර සංවර්ධනය උපරිම කිරීමේ අරමුණ ඉටුකිරීමේ ලා වැදගත් වේ.

මෙහිදී 2016 මහ බැංකු වාර්තාවට අනුව මහව ප්‍රදේශයේ වී වගාව තුළින් දළ ජාතික නිෂ්පාදනයට ලබාදුන් දායකත්වය 2.31%කි. එමෙන්ම අතුරු බෝග වගාව තුළින් (මු, කව්පි, රටකජු, සියඹලා හා අනෙකුත් ධාන්‍ය වර්ග) 3% ක්ද පළතුරු නිශ්පාදනයෙන් (අන්නාසි, කෙසෙල්, අඹ, කජු) 3% ක්ද සත්ව පාලන නිෂ්පාදන තුළින් 1% ක දායකත්වයක්ද ලබාදෙන ලදී. ඒ අනුව මහව ප්‍රදේශයේ කෘෂි කර්මාන්තය ජාතික මට්ටමින් කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීමට දායකත්වය ලබාදී ඇති බව පැහැදිළි වේ.

මූලාශ්‍රය - මහ බැංකු වාර්තාව - 2016

### iii. කෘෂි කාර්මාන්ත අංශයට ජලය ලබාගත හැකි ජල රැඳවුම් ප්‍රදේශ බහුලව පැවතීම.

මුළු භූමි ප්‍රමාණයෙන් 9.46%ක් ජල රැඳවුම් ප්‍රදේශ ලෙස වෙන්වී තිබීම, මහව ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීම කෙරේ බලපාන තවත් සාධකයකි. මේ අනුව, මහව නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය තුළ වැව් 314 ක්ද අමුණු 19 ක්ද වගා ළිං 175 ක්ද පිහිටීම මෙහිලා වැදගත් වේ. (ඇමුණුම් අංක 01)

***සිතියම අංක 5.2 මහව නාගරික බල ප්‍රදේශයේ ජලාශ හා කුඹුරු ඉඩම්***



**iv. කෘෂි කාර්මික කටයුතු සඳහා යෝග්‍ය පසක් පැවතීම.**

මෙම කලාපය තුල රතු කහ පොඩ්සෝල් පස පවතී (Red and Yellow Podzol soil) මෙය කෘෂි කර්මය සඳහා වඩාත් යෝග්‍ය පසක් වේ.

***5.1 රූපය- පාංශු සිතියම ශ්‍රී ලංකාව***



2.1 සිතියම - ශ්‍රී ලංකාවේ පස් වර්ග ව්‍යාප්තිය

මූලාශ්‍රය - ඇට්ලස් සිතියම් පොත -2016

**v. සමස්ථ ශ්‍රම බලකායෙන් 18 % ක සේවා නියුක්ති ප්‍රමාණයක් කෘෂි කර්මය ආශ්‍රිත කටයුතු වල නිරත වීම.**

මහව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය තුල සිටින මුළු ශ්‍රම බලකායෙන් 18%ක ප්‍රමාණයක් කෘෂි කර්මානත්ය ආශ්‍රිත කටයුතු වල නිරතවීම දක්නට ලැබේ.

*රූපය 5.2- ශ්‍රම බලකාය*




මූලාශ්‍රය - සම්පත් පැතිකඩ - 2016

පහත වගු සටහන මගින් පෙන්නුම් කරනුයේ 2016 වර්ෂය වන විට මහව ප්‍රදේශයේ කෘෂි කර්මාන්තය තම මූලික ජීවනෝපාය කරගත් පවුල් සංඛ්‍යාවය.

*වගු අංක 5.5 කෘෂි කර්මයේ නිරත පවුල් සංඛ්‍යාව - මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය*

| කෘෂිකාර්මික කටයුතු | පවුල් සංඛ්‍යාව |
|---|---|
| පළතුරු වගාව | 430 |
| කුඹුරු | 654 |
| එළවළු වගාව | 146 |
| සත්ව පාලනය | 352 |
| එකතුව | 1582 |

මූලාශ්‍රය - සම්පත් පැතිකඩ- 2016

මෙයින් පැහැදිලි වනුයේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය ශ්‍රම බලකායක්ද මෙම ප්‍රදේශය තුළම නිර්මාණය වී ඇති බවයි.

**vi. කෘෂිකාර්මික අංශය විවිධාංගීකරණය කිරීමට ඇති හැකියාව.**

කාලීන දේශගුණික රටාව අනුව කෘෂිකාර්මික අංශය විවිධාංගීකරණය කිරීමට ප්‍රදේශයේ පවතින නැඹුරුව මෙම ප්‍රදේශයේ කෘෂිකාර්මික අතින් පෝෂණය වූ නගරයක් වශයෙන් සංවර්ධනය කිරීමට ඇති හැකියාව පෙන්නුම් කරනු ලබන තවත් සාධකයකි.

වර්ථමානය වන විට මෙම ප්‍රදේශයේ පවතින කාලීන දේශගුණික රටාවට අනුව කෘෂිකාර්මික විවිධාංගීකරණය මහව ප්‍රදේශයේ සුළු වශයෙන් දක්නට ලැබේ.

උදා : මල් වගාව, මීමැසි පාලනය, සත්ත්ව පාලනය හා ගෙවතු වගාව සිදුකිරිම.

මූලාශ්‍රය - ගොවිජන සේවා දෙපාර්තමේන්තුව - කුරුණෑගල - 2017

## 5.1.2. දුර්වලතා

**i. ක්‍රමවත් වාරි පද්ධතියක් නොමැති වීම**

මෙම ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබාගත හැකි වැව් 314 ක් පිහිටා ඇති නමුත් ඒ සඳහා ක්‍රමවත් වාරි මාර්ග පද්ධතියක් නොමැති වීම කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය අඩාල වීමට බලපාන මූලික ගැටලුවක් වේ. මෙම ප්‍රදේශයේ ජල රැඳවුම් ප්‍රදේශ ලෙස වැව් 314 ක් පිහිටා තිබුණද ඩෙම් සඳහා ජලය සැපයිය හැකි ප්‍රධාන මූලාශ්‍රයක් නොමැති වීම මත වියලි දේශගුණය හමුවේ මෙම වැව් සශ්‍රීක නොවේ.

***සිතියම් අංක 5.3* මහව කලාපයේ වැව්**



**ii. කාලීන දේශගුණික විපර්යාස හමුවේ කෘෂිකාර්මික කටයුතු විවිධාංගීකරණය නොකිරීම.**

**iii. කෘෂි නිෂ්පාදන සඳහා පවතින වෙළඳපොල අවස්ථා දුර්වල මට්ටමක පැවතීම.**

ප්‍රදේශයේ කෘෂි නිෂ්පාදන අලෙවි කරගැනීම සඳහා දියුණු වෙළඳපොලක් නොමැති වීම නිසා කෘෂි නිෂ්පාදන වලින් වැඩි ප්‍රතිශතයක් විනාශ වීම මෙන්ම පවත්නා අස්වැන්න අලෙවි කර ගැනීම සඳහා කුරුණෑගල, තඹුත්තේගම,කොළඹ, දඹුල්ල යන නගර කරා යාමට සිදුවේ. මෙම හේතුව මත ප්‍රදේශයේ ගොවීන් කෘෂිකර්මාන්තය අතහැර වෙනත් රැකියාවන් සඳහා යොමුවීම දක්නට ලැබේ.

**iv. වන සතුන් මගින් කෘෂිකාර්මික කටයුතු සඳහා එල්ලවන තර්ජන**

මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සිතියමෙන් දක්වා ඇති ප්‍රදේශ වල උග්‍ර වශයෙන් වල් අලි තර්ජන පවතින අතර අනෙකුත් ප්‍රදේශ වල ද සුළු වශයෙන් හෝ මෙම ගැටලු පවතී. ප්‍රධාන වශයෙන් මැඩියාව,රොලව, දැතව, විලව හා නෙත්තිපලගම යන ග්‍රාම නිලධාරී වසම් අලි උවදුර පවතින ප්‍රදේශ ලෙස දැක්විය හැකිය. (සිතියම් අංක 05) මෙම ප්‍රදේශ අශ්‍රිතව කෘෂිකාර්මික ඉඩම් බහුලව ව්‍යාප්තව පවතී. නමුත් මෙම කෘෂි ඉඩම් සංවර්ධනය කිරීමට බලපාන ප්‍රධාන ගැටළුව වන්නේ වල් අලි තර්ජන පැවතීමයි.

2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල රාමුව තුළ වල් අලි මගින් කෘෂි වගාවන්ට සිදුවී ඇති හානිය පහත වගුව මගින් පෙන්නුම් කෙරේ.

*වගු අංක 5.6 වන සතුන් මගින් කෘෂිකාර්මික කටයුතු සඳහා එල්ලවන තර්ජන*

| වර්ෂය | කෘෂි දේපල වලට සිදුකරන ලද හානි |
|---|---|
| 2012 | 15 |
| 2013 | 10 |
| 2014 | 16 |
| 2015 | 25 |
| 2016 | 15 |
| 2017 | 21 |

මූලාශ්‍රය - වන ජීවී දෙපාර්තමේන්තුව- කුරුණෑගල

*සිතියම් අංක 5.4 අලි උවදුරු පවතින ප්‍රදේශ*




## අලි උවදුරු පවතින ප්‍රදේශ

*මූලාශ්‍රය :- වන ජීවී දෙපාර්තමේන්තුව - කුරුණෑගල 2017*

නාගරික සංවර්ධන අධිකාරිය
වයඹ පළාත් කාර්යාලය
ජූනි-2018

*මහව නාගරික සංවර්ධන සැලැස්ම (2018-2030)*

*සැලසුම් අංශය*

*සැකසුම :- පී. පී ඩී. රාජපක්ෂ*

**v. කෘෂිකර්මාන්තය ආශ්‍රිත නව තාක්ෂණික දැනුම හා ප්‍රමාණවත් ශ්‍රම බලකායක් නොමැති වීම**

මෙම ප්‍රදේශය තුළ ප්‍රධාන ආර්ථිකය කෘෂිකර්මාන්තය වුවත්, වියළි දේශගුණික තත්වය හමුවේ එම කාල වලදී ගොවීන් වගා කිරීම නවතා දමනු ලබයි. 2016 මහව සම්පත් පැතිකඩ වාර්ථාවට වියළි දේශගුණය හේතුවෙන් යල කන්නයේ වගා කර නැති කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 1160කි. (මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 2000 කි) මෙම කුඹුරු පුරන් වූ කුඹුරු ලෙස පැවති අතර, ගොවීන් තම කටයුතු වලින් ඉවත් වීමට පහත හේතු ප්‍රබලව බලපා ඇත.

- නිසි ජල කළමනාකරණයක් නොමැති වීම
- බෝග විවිධාංගීකරණය පිළිබඳ ඔවුන් තුළ නිසි දැනුමක් නොමැති වීම.
- ඒ සඳහා අවශ්‍ය ගුණාත්මක බීජ නොමැති කම
- තාක්ෂණික දැනුම හිඟකම

එමෙන්ම, මෙම ප්‍රදේශය තුළ සත්ව පාලනය දියුණු කිරීම ආශ්‍රිතවද පහත සඳහන් ගැටළු පවතී.

- අභිජනන ද්‍රව්‍ය හිඟකම
- ගව ආහාර හිඟකම
- සත්ව පාලනය සඳහා අවශ්‍ය පුහුණු හා තාක්ෂණික දැනුමෙන් යුතු ශ්‍රමිකයන් නොමැතිවීම

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ 2016

ඒ අනුව, මෙම නගරයේ ආර්ථිකය කෘෂි කාර්මික වශයෙන් ශක්තිමත් කිරීමේදී ඉහත දුර්වලතා ගැටළු වශයෙන් පවතින බව පැහැදිලි වේ.

## 5.1.3. අවස්ථා

**i. වර්තමානයේ ක්‍රියාත්මක වන මොරගහකන්ද වාරිමාර්ග ව්‍යාපෘතිය**

මහව ප්‍රදේශයේ කෘෂිකාර්මික සංවර්ධනය ඉහල මට්ටමකට වර්ධනය කිරීමට එහි දායකත්වය නාගරික ආර්ථිකයේ වර්ධනය උපරිම කිරීමටත් පවතින ප්‍රධාන අවස්ථාව ලෙස වයඹ ඇළ ව්‍යාපෘතිය දැක්විය හැකිය. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන මෙම ව්‍යාපෘතියෙන් මහව ප්‍රදේශයේ කුඩා වැව් සියල්ලටම ජලය ලබාදීමට යෝජිතය.

*රූපය 5.3- මොරගහකන්ද වාරිමාර්ග ව්‍යාපෘතිය*




මූලාශ්‍රය - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය -2017

**ii. කාබනික පොහොර නිශ්පාදනය හා ඒවා කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගැනීමට අවස්ථාව පැවතීම.**

දැනට මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියෝදාගම ප්‍රදේශයේ පවතින කසළ ප්‍රතිචක්‍රීකරණය ව්‍යාපෘතිය මගින් කාබනික පොහොර නිෂ්පාදනය හා අලෙවිය සිදුකරන බැවින් ඒවා කෘෂි කර්මාන්තය සඳහා යොදාගැනීමේ හැකියාව ඇත.

*රූපය 5.4 කසළ ප්‍රතිචක්‍රීකරණය ව්‍යාපෘතිය*





මූලාශ්‍රය - ඡායාරූපකරණය:- පී.පී.ඩී.රාජපක්ෂ , 2017- දෙසැම්බර්

### 5.2.4. තර්ජන

#### i. වියළි කාලගුණය

මහව ප්‍රදේශයට බලපාන වියලි දේශගුණය, කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය අඩාල වීමට බලපාන තර්ජනාත්මක ගැටළුවකි. ඒ අනුව, මහව ප්‍රදේශයේ උපරිම වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 29ක් වන අතර වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය මි.මී. 700කි. මෙම වියළි කාළගුණය මත 2016,2017 වර්ෂ තුළදී මහව ප්‍රදේශයේ වී වගාව සිදුකර ඇත්තේ එක් කන්නයකදී පමණි. එහිදී ලැබී ඇත්තේ අවම අස්වනු ප්‍රමාණයකි. එමෙන්ම වියළි කාලවලදී තෘණ වගාව විනාශ වීම නිසා සත්ව පාලනය නිසියාකාරව සිදුකිරීමට නොහැකියාව පවතී.

## 5.2. අරමුණු - 02 පුරාවිද්‍යාත්මක, ඓතිහාසික හා දර්ශනීය ස්ථාන මෙන්ම පරිසර සංවේදී ස්ථාන සංරක්ෂණය කිරීම.

| ශක්තීන් | දුර්වලතා |
| --- | --- |
| 01. ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක උරුමයන් පැවතීම.<br>02. ප්‍රදේශයේ පවතින සුන්දර ස්ථාන.<br>03. සංස්කෘතික වටිනාකම.(කලාපයට ආවේනික දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම හා දේශීය සටන් කලාව)<br>04. සුගම ප්‍රවාහන ජාලයක් පැවතීම. (මහව දුම්රිය මංසන්ධිය හා අනුරාධපුර - කුරුණෑගල, නිකවැරටිය මඩගල්ල මාර්ග පද්ධතිය පිහිටා තිබීම.) | 01. සංචාරක කර්මාන්තය සඳහා අවශ්‍ය භෞතික සමාජීය හා අපරව්‍යූහ පහසුකම් වල හිඟ බව.<br>02. ප්‍රකට නොවූ පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික ස්ථාන පැවතීම.<br>03. සංචාරක ආකර්ශන ස්ථාන නිසි පරිදි කළමනාකරණය හා නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| **අවස්ථා** | **තර්ජන** |
| 01. ප්‍රදේශයේ සංචාරක ආකර්ශනය වැඩිකිරීම උදෙසා වර්තමානයේ පවතින විදේශීය, පෞද්ගලික අංශයේ දායකත්වය<br><br>02. ප්‍රදේශයේ පවතින සංස්කෘතික වටිනාකම ඔප්නැංවීම සඳහා ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති. ( උදාහරණ - මහව නාගරික ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙමින් පවතින සම්ප්‍රදායික අංගම්පොර ක්‍රීඩා පුහුණු කිරීමේ මධ්‍යස්ථානය). | |

## 5.2.1. ශක්තීන්

### i. ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක උරුමයන් පැවතීම.

*රූපය 5.5 යාපහුව රාජධානිය*



මූලාශ්‍රය:https://www.google.lk/search?q=yapahuwa+kingdom&rlz=1C1GCEA_enLK808LK808&source=lnms&tbm=isch&sa=X&vd=0ahUKEwiUgovLyrLeAhUVS48KHeO8AmsQ_AUIDigB&biw=1360&bih=657

මුහුදු මට්ටමේ සිට උසින් අඩි 300ක් පමණ වූ ද ගොඩබිමේ සිට උසින් අඩි 400ක් පමණ ඉක්ම වූද පාෂාණ උද්ගතය කේන්ද්‍ර කොටගෙන බිහිවූ යාපහුව ආරක්ෂිත රාජධානිය මහව ප්‍රදේශයට ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම එක්කරන ප්‍රධාන සාධකයයි. වර්ථමානයේ මෙම ස්ථානය දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ශණීය ස්ථානයක් බවට පත්ව ඇත. මෙම ස්ථානය නැරඹීමට විශේෂ පොහොය දින වලදී පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ ප්‍රමාණය 100,000 ඉක්මවන අතර සාමාන්‍ය පොහොය දිනවලදී එම ප්‍රමාණය 10,000ක් පමණ වේ.

මූලාශ්‍රය :සංචාරක මණ්ඩලය - 2017

### ii. ප්‍රදේශයේ පවතින සුන්දර ස්ථාන

දැදුරු ඔය ජලාශය, මූණමලේ වැව, මැද වැව වැනි දර්ශනීය ජලාශ පිහිටා තිබීමද මෙම ප්‍රදේශය සංචාරක ආකර්ශනීය ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට තිබෙන ප්‍රධාන සාධකයන් වේ.

*රූපය 5.6 ප්‍රදේශයේ පවතින සුන්දර ස්ථාන*

මැද වැව (Meda Wawa) මූනමලේගම වැව දැදුරු ඔය ජලාශය



මූලාශ්‍රය - ඡායාරූපකරණය:- පී.පී.ඩී.රාජපක්ෂ , 2017- දෙසැම්බර

### iii.සංස්කෘතික වටිනාකම

- දේශීය ආයුර්වේද ප්‍රතිකාර ක්‍රමය

*රූපය 5.7 ප්‍රදේශයේ පවතින දේශීය ආයුර්වේද ක්‍රමය*



මූලාශ්‍රය - https://www.google.lk/search?rlz=1C1GCEA_enLK808LK808&biw=1360&bih=657&tbm=isch&sa=1&ei=9KPaW6yfOMaDvQSN3YaoAw&q=ayuruwedic+treatment+paradaise+hotel&oq=ayuruwedic

ප්‍රදේශයේ පවතින පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රගුණ වූ වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන රැසක් මහව ප්‍රදේශය පුරා පැතිර පැවතීම මෙහිලා වැදගත්වේ.

ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන- 01

පෞද්ගලික ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන - 68

- **අංගම්පොර සටන් කලාව- (Angampora)**

*රූපය 5.8 ප්‍රදේශයේ පවතින අංගම්පොර සටන් කලාව*



මූලාශ්‍රය - https://www.google.lk/search?rlz=1C1GCEA_enLK808LK808&biw=1360&bih=657&tbm=isch&sa=1&ei=9KPaW6yfOMaDvQSN3YaoAw&q=ayuruwedic+treatment+paradaise+hotel&oq=ayuruwedic

ප්‍රදේශයේ පවතින සංස්කෘතික වටිනාකමද මෙම ප්‍රදේශයට සංචාරක ආකර්ශනය වර්ධනය කර ගැනීමට බලපාන ප්‍රධාන සාධකයකි.දේශීය අංගම්පොර සටන් කලාව ප්‍රගුන කළ ජනතාවක් ප්‍රදේශයේ සිටීමත් එම

කලාව දේශිය විදේශීය සංචාරකයින් වෙත ප්‍රචලිත කිරීම සඳහා දායක වීමත් මෙම ප්‍රදේශයට සංචාරක ආකර්ශනය තවදුරටත් වර්ධනය කරන්නකි.

**iv. සුගම ප්‍රවාහන ජාලයක් පැවතීම, මහව දුම්රිය මංසන්ධිය හා අනුරාධපුර - කුරුණෑගල, නිකවැරටිය මඩගල්ල මාර්ග පද්ධතිය පිහිටා තිබීම.**

ප්‍රධාන මාර්ගයන්හි සෘජු ප්‍රවේශය කුරුණෑගල සිට අනුරාධපුරය දක්වා විහිදී ඇති අතර දුම්රිය මාර්ග ප්‍රවේශය කොළඹ, යාපනය හා ත්‍රිකුණාමලය දක්වා විහිදී ඇත. මෙලෙස සුගම ප්‍රවාහන ජාලයක් පැවතීම මෙම ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නකි.( සිතියම් අංක 08)

## 5.2.2. දුර්වලතා

**i. සංචාරක කර්මාන්ත සඳහා අවශ්‍ය භෞතික සමාජයීය හා අපරව්‍යුහ පහසුකම් වල හිඟ බව**

❖ **ජල සැපයුම**

තලම්බුව හා ඇඹෝගම යන ග්‍රාම සේවා වසම් තුළ පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික ස්ථාන ව්‍යාප්තව ඇති අතර සංචාරකයින්ට පහසුකම් සැපයිය හැකි පරිදි ජල සම්පාදනය ව්‍යාප්තව නොතිබීම මෙම ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය අඩාල වීමට බල ප්‍රධාන හේතු වී ඇත.(සිතියම් අංක-10)

❖ **ප්‍රවාහනය පහසුකම්**

| පුරාවිද්‍යාත්මක ස්ථාන | මාර්ගය | පළල | තත්වය |
|---|---|---|---|
| කොන්ඩදෙණිය ගල් සොහොන්කොත් පිහිටි පුරාවිද්‍යාත්මක ස්ථානය | කොන්ඩදෙණිය පන්සල් පාරට සම්බන්ධවන අතුරු මාර්ගය | අඩි 15 | බොරළු මාර්ගයකි |

❖ හෝටල් හා ආපනශාලා, නවාතැන් පහසුකම්

එක් ප්‍රධාන තරු පහේ හෝටලය පමණක් පවති. ඊට අමතරව කුඩා නිවාස නවාතැන්පොලවල් ලෙස පරිවර්ථනය කර සංචාරකයින්ට නවාතැන් පහසුකම් සපයනු ලැබේ.
බැංකු හා මූල්‍ය පහසුකම් , සංචාරක කර්මාන්තය සඳහා මග පෙන්වන තොරතුරු මධ්‍යස්ථාන යාපහුව පුරාවිද්‍යාත්මක ස්ථානය ආශ්‍රිතව ව්‍යාප්තව නොමැත.

**ii. ප්‍රකට නොවූ පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික ස්ථාන පැවතීම**

***රූපය 5.9 ප්‍රකට නොවූ පුරාවිද්‍යාත්මක ස්ථාන පැවතීම***




මූලාශ්‍රය - ඡායාරූපකරණය:- පී.පී.ඩී.රාජපක්ෂ , 2017- දෙසැම්බර්

**iii. සංචාරක ආකර්ශන ස්ථාන නිසි පරිදි කළමනාකරණය හා නිසි පරිදි නඩත්තු නොකිරීම.**

උදා : යාපහුව ගල් සොහොන්කොත් පුරාවිද්‍යාත්මක ස්ථානය ආශ්‍රිතව ඒ පිළිබඳව සඳහන් වූ නාම පුවරුවක්වත් නොමැති වීම.

## 6.2.3. අවස්ථා

i. **ප්‍රදේශයේ සංචාරක ආකර්ශනය වැඩිකිරීම උදෙසා වර්තමානයේ පවතින විදේශීය, පෞද්ගලික අංශයේ දායකත්වය**

උදාහරණ - Paradise Hotel.

වර්තමානයේ පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය වශයෙන් ප්‍රචලිත පාරම්පරික ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානය හා එමගින් පවතින සංචාරක ආකර්ශනය මෙහිලා දැක්විය හැකිය.

මෙම ස්ථානයට විශේෂ දිනවලදී සේවා ලබාගැනීම සඳහා විදේශීය සංචාරකයින් 150ක් පමණ පැමිණේ. සාමාන්‍ය දිනවලදී එම සංඛ්‍යාව 75ත් 100 ත් අතර වේ. මෙම ස්ථානය විදේශීය සංචාරකයින්ගේ ආකර්ශණීය ස්ථානයක් බවට පත්ව ඇත්තේ එහි සංවිධානාත්මක ලෙස පවත්වාගෙන යන දේශීය ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන හේතුවෙනි. මෙයද මෙම ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය වර්ධනයට බලපාන ප්‍රධාන අවස්ථාවකි.

***රූපය 5.10 Paradise Hotel***



මූලාශ්‍රය -
https://www.google.lk/search?rlz=1C1GCEA_enLK808LK808&biw=1360&bih=657&tbm=isch&sa=1&ei=9KPaW6yfOMaDvQSN3YaoAw&q=ayuruwedic+treatment+paradaise+hotel&oq=ayuruwedic

**ii. ප්‍රදේශයේ පවතින සංස්කෘතික වටිනාකම ඔප් නැංවීම සඳහා ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති.**

උදාහරණ - මහව නාගරික ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙමින් පවතින සම්ප්‍රදායික අංගම්පොර ක්‍රීඩා පුහුණු කිරීමේ මධ්‍යස්ථානය.

*රූපය 5.11 අංගම්පොර ක්‍රීඩා පුහුණු කිරීමේ මධ්‍යස්ථානය.*



මූලාශ්‍රය - ඡායාරූපකරණය:- පී.පී.ඩී.රාජපක්ෂ , 2017- දෙසැම්බර්

## 5.3. අරමුණු - 03 ප්‍රදේශයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සැපයීම.

| **ශක්තීන්** | **දුර්වලතා** |
|---|---|
| 01. ප්‍රධාන මාර්ග හා දුම්රිය මාර්ග ජාලයක් පැවතීම.<br>02. ප්‍රජාමූල ජල ව්‍යාපෘති පිහිටීම. | 01. අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉතා දුර්වල මට්ටමක පැවතීම.<br>02. ප්‍රධාන මාර්ගය හරහා දුම්රිය මාර්ග පිහිටා තිබීම නිසා ඇතිවන රථවාහන තදබදය<br>03. අනුරාධපුර - කුරුණෑගල ප්‍රධාන මාර්ගය, මහව නගරයට පිටතින් දළදාගම මංසන්ධියේ පිහිටා තිබීම නිසා මහව නගරයේ සංවර්ධනය නගරයෙන් පිටතට ඇදී යාම.<br>04. ප්‍රමාණවත් පරිදි ජල අවශ්‍යතා සපුරා නොතිබීම. |
| **අවස්ථා** | **තර්ජන** |
| 01.දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය | - |

## 5.3.1. ශක්තීන්

### i. ප්‍රධාන මාර්ග හා දුම්රිය මාර්ග ජාලයක් පැවතීම.

***සිතියම් අංක 5.5 මාර්ග හා දුම්රිය මාර්ග ජාලය***




මූලාශ්‍රය - ඡායාරූපකරණය:- පී.පී.ඩී.රාජපක්ෂ , 2017- දෙසැම්බර්

***රූපය 5.12 ප්‍රධාන මාර්ග හා දුම්රිය මාර්ග***



ප්‍රදේශයට අවශ්‍ය යටිතල පහසුකම් ශක්තිමත් කිරීම යන අරමුණු යටතේ පවතින ප්‍රධාන ශක්තිය වන්නේ මහව ප්‍රදේශය හරහා දිවෙන ප්‍රධාන මාර්ගයක් වන කුරුණෑගල - අනුරාධපුර මාර්ගය පිහිටා තිබීමත්, ත්‍රිකුණාමලයට, යාපනයට හා අනුරාධපුරයට ඍජු ප්‍රවේශයක් ලබාගත හැකි දුම්රිය මාර්ගය පිහිටා තිබීමත්ය.

### ii. ප්‍රජාමූල ජල ව්‍යාපෘති පිහිටීම

*වගු අංක 5.7 ප්‍රජාමූල ජල ව්‍යාපෘති*

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | ප්‍රජා මූල සංවිධානයේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුහුණ දී ඇති ගැටළුව |
|---|---|---|---|---|
| 01 | අංක 200 පහළ බලල්ල | දියබිඳු ප්‍රජා මූල සංවිධානය | 189 | වියළි කාලයේ ජලය හිඟ විට පානීය ජල ප්‍රමිතීන් ඉක්මවා යාම |
| 02 | අංක 142 කිරිමැටියාව | උදය ප්‍රජා මූල සංවිධානය | 140 | 1. ජල හිඟය<br>2. ජල නල, මාර්ගයට ලංව දමා තිබීම.<br>3. වැට අබලන් වී තිබීම (ළිඳ අසල) |
| 03 | අංක 144 පයිලිගම | සිසිල ප්‍රජා මූල සංවිධානය | 120 | පානයට සුදුසු තත්වයේ ජලය හිඟකම |
| 04 | අංක 174 බොරවැව | සිසිලස ප්‍රජා මූල සංවිධානය | 156 | ප්‍රමාණවත් පරිදි ජලය නොමැති වීම. |
| 05 | අංක 155 සේරුගොඩ | පරාක්‍රම ප්‍රජා මූල සංවිධානය | 209 | මෝටරය අක්‍රිය වීම<br>ජලය ගබඩා කරන ටැංකිය ප්‍රමාණවත් නොවීම |
| 06 | අංක 175 බක්මීවැව | නවෝදය ප්‍රජා මූල සංවිධානය | 110 | 1. ළිඳේ වතුර ප්‍රමාණවත් නොවීම.<br>ජලය පානයට සුදුසු නොවීම |
| 07 | අංක 133 හිතෝකඩවල | මහින්ද රාජපක්ෂ ප්‍රජා මූල සංවිධානය | 181 | ඉල්ලුමට අනුව ජලය සැපයීමට නොහැකි වීම. |
| | | | | ගබඩා ටැංකියේ සිට ජල නල මාර්ගයේ ජලය රැගෙන යනවිට උස්බිම්වල ඇති නිවෙස් 15කට ආසන්න ප්‍රමාණයකට ජලය දීමේදී දුෂ්කරතාවයන් ඇති වීම. |
| 08 | අංක 213 තලගල්ල | රුවන්තර ප්‍රජා මූල සංවිධානය | 144 | සාමාජිකයින්ගේ අවශ්‍යතාවයට සරිලන ප්‍රමාණවත් ජලය, ජල මූලාශ්‍රවල නොමැති වීම. |
| 09 | අංක 210 තලම්බුව | එකමුතු ප්‍රජා මූල සංවිධානය | 177 | ජල හිඟය |
| 10 | අංක 177 මහදිවුල්වැව | අමා දිය දහර ප්‍රජා මූල සංවිධානය | 170 | 1. ජලයේ ඇති කිවුල් ගතිය නිසා බීමට නුසුදුසු වීම.<br>2. දැඩි නියඟය පැමිණෙන විට ප්‍රමාණවත් ජලය නොමැතිවීම. |

| | | | |
|---|---|---|---|
| අංක 153 තුඹුල්ලේගම | කුඹුල්ලේගම ප්‍රජා මූල සංවිධානය | 55 | ළිඳ බැඳ ඇති අතර, ඉතිරි වැඩ කොටස් අවසන් කිරීමට නොහැකි වීම. |
| අංක 184 බැලුංගල | නිල් දිය දහර ප්‍රජා මූල සංවිධානය | 20 | ළිඳට ආවරණයක් නොමැති වීම. |
| අංක 164 හීනුග්ගල | සෞභාග්‍යා ප්‍රජා මූල සංවිධානය | 202 | 1. ළිඳට ආවරණයක් නොමැතිවීම.<br>2. ජල පොම්පාගාරය වටා ආරක්ෂිත වැටක් නොමැති වීම. |
| අංක 203 කුඹුක්වැව | පිනිබිඳු ප්‍රජා මූල සංවිධානය | 146 | නියං කාලය ජල හිඟය |
| අංක 185 අමුණුගම | රන් දිය දහර ප්‍රජා මූල සංවිධානය | 84 | 1. විදුලිය ලබාගැනීම<br>2. ජල හිඟකම |
| අංක176 රනෝරුව | සිය ශක්ති ප්‍රජා මූල සංවිධානය | 104 | බීමට නුසුදුස පානීය ජලය |
| අංක 173 පලාපත්වල | මිණුමුතු ප්‍රජා මූල සංවිධානය | 101 | ජලය ප්‍රමාණවත් නොවීම |
| අංක 218 මිරිහන්පිටිගම | රන්දියවර ප්‍රජා මූල සංවිධානය | 96 | විදුලි මෝටර් දෙකක අවශ්‍යතාවය<br>ටැංකි සහ නල පද්ධති සඳහා මීටර් නොමැති වීම. |
| අංක 160 ලියනගම | සමූහ ශක්ති ප්‍රජා මූල සංවිධානය | 164 | ජල නල නොමැති වීම |
| අංක 134 කොන්වැව | දිරිය දනව් ප්‍රජා මූල සංවිධානය | 226 | |
| අංක 172 කුඹුක්වැව | හඳුන්ගිරි ප්‍රජා මූල සංවිධානය | 105 | |
| අංක 187 අබකොල වැව දකුණු | ශක්ති ප්‍රජා මූල සංවිධානය | 32 | |
| අංක 228 දම්පිටිය | රන්දිය දහර ප්‍රජා මූල සංවිධානය | 85 | |
| අංක 182 කාසිකොටේ නැගෙනහිර | දිදුල පානීය ප්‍රජා මූල සංවිධානය | 72 | |
| අංක 183 කාසිකොටේ බටහිර | දිනුදා ප්‍රජා මූල සංවිධානය | 98 | |
| අංක 163 කැත්තපහුව | ළිහිණි ප්‍රජා මූල සංවිධානය | 277 | |
| අංක 186 අබකොල වැව | රන්දිය දහර ප්‍රජා මූල සංවිධානය | 85 | |
| අංක 153 තුඹුල්ලේගම | තුඹුල්ලේගම දහර ප්‍රජා මූල සංවිධානය | | ටැංකියක්, මෝටරයක්, විදුලිය, බට ලයින් අවශ්‍යතාව ඇත |
| අංක 138 ඉහළගම | ගැමි සිසිලවිල ප්‍රජා මූල සංවිධානය | | ජල නල එලීමට හා විදුලිය ලබා ගැනීම. |

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | ප්‍රජා මූල සංවිධානයේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුහුණ දී ඇති ගැටළුව |
|---|---|---|---|---|
| 30 | අංක 212 හීනුක්වැව | නිල්දියවර ප්‍රජා මූල සංවිධානය | 72 | ළිඳ බැඳ ඇති අතර, ඉතිරි වැඩ කොටස් අවසන් කිරීමට නොහැකි වීම. |
| 31 | අංක 161 උඩුවේරිය | මිහිලිය ප්‍රජා මූල සංවිධානය | | |
| 32 | අංක 184 බැලුංගල | ගෝඨාභය නිල් දිය දහර ප්‍රජා මූල සංවිධානය | 24 | |
| 33 | අංක 192 දැතව | මහින්ද රජපක්ෂ ප්‍රජා මූල සංවිධානය | | |
| 34 | අංක 180 වරාගම්මන | වරාගම්මන එක්සත් | 187 | නියං කාලයට ජල හිඟය |
| 35 | අංක 178 උඩදිවුල්වැව | නිල් දිය දහර ප්‍රජා මූල සංවිධානය | 195 | නියං කාලයට ජල හිඟය |
| 36 | අංක 179 ඇල්ලබඩගම | සයුරි ප්‍රජා මූල සංවිධානය | 143 | |
| 37 | අංක 199 බලල්ල | ගුරුගේගම ජල ව්‍යාපෘතිය | 110 | නියං කාලයට ජල හිඟය |
| 38 | අංක 225 මැදගම | පරාක්‍රම ප්‍රජා මූල සංවිධානය | 127 | නියං කාලයට ජල හිඟය |
| 39 | අංක 168 තම්මිටගම | සිසලඹ ප්‍රජා මූල සංවිධානය | 127 | |

මූලාශ්‍රය : මහව ප්‍රාදේශීය සභාව - 2017

ප්‍රදේශය පුරා මෙලෙස ප්‍රජාමූල ජල ව්‍යාපෘති ව්‍යාප්තව තිබුනත් කාලීන ජල හිඟයක් පවතී.

## 5.3.2. දුර්වලතා

**i. අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉතා දුර්වල මට්ටමක පැවතීම.**

පවත්නා අභ්‍යන්තර මාර්ග වැඩි ප්‍රමාණයක් නිසි පරිදි නඩත්තු නොකිරීම, පැති කාණු නොමැතිවීම, මාර්ග එකිනෙකට සම්බන්ධ නොවීම ආදිය දැක්විය හැක.

*වගු අංක **5.8** මාර්ග ස්වභාවය*

| ප්‍රමුඛතා මට්ටම | මාර්ග සංඛ්‍යාව | මාර්ග ස්වභාවය | මාර්ග සංඛ්‍යාව |
|---|---|---|---|
| ඉහල ප්‍රමුඛතාව | 70 (20%) | පස් | 135 (35%) |
| මධ්‍යස්ථ ප්‍රමුඛතාව | 234 (60%) | බොරලු | 189 (50%) |
| අඩු ප්‍රමුඛතාව | 81 (20%) | කොන්ක්‍රීට් | 27 (7%) |
| | | තාර | 35 (8%) |

මූලාශ්‍රය : මහව ප්‍රාදේශීය සභාව- මාර්ග පද්ධතිය පිළිබඳව විස්තරාත්මක ලේඛණය

මේ අනුව ප්‍රාදේශීය සභා සීමාව තුල සංවර්ධනය කළ යුතු මාර්ග සංඛ්‍යාව 85%කි.

## ii. ප්‍රධාන මාර්ගය හරහා දුම්රිය මාර්ග පිහිටා තිබීම නිසා ඇතිවන රථවාහන තදබදය

මඩගල්ල, නිකවැරටිය මාර්ගය හරහා මහව නගර මධ්‍ය කේන්ද්‍ර කොටගෙන මහව දුම්රිය මංසන්ධිය මාර්ගය පිහිටා තිබීම හේතුවෙන් දිනකට වාර 50ක් එනම් පැය 5ක් පමණ මඩගල්ල - නිකවැරටිය මාර්ගය වසා තැබීමට සිදුවේ.

*රූපය 5.13 දුම්රිය මාර්ග*




මූලාශ්‍රය : Google Earth-2017

**iii.අනුරාධපුර - කුරුණෑගල ප්‍රධාන මාර්ගය මහව නගරයට පිටතින් දළදාගම මංසන්ධියේ පිහිටා තිබීම නිසා මහව නගරයේ සංවර්ධනය නගරයෙන් පිටතට ඇදී යාම.**

*රූපය 5.14 ප්‍රධාන මාර්ගය මහව නගරයට පිටතින් දළදාගම මංසන්ධියේ පිහිටා තිබීම*




මූලාශ්‍රය : Google Earth-2017

***සිතියම් අංක 5.6 මහව නගරය තුළ සංවර්ධන සම්පීඩනය (Development Pressure Analysis)***




මහව නගරය තුළ සංවර්ධන සම්පීඩනය, ඉහළ අගයක් ගන්නා අතර ඊට සාපේක්ෂව දළදාගම හන්දිය හා ඊට ආසන්න ප්‍රදේශයේද, සංවර්ධන සම්පීඩනයක් පෙන්නුම් කරයි.

### iii. ජල පහසුකම් ප්‍රමාණවත් නොවීම.

ජල සම්පාදන මණ්ඩලය මගින් මහව නගරය හා ආශ්‍රිත ප්‍රදේශයට පමණක් ජල සම්පාදනය කරන අතර කාලීන අවශ්‍යතාවය අනුව පානීය ජල අවශ්‍යතාවයද සපුරාලීම ගැටලුවක් බවට පත්වී ඇත.

ප්‍රදේශයේ පවතින උග්‍ර ජල ගැටළුව සම්බන්ධයෙන් සඳහන් කිරීමේදී මහව ප්‍රදේශයට ප්‍රධාන ජල මූලාශ්‍රයක් නොමැතිවීම මෙන්ම ප්‍රදේශයේ පවතින වියලි කාලගුණික තත්වය හේතු වී ඇත. ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතාවයෙන් 56% ක් පමණ සපුරාලිමට ජාතික ජල සම්පාදන මණ්ඩලයට හැකි වී ඇති බැවින් ඉතිරිව 44% ක් ජල අවශයතාවය සපුරාලීම අවශ්‍යතාවය මූලිකව හඳුනා ගෙන ඇත.

ජල හිඟ පවතින ග්‍රාම නිලධාරී වසම්

- කෝන්වැව
- ලියනගම
- උදාගම
- ඇඹෝගම
- තිස්නම්පලගම
- විලව
- තලම්බුව

කාලීන ජල හිඟයෙන් පීඩා විඳින ජන සංඛ්‍යාව මුළු ජන සංඛ්‍යාවෙන් 95 % ක් පමණ වේ.

***සිතියම් අංක 5.7 ජල හිඟ පවතින ග්‍රාම නිලධාරී වසම්***




මූලාශ්‍රය :මහජන අදහස් ලබාගැනීමේ රැස්වීම 2017

## 5.3.3. අවස්ථා

### i. දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය

**අරමුණ :**

මහව,පොල්පිතිගම යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල 90,800 පමණ ජන සංඛ්‍යාවක් සඳහා පිරිසිදු පානීය ජලය ලබාදීම හා එමගින් ප්‍රදේශයේ පැතිර පවත්නා වකුගඩු රෝගය පාලනය කර ගැනීම.

**ව්‍යාපෘතියේ අංග :**

**ජල මූලාශ්‍ර** - දැදුරු ඔය ජලාශයේ වම් ඉවුරේ බෙදා හැරීමේ ඇල (කටුවාන)

**ජල පවිත්‍රාගාරය** - දිනකට ඝන මීටර් 15,000ක ධාරිතාවයෙන් යුක්ත වේ. (පොතු වැව)

**ජල ටැංකි** - මහව (ඝන මීටර් 1000)

- නාගොල්ලාගම

  කඩම්බා, වෙහෙරගල විහාර භූමිය (ඝන මීටර් 750 ටැංකිය හා පොම්පාගාරය)

- පොල්පිතිගම, නාගොල්ල පුරාණ විහාරයට අයත් භූමිය (ඝන මීටර් 1500)

පොම්පීකරණ නල පද්ධතිය - කි.මී. 64

බෙදාහැරීමේ පද්ධතිය - කි.මී. 266

ආවරණ ප්‍රදේශය - මහව සහ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 94 කි.

වැය වන මුදල - රුපියල් මිලියන 9800

- කොරියානු ණය ආධාර ඇමරිකානු ඩොලර් මිලියන 58.15
- ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන රුපියල් මිලියන 1326

දැනට ක්‍රියාත්මක වන දැදුරු ඔය පානීය ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් වර්ෂ 2020 දී නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයට පානීය ජල සැපයුම ලබාදීමට යෝජිත වේ.

මහව නගර සංවර්ධන සැලැස්මේ අරමුණු සාක්ශාත් කිරීමේදී බලපාන ශක්තීන්, දුර්වලතා,අවස්ථා හා තර්ජන විශ්ලේෂණය කිරීමෙන් පැහැදිලි වන්නේ මෙහි ශක්තීන් හා අවස්ථා උපයෝගී කර ගනිමින් දුර්වලතා හා තර්ජන මග හරවමින් මෙම නගරය කෘෂිකාර්මික වශයෙන් ආර්ථිකය ශක්තිමත් වූද සංචාරක ආකර්ශනීය ප්‍රදේශයක් ලෙසද යටිතල පහසුකම් සම්පූර්ණ වූද ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කළ හැකි බවයි.

# 6. සැලැස්ම (The Plan)

## 6.1 සංකල්පීය සැලැස්ම (Concept Plan)

මෙම සංකල්පීය සැලැස්ම මගින් මහව නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ 2030 වර්ෂය වන විට සිදුවිය යුතු සංවර්ධනය පිළිබඳව නිරූපනය කරනු ලබයි. මහව නාගරික බල ප්‍රදේශය ප්‍රධාන වශයෙන් අංශ තුනක් යටතේ සංවර්ධනය කළ හැකි අතර එනම්, නගර සංවර්ධනයට කෘෂිකාර්මික ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම, ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික වටිනාකම් උද්ධීපනය කිරීම තුලින් සේවා කටයුතු හා සංචාරක ආකර්ශන වර්ධනය කිරීම යන මූලික අරමුණු වලින් සමන්විත වේ.

දුම්රිය මංසන්ධිය කේන්ද්‍ර කොටගෙන විකාශනය වූ මහව නගරය ප්‍රදේශයේ ප්‍රධාන සේවා සපයන නගරයයි. අනුරාධපුර - පාදෙණිය මාර්ගය පුලුල් වීම හේතුවෙන් මහව නගරයට ආසන්නයේ දළදාගම ප්‍රදේශයේ උප නාගරික බල ප්‍රදේශයක් වශයෙන් සංවර්ධනය වෙමින් පවතී. එමෙන්ම ප්‍රධාන මාර්ගය ආශ්‍රිතව රේඛීය සංවර්ධනයක් දක්නට ලැබෙන අතර මෙම සැලැස්ම මගින් එම රේඛීය සංවර්ධනය විධිමත්ව හා සැලසුම් සහගතව සංවර්ධනය කිරීම අපේක්‍ෂා කෙරේ. නගරයේ පෝෂිත කලාපය සාරවත් කෘෂිකාර්මික කලාපයකි. මෙම කෘෂිකාර්මික කටයුතු තවදුරටත් ප්‍රවර්ධනය කිරීම මගින් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය යෝජනා හා සැලසුම් මෙම සැලැස්මේ අන්තර්ගත වී ඇත.

නගර සීමාවට ආසන්න මෙන්ම ප්‍රධාන මාර්ගයන්ට ආසන්න කලාපය ජනාකීර්ණ ජනාවාස ඉදිකිරීම් කලාපයක් ලෙස සංවර්ධනය වීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කළයුතු වේ. එමෙන්ම ජනාවාසකරණය වූ ප්‍රදේශයට ආසන්න කලාපය ප්‍රධාන වශයෙන් කෘෂි කර්මාන්තය සඳහා වෙන්වූ කලාපයක් ලෙස සංවර්ධනය කිරීමත් එමගින් මෙම ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථිකය වන කෘෂි කර්මාන්තය නගා සිටුවීමත් ඒ තුලින් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීමත් මෙහි අරමුණ වේ. මහව ප්‍රදේශයට ඓතිහාසික පුරාවිද්‍යාත්මක වටිනාකමක් ලබාදෙන ශ්‍රී ලංකාවේ 4 වන රාජධානිය වශයෙන් සැලකෙන යාපහුව ඇතුළු ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීමත් අවශ්‍ය අපරව්‍යුහ පහසුකම් සැපයීම මගින් එම ස්ථාන ඓතිහාසික හා සංස්කෘතික වටිනාකම ඔප් නංවමින් සංචාරක ආකර්ෂණයෙන් පෝෂණය වූ කලාපයක් ලෙස නගා සිටුවීමද මෙහිලා අරමුණ වේ.

ප්‍රධාන වශයෙන් මෙම ප්‍රදේශය කෘෂිකාර්මික වශයෙන් ස්වයංපෝෂිත කලාපයක් බවට පත්කිරීම මෙන්ම ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක කටයුතු ඔප්නංවමින් නාගරික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමත් මෙම සංකල්පීය සැලැස්ම හා සැසඳේ

## 6.1 සංකල්පීය සැලැස්ම (Concept Plan)

*රූපය 6.1 සංකල්පීය සැලැස්ම*




සැලැස්ම: වයඹ පළාත් කාර්යාලය - නාගරික සංවර්ධන අධිකාරිය

## 6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

මහව සැලසුම් බල ප්‍රදේශය අනාගතයේදී කෘෂිකාර්මික සේවා සපයන නගරයක් ලෙස සංවර්ධනය කිරීමේදී යේජිත ආර්ථික, පාරිසරික, සමාජීය හා අපරව්‍යුහ පාරිසරි පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගය සැලසුම හරහා ක්‍රියාවට නැංවීම නියමිත උපාය මාර්ගික ව්‍යාපෘති තුළින් බිහිවන නාගරික ආකෘතිය පිළිපිඹු වන යෝජිත භූමි පරිහරණ සැලැස්ම හරහා නිරූපනය වේ

මහව ප්‍රදේශය වැව් හා කෘෂි ඉඩම් වලින් සමන්විත පාරිසරික සංවේදී ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැක. ඒ අනුව මහව ප්‍රදේශයේ කෘෂි කාර්මාන්තය ආශ්‍රිතව පවතින භූමි සියල්ලම(මුළු භූමි පරිහරණයෙන් 44%) ආරක්ෂා වන පරිදි ඉදිරි නාගරික සංවර්ධන සැලැස්ම සකස් කොට ඇත. එමෙන්ම ජල රැඳවුම් ප්‍රදේශ සියල්ල (වැව් 310) සංරක්ෂණය කිරීමත් මෙහිදී ප්‍රධාන වන අතර වයඹ ඇළ ජල ව්‍යාපෘතිය මගින් මහව ප්‍රදේශයේ පවතින කෘෂිකාර්මික ඉඩම් සියල්ල සශ්‍රීක කිරීම තුළින් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීමද අරමුණු වේ

මෙසේ සිදුවන කෘෂිකාර්මික සංවර්ධනයත් සමග මහව දුම්රිය මංසන්ධිය කේන්ද්‍රකොටගෙන බිහිවී ඇති මහව නගරය අධි ඝණත්ව කලාපයක් ලෙස නේවාසික හා සංසරණ ජනගහනයට සේවා සපයන සංවර්ධනය වන අතර මහව නගරයට වයඹ දෙසින් කි.මී.4 දුරින් පිහිටා ඇති දළදාගම හන්දිය මධ්‍ය ඝණත්ව කලාපයක් ලෙස සංවර්ධනය කිරීම සිදු වේ. එහිදී දළදාගම හන්දිය මහව නගරයට සේවා සපයන උප නගරයක් ලෙස සංවර්ධනය කිරීම සිදු කරනු ලබයි. එසේම මෙම ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථිකය වන කෘෂි කර්මාන්තය නගා සිටුවීම උදෙසා නව ආර්ථික මධ්‍යස්ථානයක් නිර්මාණය වීමට අවශ්‍ය භෞතික සැලසුම් සැලසීමට යෝජනා කෙරේ.

*රූප සටහන 6.2.1. යෝජිත නාගරික ආකෘතිය 1 - හරස් පැතිකඩ - මහව මඩගල්ල මාර්ගය*



කර්මාන්ත ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය භෞතික පහසුකම් ලබාදීම සඳහා මිශ්‍ර සංවර්ධන කලාපය තුළ කර්මාන්ත කලාපයක් යෝජනා කිරීම මත කෘෂිකර්මාන්තය හා බැඳි කර්මාන්ත ව්‍යාප්ත කිරීමද යෝජිත භූමි සැලැස්මෙන් අරමුණු වේ.

වයඹ ඇළ ජල ව්‍යාපෘතිය මගින් මහව ප්‍රදේශයේ පවතින කෘෂිකාර්මික ඉඩම් සියල්ල සශ්‍රීක කිරීම තුළින් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීමද අරමුණු වේ.

*රූප සටහන 6.2.2. යෝජිත නාගරික ආකෘතිය 2 - හරස් පැතිකඩ - අනුරාධපුර මාර්ගය*



නිකවැරටිය - මඩගල්ල මාර්ගය දෙපසත්, අනුරාධපුර - කුරුණෑගල මාර්ගය දෙපසත් කලාපය මිශ්‍ර කලාපයක් ලෙස සංවර්ධනය කිරීමත් මෙම සැලැස්ම මගින් අරමුණු කරනු ලබන අතර අනිකුත් කලාප කෘෂිකර්මාන්තය හා බැඳි නේවාසික කලාපය ලෙස සංවර්ධනය කිරීම සිදුකරනු ලබයි.

*රූප සටහන 6.2.3. යෝජිත නාගරික ආකෘතිය 3 - නේවාසික කලාපය*



# 6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

***සිතියම් අංක 6.2.1*** ***යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම***



## 6.3 භෞතික හා සමාජයීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය උපාය මාර්ග

මහව ප්‍රදේශයේ භෞතික හා සමාජයීය අපරව්‍යුහ පහසුකම් පිළිබඳ සංවර්ධන උපාය මාර්ග සකස් කිරීමේදී සේවා සැලැස්මට ඇතුළත් වන නිවාස, සෞඛ්‍ය හා අධ්‍යාපනය වැනි සමාජයීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමට සාපේක්ෂව භෞතික අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදෙන ලදී. එහිදී විදුලි බල සැපයුම, කාණු පද්ධතිය, මළාපවාහන පද්ධතිය හා ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී එම අංශ වල දායකත්වය ප්‍රමාණාත්මක හා ගුණාත්මකව සතුටුදායක මට්ටමක පවතින බව නිගමනය කළ හැකිය. එමෙන්ම, ප්‍රදේශයේ පවතින ජල ගැටලුවට විසඳුමක් වශයෙන් දැදුරු ඔය ජලාශය මූලික කර ගනිමින් ක්‍රියාත්මක වන ජල සැපයුම් ව්‍යාපෘතිය මගින් වර්ෂ 2020 දී කලාපයේ ජල අවශ්‍යතාවය සපුරාලීමට සැලසුම් කර ඇත. ඒ අනුව මහව නගරයේ දී මාර්ග හා ගමනාගමන පහසුකම් සංවර්ධනය කිරීමට අදාල සංවර්ධන උපාය මාර්ග සකස් කරනු ලබයි.

### 6.3.1 සේවා සැලැස්ම

මහව නාගරික ප්‍රදේශය කෘෂිකාර්මික නගරයක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා වූ දැක්ම කරා ලඟාවීම සඳහාත් ඊට අදාලවූ අරමුණු සහ පරමාර්ථ කරා ලඟාවීම සඳහා නගරයේ සේවා සැලැස්ම සකස් කරන ලදී.

**නිවාස සැලැස්ම**

මහව නගරය කලාපයේ කෘෂිකාර්මික නගරයක් වශයෙන් සංවර්ධනය කිරීමේදී නාගරික ප්‍රදේශය තුල ජනගහනය වර්ධනය වීම පවත්නා මට්ටමින්ම පවත්වාගැනීමට අපේක්ෂිතය. එහිදී, වර්ෂ 2020 නිවාස 6843ක් දක්වා වර්ධනය වෙතැයි අපේක්ෂා කරයි. මෙම නිවාස සඳහා අඩු ඝනත්වයෙන් යුතු නේවාසික කලාපය, ඉතා අඩු ඝනත්වයෙන් යුත් නේවාසික කලාපය තුල වර්තමානයේ පර්චස් 40කට වඩා වැඩි ඉඩම් කොටස් තවදුරටත් සංවර්ධනය කිරීම තුලින් ලබාදීමට සැලසුම් කර ඇත.

තවද, නගරයට පදිංචිය සඳහා පැමිණීමට අපේක්ෂිත පුද්ගලයින් සඳහා රජය සතු දැනට කිසියම් භාවිතයකට නොගන්නා අක්කර 05ක් පමණ භූමියක් සංවර්ධනය සඳහා ලබාදීමට සැලසුම් කර ඇත. මහව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය තුල වර්ෂ 2030 දී අපේක්ෂිත නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පහත පරිදි වේ.

*වගු අංක 6.3.1.1 නිවාස සැලැස්ම*

| කලාපය | ජනගහනය 2017 | නිවාස ඒකක ගණන 2017 | අපේක්ෂිත ජනගහනය 2030 | අපේක්ෂිත නිවාස ඒකක ගණන 2030 | නේවාසික භූමි ප්‍රමාණය (Sqm) | නිවාස ඝනත්වය |
|---|---|---|---|---|---|---|
| ඉහළ සනත්වයෙන් යුතු නාගරික කලාපය (High Density Urban Cluster) | 2828 | 725 | 3175 | 814 | 1058729.238 | 2 |
| මධ්‍යම සනත්වයෙන් යුතු නාගරික කලාපය (Moderate density Urban Cluster) | 1010 | 259 | 1134 | 291 | 337807.2019 | 3 |
| අර්ධ සනත්වයෙන් යුතු මිශ්‍ර සංවර්ධන කලාපය (Moderate Density Semi Urban Cluster) | 3362 | 862 | 3775 | 968 | 1543878.477 | 2 |
| අඩු සනත්වයෙන් යුතු නේවාසික කලාපය (Low Density hinterland Cluster) | 8962 | 2298 | 10065 | 2581 | 7140949.079 | 1 |
| ඉතා අඩු සනත්වයෙන් යුතු නේවාසික කලාපය (Very Low Density hinterland Cluster) | 7605 | 1950 | 8540 | 2190 | 6796794.43 | 1 |
| පුරා විද්‍යා කලාපය (Archeological Zone) | | | | | | |
| **එකතුව** | **23767** | **6094** | **26690** | **6844** | **16878158sqm** | |

වයඹ පළාත් කාර්යාලය - නාගරික සංවර්ධන අධිකාරිය

***සිතියම් අංක 6.3.1 නිවස ඝණතව සැලැස්ම***




**නිවස ඝණතව සැලැස්ම- 2018-2030**
**මහව නාගරික සංවර්ධන බල ප්‍රදේශය**

*මූලාශ්‍රය :- නාගරික සංවර්ධන අධිකාරිය*

**නාගරික සංවර්ධන අධිකාරිය**
**වයඹ පළාත් කාර්යාලය**
**ජුනි 2018**

*සැලසුම් අංශය* | *මහව නාගරික සංවර්ධන සැලැස්ම (2018-2030)* | සැකසුම :- පී. පී ඩී. රාජපක්ෂ

**සෞඛ්‍ය පහසුකම්**

මහව නගරය අපරව්‍යුහ පහසුකම් පිළිබඳව සලකා බැලීමේදී සෞඛ්‍ය පහසුකම් ප්‍රධාන වශයෙන් රජයේ රෝහල (දිසා රෝහල) මගින් සපයනු ලබයි. එසේ වුවද රජයේ රෝහල පහසුකම් ඉතා අවම මට්ටමකින් පවතී. ඒ අනුව, මෙම රෝහල පවත්නා මට්ටමට වඩා ඉහල මට්ටකින් යුතු රෝහලක් ලෙස සංවර්ධනය කල යුතු බවට හඳුනාගෙන ඇත.

**අධ්‍යාපන සැලැස්ම**

නගර මධ්‍යයේ වූ ජාතික පාසල කලාපීය මට්ටමින් සේවා සපයන ජනප්‍රිය පාසලක් වේ. නාගරික ප්‍රදේශයේ අභ්‍යන්තර ප්‍රදේශවල පාසල් අවම පහසුකම් සහිතව පවතින අතර මේ හේතුවෙන් ජනගහනය එම ප්‍රදේශවල පදිංචි වීමේ ප්‍රවනතාවය ඉතා අඩු මට්ටමක පවතී. මේ අනුව අධ්‍යාපන පහසුකම් සැලැස්ම යටතේ නාගරික ප්‍රදේශයේ අභ්‍යන්තරික ප්‍රදේශ වල පාසල් සංවර්ධනය කිරීමේ උපාය මාර්ග හඳුනාගෙන ඇත.

මහව නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශයට අයත් පාසල් සංඛ්‍යාව 10ක් වන අතර එම පාසල් තුළින් අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව 7148 (2017 - ජනගහන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව) වන අතර ඉන් 4533ක සිසුන් සංඛ්‍යාවක් මහව නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය තුළම පදිංචිකරුවන් වේ. මෙම පාසල් තුළ සේවය කරනු ලබන ගුරුවරු සංඛ්‍යාව 356කි. 2030 වර්ෂය වන විට මෙම සිසුන් සංඛ්‍යාව 8,376 ක් වේ යැයි අපේක්ෂා කරනු ලබන අතර ඔවුන්ට අවශ්‍ය ප්‍රාථමික හා ද්වීතීය අධ්‍යාපන පහසුකම් ඇති කිරීම මෙම සැලසුම මගින් අපේක්ෂා කෙරේ.

ඒ අනුව, සිසු අවශ්‍යතාවයට අනුව පහත දක්වා ඇති පාසල් වල ගුණාත්මක භාවය මෙන්ම ගොඩනැගිලි ඉදිකරමින් ප්‍රමාණවත් පරිදි ඉඩකඩ ලබාදිය යුතු යැයි යෝජනා කරනු ලැබේ.

***වගු අංක 6.3.1.2 පාසල් පහසුකම්***

| | පාසල් | වැසිකිළි පහසුකම් සංවර්ධන කළ යුතුය | ජල පහසුකම් සංවර්ධන කළ යුතුය | නව ගොඩනැගිළි තත්වය සංවර්ධන කළ යුතුය. |
|---|---|---|---|---|
| 01 | විජයබා ජාතික පාසල | ✔ | | |
| 02 | යූ.බී. වන්නිනායක ම.වි. | | ✔ | ✔ |
| 03 | යාපහුව මා.වි. | ✔ | | ✔ |
| 04 | දළදාගම ප්‍රා. වි. | ✔ | | ✔ |
| 05 | ගුණපාල මලලසේකර ආදර්ශ ම.වි. | ✔ | | ✔ |
| 06 | උදාගම ප්‍රා. වි. | ✔ | | ✔ |
| 07 | උඩුවේ ක.වි. | ✔ | | ✔ |
| 08 | යාපහුව රාජකීය විද්‍යාලය | ✔ | | ✔ |

| | | | | |
|---|---|---|---|---|
| 09 | තිස්නම්පලගම ප්‍රා .වි. | ✔ | | ✔ |
| 10 | අල් මදීනා මුස්ලිම් ම.වි. | ✔ | | ✔ |

මූලාශ්‍රය : මහව ප්‍රාදේශීය සභාව-2017

එමෙන්ම ප්‍රදේශයේ පාසල් හැර ගිය තරුණ පිරිස සඳහා අවශ්‍ය තෘතිය අධ්‍යාපනය ලබාදීම උදෙසා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමද මෙම සේවා සැලැස්ම යටතේ අරමුණු කෙරේ. මෙහිදී ලබාදෙන ප්‍රධාන වෘත්තීය පුහුණුව කෘෂි කාර්මාන්තය ප්‍රධාන කරගත්තක් වීම සුවිශේෂී වේ. මහව නගරය ආශ්‍රිතව, ප්‍රදේශයේ ශිෂ්‍යයන් සඳහා තෘතීය අධ්‍යාපනය ලබාගැනීමට වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් නොමැති වීමද, වාර්ෂිකව පාසල් හැර යන (අ.පො.ස. සමත් නොවූ) ශිෂ්‍ය සංඛ්‍යාවට තෘතීය අධ්‍යාපන පහසුකම් ලබාදීම මෙහිලා අරමුණු වේ. (ඇමුණුම් අංක 14)

***සිතියම් අංක 6.3.2.      අධ්‍යාපන සැලැස්ම***



### 6.3.2 මාර්ග හා ගමනාගමන සැලැස්ම

මහව නාගරික ප්‍රදේශයේ කාර්යක්ෂම සුරක්ෂිත හා සැලසුම් සහගත මාර්ග පද්ධතියක් ඇති කිරීමද 2030 මහව නාගරික සැලැස්මේ පරමාර්ථයක් වේ. මහව නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය තුළ අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉතා දුර්වල මට්ටමක පවතී. එසේම නගරයේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා කඩිනමින් සංවර්ධනය කළ යුතු යැයි හඳුනාගත් පහත දක්වා ඇති මාර්ග 06ක් වන අතර සංවර්ධනය කළයුතු දුර ප්‍රමාණය කි.මී. 30ක් වේ. ඒ අනුව,

**උපක්‍රමය 01.**

1. රැකෝගම සහ කොන්ඩදෙණිය මාර්ග ඒකාබද්ධව සංවර්ධනය කිරීම (පුරාවිද්‍යාත්මක ස්ථාන සඳහා ප්‍රවේශ වීමට අවශ්‍ය මාර්ග පද්ධතිය දියුණු කිරීම)

පැරණි යාපහුව රාජධානිය මහව ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක ඓතිහාසික හා සංචාරක ආකර්ශනය ගොඩනගන ප්‍රධාන අංගය වේ. එමෙන්ම කොන්ඩදෙණිය ඓතිහාසික සොහොන්කොත් පිහිටි ස්ථානයට සංචාරක ආකර්ශනය ලත් ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය පසුබිම් සකස් කිරීම උදෙසාත් මෙම මාර්ගය පුළුල්කොට සංවර්ධනය කළ යුතුය.

යාපහුව ප්‍රදේශයේ යෝජිත සංචාරක ප්‍රවර්ධනය ව්‍යාපෘතියට ප්‍රවේශය ලබා දීමද මෙහි එක් අරමුණකි. මේ අනුව, යාපහුව ප්‍රදේශයේ සිට රැකෝගම මංසන්ධිය දක්වා විහිදෙන මාර්ගයේ කි.මී.9 ක ප්‍රමාණයක් සංවර්ධනය කිරීම් කළ යුතුය.

**උපක්‍රමය 02.**

2030 මහව සංවර්ධනය සැලැස්මේ දත්ත විග්‍රහයට අනුව අභ්‍යන්තර මාර්ග පද්ධතියේ 85%ක ප්‍රමාණයක් සංවර්ධනය කළ යුතු බව හඳුනාගන්නා ලදී. එහිදී කඩිනමින් සංවර්ධනය කළ යුතු යැයි හඳුනාගන්නා ලද මාර්ග සංවර්ධනය කරමින් ප්‍රදේශයේ ජනාවාස වලට පහසු හා සුරක්ෂිත ප්‍රවේශයක් ලබා දීමත් එමගින් අභ්‍යන්තර ප්‍රදේශ තවදුරටත් සංවර්ධනය කිරීමත් මෙහිදී සැලසුම් කරනු ලැබේ.

2. විලව මාර්ගය නිකවැරටිය මාර්ගය දක්වා පුළුල් කිරීම (අභ්‍යන්තර ප්‍රදේශ සංවර්ධනය සහ කර්මාන්ත කලාපයට මනා ප්‍රවේශකත්වයක් ලබාදීම)
3. ලීලා මාවත, නිකවැරටිය මාර්ගය හමුවන තම්මිටගම හන්දිය දක්වා පුළුල් කිරීම.(නගරයේ අභ්‍යන්තර ප්‍රදේශ සංවර්ධනය කිරීම)
4. ගම්මැද මාර්ගය විලව මාර්ගය දක්වා යා කිරීම.
5. නව බස් නැවතුම්පල හා ප්‍රධාන මාර්ගය යා කරමින් පවත්නා මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීම.

2030 වර්ෂය වන විට නාගරික සංවර්ධන කටයුතු තව දුරටත් ව්‍යාප්ත කිරීමටත් යෝජිත වාණිජ කටයුතු සඳහා අවශ්‍ය භූමිය සඳහා ප්‍රවේශය ලබාදීම උදෙසාත් මෙම මාර්ගය සංවර්ධනය කළ යුතු යැයි සැලසුම් කරන ලදී.

6. අලුත් හේරත්ගම මාර්ගය ලියනගම දක්වා පුළුල් කිරීම

**උපක්‍රමය 03.**

7. දුම්රිය මාර්ගය හරහා ගුවන් පාලම ඉදිකිරීම.

මහව මන්සන්ධිය දුම්රිය හරස් මාර්ගය හේතුවෙන් දිනකට 50 වතාවක් මහව නගර මධ්‍යයෙන් මහව - මොරගොල්ලගම මාර්ගය වසා තබනු ලබයි. එය දිනකට පැය 05ක් පමණ වන අතර එහිදී සිදුවන ප්‍රමාදය හා රථ වාහන තදබදය අවම කිරීම උදෙසා මෙම උපාය මාර්ගය සැලසුම් කරනු ලැබේ. එහිදී සුගම සුරක්ෂිත හා කාර්යශූර ප්‍රවාහන ක්‍රමයක් ස්ථාපනය කිරීම අරමුණු කරනු ලබයි.

**උපක්‍රමය 04.**

8. පොදු රථ වාහන නැවතුම්පල ඉදිකිරීම (දුම්රිය ස්ථාන අසල දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම)

මහව නගරය තුළ වර්ථමානයට අවශ්‍ය පරිදි රථවාහන නැවතුම් සඳහා ඉඩකඩ වෙන්වී ඇති අතර මේ සඳහා 2030 වර්ෂය සඳහා අවශ්‍ය වන භූමිය වෙන් කිරීම මෙහිදී සිදුකරනු ලබයි. මෙහිදී පොදු රථවාහන නැවතීම සහ අවශ්‍ය පහසුකම් සැලසීම මෙහිලා ප්‍රමුඛ වේ.

ඊට අමතරව මහව නාගරික සීමාව තුළ ගැටළුවක්ව පවතින පොදු රථවාහන නවතාලීමට අවශ්‍ය ඉඩකඩ සැපයීමද මෙහිලා අරමුණු වේ.

***සිතියම් අංක 6.3.2.1 මාර්ග හා ගමනාගමන සැලැස්ම***



### 6.3.3 ජල සම්පාදනය

මහව නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ පවතින තවත් උග්‍ර ගැටළුවක් වනුයේ පානීය ජල හිඟයයි. 2030 මහව නගර සංවර්ධන සැලැස්මට අනුව, ජල සම්පාදන මණ්ඩලය හා සමගාමීව මේ ගැටලුව විසඳීම උදෙසා කටයුතු කිරීම සිදුකරනු ලැබේ. මහව නාගරික බල ප්‍රදේශය තුල වර්ථමාන ජල සැපයුම පහත පරිද වේ.

*වගු අංක **6.3.3.1** ජල සැපයුම **- 2017***

| | |
|---|---|
| ජල සම්පාදන මණ්ඩලය | 3000 කියුබික් මීටර්(3,000,000L) |
| ප්‍රජා මූල ව්‍යාපෘති | 315,000L |
| පුද්ගලික ළිං, නල ළිං | 100,000L |
| **මුළු ජල සැපයුම (වර්ථමාන)** | **3,415,000L** |

මූලාශ්‍රය : මහව ප්‍රාදේශීය සභාව-2017

*වගු අංක **7.3.3.2** ජල පරිභෝජන අවශ්‍යතාව*

සැලැස්ම: වයඹ පළාත් කාර්යාලය - නාගරික සංවර්ධන අධිකාරිය-2017

| වර්ෂ | **2017** | **2030** |
|---|---|---|
| ජනගහනය (150L per person) | 23767 | 26690 |
| ජනගහන ජල පරිභෝජනය | 3,565,050L | **4,003,500L** |
| වාණිජ ඒකක සඳහා ජල පරිභෝජනය<br>( වාණිජ ඒකක සඳහා-500L)<br>(ආපන ශාලා සඳහා-1000L) | 271,400L | **407,100L (50%කින් වාණිජ ඒකක සඳහා ජල පරිභෝජනය වැඩි වේ යැයි උපකල්පනය කෙරේ)** |
| රාජ්‍ය ආයතන සඳහා ජල පරිභෝජනය<br>(පාසල් සිසුවෙකුට-45L)<br>( රාජ්‍ය ආයතන සඳහා-45,000) | 270,000L | **297,000L (10%කින් රාජ්‍ය ආයතන සඳහා ජල පරිභෝජනය වැඩි වේ යැයි උපකල්පනය කෙරේ)** |
| **මුළු ජල පරිභෝජන අවශ්‍යතාව** | **4,106,450L** | **4,707,600L** |

මහව ප්‍රදේශයට උග්‍ර ගැටළුවක්ව පවතින කාලීන පානීය ජල අවශ්‍යතාවයට පිළියම් යෙදීම අරමුණු කරගෙන දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ජල ව්‍යාපෘතිය මගින් මහව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය ඇතුළුව මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටම ජල සම්පාදනයට අවශ්‍ය කටයුතු සම්පාදනය කොට ඇත. මෙහිදී ජලය බෙදා දීමේ නල පද්ධතිය කි.මී. 260ක් පුරා පැතිරී පවතින අතර දිනකට බෙදා හැරීමට නියමිත ජල ධාරිතාවය 15,000m3 (15,000,000L) කි.

*රූපය 6.3.3.1 යෝජිත ජල සැපයුම් සිතියම*




මූලාශ්‍රය මහව ප්‍රාදේශීය සභාව-201

### 6.3.4 විදුලි සැපයුම

වර්තමානය වන විටත් මහව නාගරික බල ප්‍රදේශයට විදුලි සැපයුම ප්‍රමාණවත් පරිදි සිදුවන අතර, අනාගත විදුලි බල ඉල්ලුමට සපුරාලීම සඳහා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින නිකවැරටිය මාර්ගයේ විදුලි උප ග්‍රිඩ් පොළ හා ඒ අසළ යෝජිත සූර්ය බල ශක්ති ( 33kv ) ව්‍යාපෘතිය මගින් කටයුතු කරනු ලබයි.

### 6.3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

මෙම ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සැලකීමේදී තහවුරු වන්නේ, මහව නගරාසන්න ප්‍රදේශයේ හා අවට දළදාගම උප නාගරික ප්‍රදේශය හා අවට පමණක් ප්‍රාදේශීය සභාවේ දායකත්වයෙන් අපද්‍රව්‍ය කළමනාකරණය කරනු ලබන බවයි. වර්තමානයේ අනෙකුත් ප්‍රදේශ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පෞද්ගලික මට්ටමින් කරගෙන යනු ලබයි.

මෙම ප්‍රදේශයේ වර්තමානය වන විට නිකුත් කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය කිලෝග්‍රෑම් 2000 වන අතර එය 2030 වර්ෂය වන විට එය 20% කින් වැඩි වේ යැයි අපේක්ෂා කරනු ලබයි.

වර්තමානය වන විටත් මහව, සියෝදාගම ප්‍රදේශයේ අක්කර දෙකක භූමි ප්‍රදේශයක් තුළ මහව ප්‍රදේශයෙන් ඉවත් කල ඝන අපද්‍රව්‍ය කොම්පෝස්ට් පොහොර බවට පත්කරනු ලබන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබයි.

එහිදී, නිපදවනු ලබන කොම්පෝස්ට් පොහොර ප්‍රදේශයේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා යොදා ගැනීමද මෙම උපාය මාර්ග යටතේ අරමුණු කෙරේ.

***සිතියම් අංක 6.3.3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම***



## 6.4 ආර්ථික සංවර්ධන උපාය මාර්ග

### 6.4.1 කෘෂි කාර්මික හා ආර්ථික සංවර්ධන උපාය මාර්ග

කෘෂිකර්මාන්තය මහව ප්‍රධාන ආර්ථික මූලාශ්‍රය වේ. මුළු භූමි ප්‍රමාණයෙන් 42% ක භූමි ප්‍රමාණය කෘෂිකර්මාන්තය සඳහා වෙන්වී ඇති අතර එම සියළු භූමි සශ්‍රීක කිරීම තුළින් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීම මහව නගර සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අරමුණ වේ. 2030 මහව නගර සංවර්ධන සැලැස්මේ දැක්ම වනුයේ කෘෂි ගොවිපළ රාජධානිය යන්නයි. එහිදී කෘෂි ගොවිපළ යන්නෙන් මහව ප්‍රදේශයේ ශක්තිමත් කෘෂි ආර්ථිකයක් ගොඩනැංවීම යන්න අර්ථවත් වේ.

මෙම ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය (කුඹුරු ඉඩම්) ශක්තිමත් කිරීමෙහිලා පවතින ප්‍රධාන ගැටලුව වන්නේ ක්‍රමවත් වාරිමාර්ග පද්ධතියක් නොමැති වීමය. එහිදී 2022 වන විට නිම කිරීමට යෝජිත “වයඹට ජලය“ යන මොරගහකන්ද වාරිමාර්ග ව්‍යාප්තියෙන් දායකත්වයෙන් මෙම ගැටලුව සමතයකට පත් කිරීමට නියමිතය.

වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය තුළ කුඹුරු අක්කර 4942.12ක් භූමි ප්‍රමාණයක් පැවතියද, පවතින ජල හිඟය මත යල කන්නය තුළ වගා කරනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය 2,866.43ක් පමණි. මහ කන්නයේදී එය 1,581,48කි. එහිදී වාර්ෂිකව ලැබෙන අස්වනු ප්‍රමාණය දළ වශයෙන් වී බුසල් 355,832.8කි. (ටොන් 10,674.984 )

වයඹ ඇල ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් මහව ප්‍රදේශයේ සියලුම ජල රැඳවුම් ප්‍රදේශ තුලට 2022 වන විට ජලය සැපයීමට යෝජිතව පවතී. ඒ අනුව, මහව නාගරික බල ප්‍රදේශය තුල පවතින කුඹුරු ඉඩම් සියල්ලම කන්න දෙක යටතේම වගා කිරීමට අපේක්ෂිත අතර එහිදී අස්වැන්න වී බුසල් 790,739.2ක් අපේක්ෂිතය. (ටොන් 23,422.18) (ඇමුණුම් අංක 02 බලන්න)

මෙම ප්‍රදේශයේ කුඹුරු වගාව හැරුණුකොට පළතුරු, එළවළු හා ධාන්‍ය වර්ග වගාවද සිදුකරනු ලබයි. විශේෂයෙන්ම අඹ, කජු, පැපොල්, මුං, කව්පි වැනි වගාවන් සිදුකරනු ලබන භූමි තවදුරටත් සශ්‍රීක කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණික දැනුම හා උපාංග ලබාදීමට අවශ්‍ය පහසුකම් සැපයීමද 2030 මහව නගර සංවර්ධන සැලැස්ම යටතේ සිදුකරනු ලබයි.

එහිදී, මහව සියොදාගම ප්‍රදේශයේ පිහිටි කසල ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන ස්ථානයකට යාබද අක්කර 2 ක ප්‍රමාණයක් වූ භූමියක් කාබනික පොහොර භාවිතයෙන් වගා කටයුතු කරන භූමියක් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම්කොට ඇත. එහිදී ගොවීන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම හා අවබෝධය ලබාදීම ද සැලසුම් කරනු ලබයි.

එමෙන්ම, තෘතීය අධ්‍යාපනය හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම තුළින් කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමය ප්‍රදේශයට ලබාදීමද එමගින් මෙම ප්‍රදේශයට ගැටලුවක්ව පවතින රැකියා වියුක්තිය අවම කිරීමද සැලසුම් කොට ඇත.

එමෙන්ම, මෙම ප්‍රදේශයේ ගොවීන් මුහුණපාන තවත් ගැටළුවක් වන්නේ, කෘෂි අස්වැන්න අලෙවි කර ගැනීම සඳහා කෘෂි මධ්‍යස්ථානයක් නොමැති වීමයි. එහිදී ඔවුන් වර්තමානය වන විට තම අස්වැන්න අලෙවි කර ගැනීම උදෙසා දඹුල්ල, නිකවැරටිය හෝ කුරුණෑගල යන නගරයන් වෙත යායුතු අතර ඒ සඳහා විසඳුම් ලබාදීමද මෙම සංවර්ධන සැලැස්ම යටතේ යෝජිතය. එහිදී "ආර්ථික මධ්‍යස්ථානයක්" සඳහා ඉදිකිරීම සැලසුම් කොට ඇත.

මහව නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුල මුළු භූමි ප්‍රමාණයෙන් 0.7%ක් පමණ භූමි ප්‍රමාණයක් වාණිජ කලාපය ලෙස සංවර්ධනය වී ඇත. මෙම ප්‍රමාණය 1.5 % තවදුරටත් ව්‍යාප්ත කරමින් ප්‍රදේශයේ ජනතාව වෙත අවශ්‍ය වාණිජ හා සේවා ප්‍රවර්ධනය කිරීමත් දළදාගම හන්දිය මහව නගරය හා අනුබද්ධ වාණිජ හා සේවා සපයන උපනගරයක් වශයෙන් සංවර්ධනය කිරීමත් මෙම ආර්ථික සංවර්ධන සැලසුමේ ප්‍රධාන අරමුණ වේ. එමෙන්ම දළදාගම හන්දිය ආශ්‍රිතව සිදුවන වගා නොකළ කුඹුරු ඉඩම් තුල කරනු ලබන අනවසර ඉදිකිරීම සීමා කිරීම ද මෙයට ඇතුලත්ය.

1. යෝජිත කෘෂි නිශ්පාදන ආශ්‍රිත ආර්ථික මධ්‍යස්ථානය
2. යෝජිත වාණිජ - මූල්‍ය සංකීර්ණය
3. යෝජිත වාණිජ - මූල්‍ය සංකීර්ණය (දළදාගම මංසන්ධිය ආශ්‍රිතව)
4. පරිසර හිතකාමී ඒකාබද්ධ ගොවිපොල මධ්‍යස්ථානය
5. නගරය හරහා ගමන් කරන මගීන් සඳහා ගිමන් නිවන මධ්‍යස්ථානයන් සංවර්ධනය කිරීම.(යෝජිත හෙළ බොජුන්හල ව්‍යාපෘතිය (ප්‍රාදේශීය සභාව සතු ඉඩම) (අනුරාධපුර පාදෙනිය මාර්ගය)
6. යෝජිත සංස්කෘතික මධ්‍යස්ථානය ආශ්‍රිතව ගිමන් නිවන මධ්‍යස්ථානය
7. යෝජිත කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති (දැනට කර්මාන්ත කලාපයක් ලෙස සංවර්ධනය වෙමින් පවතින කලාපය නිකවැරටි - මඩගල්ල මාර්ගය විදුලි බල උප පොල ආශ්‍රිත

යෝජිත ව්‍යාපෘති වේ.

එමෙන්ම, යෝජිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයද ආර්ථික සංවර්ධන උපාය මාර්ගය යටතට ගැනෙන අතර එමගින් ප්‍රදේශයට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයන් පිරිසක් බිහි කිරීමද, එමගින් ප්‍රදේශයේ රැකියා ව්‍යුක්තියට විසඳුමක් ලබාදීමද අරමුණු වේ.

*සිතියම් අංක 6.4.1.1 කෘෂි කාර්මික හා ආර්ථික සංවර්ධන උපාය මාර්ග*



### 6.4.2 කර්මාන්ත සංවර්ධන සැලැස්ම

කෘෂිකර්මාන්තය මූලික ආර්ථික කර ගත් නගරයක් ලෙස මහව ප්‍රදේශය සංවර්ධනය කිරීමේදී කෘෂි කාර්මික නිශ්පාදන ආශ්‍රිතව කර්මාන්ත සංවර්ධනය අරමුණු කරගෙන විශේෂ කර්මාන්ත කලාපයක් හඳුන්වා දෙනු ලැබේ.

**සිතියම් අංක 6.4.2.1 කර්මාන්ත සංවර්ධන උපාය මාර්ග**



## 6.5 තිරසර පරිසර උපායමාර්ග

මහව නාගරික බල ප්‍රදේශය සඳහා සකස් කරන සංවර්ධන සැලැස්මට අන්තර්ග්‍රහනය කිරීම සඳහා මෙම පරිසර සැලැස්ම ඉදිරිපත් කරන අතර එය පහත සඳහන් සංඝටක වලින් සමන්විත වේ.

7.5.1 තෙත්බිම් සැලැස්ම.

7.5.2 පරිසර හා භූදර්ශණයන්ට අදාල කළමනාකරණ සැලස්ම.

7.5.3 ආපදා අවම කිරීමේ සැලැස්ම.

7.5.4 යෝජිත පොදු එළිමහන් විවෘත භූමි සැලැස්ම.

### 6.5.1 මහව නාගරික බල ප්‍රදේශය තුළ හඳුනාගත හැකි තෙත් බිම්

වසර පුරා හෝ වසරේ කිසියම් කාල සීමාවක් පුරා තෙත බරිතව පවතින බිම් ප්‍රදේශ "තෙත් බිමක්" ලෙස සරළව හැඳින්විය හැකිය. අන්තර්ජාතික රැම්සා සම්මුතියට අනුව, බාදිය මට්ටමේ සිට මීටර් 6 ට අඩු මුහුදු පෙදෙස් ඇතුළුව ගලායන හෝ නිශ්චලව පවතින්නා වූ මිරිදිය, කිවුල්දිය හෝ කරදියෙන් තාවකාලික හෝ ස්ථිරව යටවී පවතින කෘතිම හෝ ස්වභාවික වගුරු බිම්, විල්ලු, ජලාශ, ජල මාර්ග, හැල ඉඩම්, හා පීට් බිම් ආදිය තෙත්බිම් ලෙස හැඳින්වේ.

මහව නාගරික බල ප්‍රදේශය තුළ පාරිසරික වශයෙන් වැදගත් තෙත් බිම් ප්‍රදේශ රාශියක් පවතින අතර ඒවා ප්‍රධාන වශයෙන් කුඹුරු වගා බිම්,වැව් සහ ඇළ මාර්ග සිතියම් අංක 01 මඟින් දක්වා ඇත.

- කුඹුරු වගා බිම් එලෙසම පවත්වාගත යුතු ප්‍රදේශ ජල රැඳවුම් අවශ්‍යතාවයද සලකා බලා "විශේෂ කුඹුරු වගා කලාපය" ලෙස නම් කර ඇත. එහිදී අනුමත භාවිතයන් පහත පරිදි වේ.

    - කුඹුරු වගා කිරීම.
    - ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරනු ලබන අනෙකුත් භාවිතයන්.

- වැවෙහි පළල අනුව පවත්වා ගත යුතු ස්වාරක්ෂක කළාපය පවත්වා ගැනීම තුළින් වැව් වටා අක්‍රමවත් ගොඩනැඟිලි ඉදිකිරීම සහ අනවසර ඉදිකිරීම් වළක්වා ගැනීම සඳහා කටයුතු කළ හැකි අතර වැව් වලට ජලය සපයන ඇළ මාර්ග නිසිලෙස නඩත්තු කළ යුතුය.

➢ එල්ලංගා පද්ධති (cascade system) ක්‍රමයට පිහිටා ඇති දැනට පවතින වැව් පද්ධතීන් එලෙසම පවත්වා ගැනීමෙන් කෘෂි ආර්ථිකය නගා සිටුවීමත්, නියඟ තත්ත්වයන්හිදී සිදුවන හානි අවම කර ගැනීමටත් ප්‍රයෝජනවත් වේ.

***සිතියම් අංක 6.5.1 යෝජිත තෙත් බිම් කළමනාකරණ සැලැස්ම***



### 6.5.2 පරිසර හා භූ දර්ශණන්ට අදාල කළමනාකරණ සැලැස්ම

*වගු අංක 6.5.1 පරිසර හා භූ දර්ශණන්යන්ට අදාල කළමනාකරණ සැලසුම*

| | වර්ගය | භූ දර්ෂණය සඳහා යෝජිත විවෘත භූමියේ නම | ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|---|---|
| 1 | EMP 06 | ළමා උද්‍යානය (නව වෙළඳපල අසල) | 0.34 |
| 2 | ELP 01 | දිගන ක්‍රීඩාංගනය | 2.83 |
| 3 | ELP 02 | දළදාගම ක්‍රීඩාංගනය | 1.70 |
| 4 | EMP 02 | වලස්වැව ක්‍රීඩාංගනය | 0.40 |
| 5 | PMP 31 | විවෘත භූමිය- මූනමලේගම | 0.33 |
| 6 | PMP 03 | විවෘත භූමිය- ඉබුල්බොඩයාගම | 0.27 |

**උපාය මාර්ග**

- මෙම ප්‍රදේශයේ දැනට පවතින උද්‍යාන ඒ ආකාරයෙන්ම පවත්වාගත යුතු අතර අවශ්‍ය අවස්ථාවන්හිදී ඒවා ප්‍රතිසංවර්ධනය කිරීමේදී විධිමත් භූදර්ශණ සැලසුමක් සහිතව සිදු කළ යුතුය.

- යෝජිත පොදු එළිමහන් විවෘත භූමි සැලැස්මෙහි ඉදිරිපත් කර ඇති උද්‍යාන/ක්‍රීඩාංගන ඉදිකිරීමේදී විධිමත් භූදර්ශණ සැලසුමක් සහිතව සිදු කළ යුතුය.

### 6.5.3 ආපදා අවම කිරීමේ සැලැස්ම- 2030

මහව නාගරික බල ප්‍රදේශයට ප්‍රධාන ලෙස බල පවත්නා ස්වභාවික සහ අනෙකුත් ආපදා තත්ත්වයන් පහත පරිදි වේ.

i. නියඟය
ii. අලි මිනිස් ගැටුම

ආපදා තත්ත්වයන් පවතින ග්‍රාම නිළධාරී කොට්ඨාශ සිතියම් අංක 4.5.2 හි දක්වා ඇත.

### i. නියඟය

අධික නියඟ පවතින කාල වලදී මහව ප්‍රදේශයටආසන්න 2017 වසරේ පැවති නියඟ තත්ත්වය තදින් බලපාන ලද අතර පවුල් 3800 අයත් සාමාජිකයන් 8500 කට පමණ පානීයජලය බෙදාහැරීම සිදු කරන ලදී. 2017 දෙසැම්බර් වන විට එම ජල අවශ්‍යතාවය 1700 ක් දක්වා අඩුවී ඇත.

**යෝජනා :**

- එසේම ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ක්‍රියාත්මක කරන 2020 වැඩ නිම කිරීමට සැලසුම් කර ඇති ‘‘වයඹට ජලය’’ දැදුරු ඔය ව්‍යාපෘතිය කඩිනම් කිරීම නියං කාලසීමාවේදී පානීය ජලය බවුසර් මඟින් බෙදා දීමට වඩා දීර්ඝ කාලීන විසඳුමක් වේ.

### ii. අලි මිනිස් ගැටුම

2012 – 2017 වසර කාල සීමාව තුල අලි මිනිස් ගැටුම නිසාවෙන් ජීවිත හානි 6 ක් වාර්තා වී ඇති අතර නිවාස බිදීම් 10 – 15 වසරකට වාර්තා වී ඇත. ප්‍රදේශයේ ග්‍රාම නිළධාරී වසම් 27 කට මෙම අලි මිනිස් ගැටුම බලපා ඇත. ඒ අතරින් මහව නාගරික බල ප්‍රදේශයට අයත් නෙත්තිපලගම සහ විලව යන ග්‍රාම නිළධාරී වසම් ද අයත් වේ. වන අලින්ගේ පෝෂක ප්‍රදේශ විනාශ වීම සහ ගම්මාන ආශ්‍රිතව අලින් රුචිකත්වයක් දක්වන ආහාර බහුල වීම මෙයට හේතුවක් වී ඇත.

***සිතියම් අංක 6.5.2 යෝජිත ආපදා අවම කිරීමේ සැලැස්ම***




**උපාය මාර්ග:**

- යෝජිතව පැවති වයඹ අලි මිනිස් ගැටුම වැලැක්වීමේ වැඩපිළිවෙල නැවත විධිමත් ලෙස ආරම්භ කිරීම, විශේෂයෙන්ම අලි මිනිස් ගැටුම අවම කිරීමට විසඳුම් ක්‍රියාත්මක කිරීමේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වැනි අදාල ආයතන එක්ව කටයුතු කිරීම සාර්ථක ප්‍රතිඵල ඉක්මනින් ලබා ගැනීමට හේතු වේ.

- වෙනත් රටවල පවතින පරිදි විදුලි වැට වෙනුවට තල් ගස් සිටුවීම, අලි වැට ආශ්‍රිතව පිහිටි ගම්මාන අවට භූමි පරිභෝජන රටාව අලි ආකර්ෂණය නොවන වානිජ භෝග යොදා ගැනීම, ප්‍රජා මූලිකව මීමැසි පාලනය වැනි ස්වභාවික ක්‍රම ඔස්සේ වන අලින් ප්‍රදේශ ආක්‍රමණය කිරීම වලක්වාගත හැකි හෙයින් එවැනි ව්‍යාපෘති හඳුනාගැනීම සහ ක්‍රියාත්මක කිරීම මෙම ගැටළුව අවම කර ගැනීමට පිටුවහලක් වේ.

## 6.5.4. මහව නාගරික බල ප්‍රදේශයේ යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබද සැලැස්ම

සෑම පුද්ගලයෙකුගේම කායික මානසික වර්ධනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පොදු එළිමහන් විනෝද කටයුතු බෙහෙවින් වැදගත් වේ. එම නිසා නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන සැලසුම්

සැකසීමේදී පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම, සංවර්ධන සැලසුම් වලට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ඍජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන සංඝටක දෙකක් යටතේ විනෝද පහසුකම් සලකා බලනු ලැබේ. ඍජු විනෝද කටයුතු පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී විය හැකි ඉඩකඩ ප්‍රමාණයක් සලකා බලන අතර ඒ යටතේ

- ක්‍රීඩා කිරීම
- පිහිනීම
- දිවීම
- ඇවිදීම
- බෝට්ටු පැදීම
- සාම්ප්‍රදායික මසුන් ඇල්ලීම

නිදසුන් ලෙස දැක්විය හැක.

මහව නාගරික බල ප්‍රදේශයේ ඉහත අවශ්‍යතාවයන් සපුරාගත හැකි ස්ථාන කිහිපයක් පවතින අතර එම ස්ථාන පිළිබඳව විස්තර වගු අංක 02 යටතේ සදහන් කර ඇත.

*වගු අංක **6.5.2** මහව නාගරික බල ප්‍රදේශයේ ඍජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන*

| අනු අංකය | වර්ගය | විවෘත භූමියේ නම | ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|---|---|
| 01. | | **පොදු ක්‍රීඩාංගන** | |
| | ELP 01 | දිගන ක්‍රීඩාංගනය | 2.83 |
| | ELP 02 | දළදාගම ක්‍රීඩාංගනය | 1.70 |
| | EMP 01 | අත්වැල්ල ක්‍රීඩාංගනය | 0.42 |
| | EMP 02 | වලස්වැව ක්‍රීඩාංගනය | 0.40 |
| | EMP 03 | ලියනගම ක්‍රීඩාංගනය | 0.42 |

| | | | |
|---|---|---|---|
| | EMP 04 | උල්ලාලපොළ ක්‍රීඩාංගනය | 0.31 |
| | EPP 01 | තලම්බුව ක්‍රීඩාංගනය | 0.20 |
| | EPP 02 | තිස්ගම්පොළගම ක්‍රීඩාංගනය | 0.15 |
| 02. | | **ළමා උද්‍යාන** | |
| | EMP 05 | ළමා උද්‍යානය (නව වෙළඳපල අසල) | 0.34 |
| | | **එකතුව : හෙක්ටයාර් - 6.77** | |

වක්‍ර විනෝද පහසුකම් සලසාගත හැකි ස්ථාන පහත පරිදි වේ.

1. පුස්තකාල සංඛ්‍යාව - 2
2. රැස්වීම් ශාලා - 1 (ආසන සංඛ්‍යාව 400)

### 6.5.4.1 යෝජිත පොදු එළිමහන් විවෘතභූමි සැලැස්ම - 2030

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් වලට අනුව ජනගහනය 1000 කට හෙක්ටයාර් 1.4 ක් අවම ඉඩම් ප්‍රමාණයක් වශයෙන් පොදු එළිමහන් විවෘත භූමි ලෙස සංවර්ධන සැලැස්ම සැකසීමේදී වෙන්කළ යුතුය. මහව නාගරික බල ප්‍රදේශයේ 2017 වසර වන විට ජනගහනය 23,357වන අතර 2017 වසරේ ප්‍රදේශයේ දැනට පවතින පොදු එළිමහන් විවෘත භූමි ඉඩම් හෙක්ටයාර් 7.91 ක් පිහිටා ඇත.

සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයන්ට අනුව 2030 වන විට ජනගහනය 30,000 ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වන විට සෘජු විනෝද කටයුතු සඳහා ඉඩම් හෙක්ටයාර් 42 ක් අවම වශයෙන් වෙන්කළ යුතුය.

### 6.5.4.2. අරමුණ

සෘජු සහ වක්‍ර විනෝද කටයුතු සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීමත්, ඒවා විධිමත් ක්‍රමවේදයකට නඩත්තු කිරීමත් මඟින් වයස් භේදයකින් තොරව ප්‍රදේශයේ ජනතාවගේ සහ නගරයට පැමිණෙන ජනතාවගේ යහපත් මානසික සහ ශාරීරික සෞඛ්‍ය මට්ටමක් ඇති කිරීම.

මහව නාගරික බල ප්‍රදේශය සඳහා 2017 – 2030 වසර සඳහා යෝජිත සෘජු විනෝද කටයුතු සඳහා ඉදිරි සැලැස්ම වගු අංක 03 යටතේ සහ සිතියම් අංක 03 හි දක්වා ඇත.( ඇමුණුම් අංක 13)

**උපාය මාර්ග**

- මෙම ප්‍රදේශයේ පෞද්ගලික නිවාස පිහිටි ඉඩම් වල වපසරිය ඉතා වැඩි අතර අවශ්‍යතාවයක් ඇති වුවහොත් පමණක් ඉහත සඳහන් සැලැස්මේ දක්වා ඇති ස්ථාන විවෘත භූමි සඳහා යොදාගත යුතුය.
- දැනට පවතින සියළුම පොදු විවෘත භූමි ලෙස පවතින හිස් ඉඩම් හැකිතාක් දුරට ප්‍රයෝජනයට ගැනිම, වර්ගීකරණය කිරීම හා ප්‍රතිසංවර්ධනය කිරීම.
- පවතින විවෘත භූමි සහ හිස් ඉඩම් පරිසර හිතකාමී ආකාරයට උද්‍යාන ලෙස සංවර්ධනය කිරීම
- ප්‍රදේශයේ පවතින සියළු ක්‍රීඩාංගන පහසුකම් සහිතව ප්‍රතිසංවර්ධනය කිරීම.
- නඩත්තු සහ කළමනාකරණ කටයුතු ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.
- ප්‍රදේශයේ ප්‍රධාන වැව් වල රක්ෂිත ප්‍රදේශයන් රේඛීය උද්‍යාන ලෙස වැඩි දියුණු කළ යුතු

***සිතියම් අංක 6.5.3 විනෝද කටයුතු සඳහා සැලැස්ම***



## 6.6 ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික සංවර්ධන සැලැස්ම

ප්‍රදේශයේ පවතින පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු ස්ථාන සංරක්ෂණය කිරීම , සංස්කෘතික අංශ ප්‍රවර්ධනය කිරීම හා ඒවා ජනතාව අතර ප්‍රචලිත කරමින් සංචාරක ආකර්ෂණය දියුණු කිරීමත් මෙම සංවර්ධන උපාය මාර්ගයේ ප්‍රධාන අරමුණ වේ.

"කෘෂි ගොවිපළ රාජධානිය" යන්නෙහි "රාජධානිය" යන්නෙන් මහව ප්‍රදේශයේ පවතින ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික වටිනාකම ආරක්ෂා කිරීම යන්න සංඥා කෙරේ. ඒ යටතේ එන ප්‍රධාන අරමුණක් වන්නේ, පුරාවිද්‍යාත්මක, ඓතිහාසික හා දර්ශනීය ස්ථාන සංරක්ෂණය කිරීමත් සමග සංචාරක ආකර්ෂනය වර්ධනය කිරීම වේ. මහව නගර සංවර්ධනයට අදාල ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික වටිනාකම ආරක්ෂා කිරීමේ උපාය මාර්ගය දැක්වීමේදී එය 2030 මහව නගර සංවර්ධන සැලැස්ම දැක්ම හා පරමාර්ථ සෘජුවම බැඳී පවතින අතර එයට අයත් පරමාර්ථය වන්නේ 2030 වර්ෂය වන විට යාපහුව රාජධානිය හා අනෙකුත් සංස්කෘතික උරුමයන් හා ස්ථාන වල අනන්‍යතාවය සුරක්ෂිත කිරීම හා සංචාරක ආකර්ශණය ඒ වෙත වර්ධනය කිරීම යන්නයි.

ඒ අනුව, මහව ප්‍රදේශයේ ප්‍රධාන ඓතිහාසික උරුමයන් වන යාපහුව රාජධානිය සඳහා වෙන්වූ අක්කර 25ක් වූ භූමි ප්‍රමාණය ඇතුළුව අක්කර 81ක භූමි ප්‍රමාණයක් සංචාරක කලාපය ලෙස කලාපීකරණ සැලසුම මගින් වෙන් කිරීම ඓතිහාසික , පුරාවිද්‍යාත්මන හා සංස්කෘතික උපාය මාර්ගය යටතේ සිදුකරන ලදී. කොන්ඩදෙනියේ ගල් සොහොන්කොත් පිහිටි ප්‍රදේශයද අක්කර 06 සංරක්ෂිත ප්‍රදේශයක් ලෙස වෙන් කිරීමද සිදුකරනු ලබයි.

එමෙන්ම ප්‍රදේශයට ආවේණික වූ සංස්කෘතික වටිනාකම ඔප් නංවන දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය ඔප් නැංවීම උදෙසා යාපහුව රාජධානිය පිහිටි සංචාරක කලාපය තුළම අක්කර 10 භූමි ප්‍රමාණයක් ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ඉදිකිරීමටද උපාය මාර්ග සැලසුම්කොට ඇත.

මෙම ප්‍රදේශය අංගම්පොර සටන් කලාව සඳහා ප්‍රචලිත ප්‍රදේශයකි. ඒ සඳහා ප්‍රදේශයේ අක්කර 15 යුතු භූමි ප්‍රමාණයක් වෙන් කිරීමද මෙම උපාය මාර්ගය අයත් වේ.

ඉහත උපාය සංවර්ධන උපාය මාර්ග කරා ලඟාවීම සඳහා පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘතින් හඳුනාගන්නා ලදී.

1. යෝජිත  සංස්කෘතික ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථානය
2. යෝජිත සංස්කෘතික ගම්මානය
3. යෝජිත දේශීය ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානය
4. යෝජිත තානායම - දේශීය - විදේශීය සංචාරකයින් සඳහා

***සිතියම් අංක 6.6.1 ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික සංවර්ධන සැලැස්ම***




**ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික සංවර්ධන සැලැස්ම - 2018-2030**
**මහව නාගරික සංවර්ධන බල ප්‍රදේශය**

මූලාශ්‍රය :- නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය
වයඹ පළාත් කාර්යාලය
ජූනි 2018

සැලසුම් අංශය | මහව නාගරික සංවර්ධන සැලැස්ම (2018-2030) | සැකසුම :- පී. පී ඩී. රාජපක්ෂ

## 6.7 ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග (Implementation Strategy)

### 6.7.1 **යෝජිත ව්‍යාපෘති** (Strategic Action Project)

**ව්‍යාපෘති ප්‍රමුඛතාවය**

1. යෝජිත ආර්ථික මධ්‍යස්ථානය.
2. යෝජිත වාණිජ හා මූල්‍ය සංකීර්ණය. (පරණ බස් නැවතුම්පල)
3. දළදාගම හන්දිය ආර්ථික වාණිජ හා මූල්‍ය සංකීර්ණය.
4. යෝජිත ගුවන් පාලම.
5. නගරය හරහා ගමන් කරන මගීන් සඳහා ගිමන් නිවන මධ්‍යස්ථානයන් සංවර්ධනය කිරීම.
6. රුකෝගම සහ කොන්ඩදෙනිය මාර්ග ඒකාබද්ධව සංවර්ධනය කිරීම.
7. පොදු රථවාහන නැවතුම්පොල.
8. යෝජිත විනෝද හා විවේක මධ්‍යස්ථානය. (ඉඹුල්බොඩයාගම වැව අසල )
9. යෝජිත පුරාවිද්‍යාත්මක ස්ථාන කරා ළඟාවීමට විශේෂිත වූ ප්‍රවේශ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම.
10. සංස්කෘතික හා ප්‍රාදේශීය උරුමයන් සංවර්ධන හා ආරක්ෂා කිරිම ව්‍යාපෘතිය.
11. පරිසර හිතකාමී ඒකාබද්ධ ගොවිපොල මධ්‍යස්ථානය.
12. යෝජිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය.
13. අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීම
    1. විලව මාර්ගය නිකවැරටිය මාර්ගය දක්වා පුළුල් කිරීම. (අභ්‍යන්තර ප්‍රදේශ සංවර්ධනය සහ කර්මාන්ත කලාපයට මනා ප්‍රවේශකත්වයක් ලබාදීම)
    2. ලීලා මාවත, නිකවැරටිය මාර්ගය හමුවන තම්මිටගම හන්දිය දක්වා පුළුල් කිරීම.(නගරයේ අභ්‍යන්තර ප්‍රදේශ සංවර්ධනය කිරීම)
    3. ගම්මැද මාර්ගය විලව මාර්ගය දක්වා යා කිරීම.
    4. අලුත් හේරත්ගම මාර්ගය ලියනගම දක්වා පුළුල් කිරීම.
    5. යාපහුව වඩු පාසල අසල මාර්ගය යාපහුව දක්වා පුළුල් කිරීම.
14. යෝජිත නිවාස ව්‍යාපෘතිය.
15. යෝජිත නීතිඥ සංකීර්ණය.
16. කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය
17. සංස්කෘතික අංග පුහුණු මධ්‍යස්ථානය. (දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතියකි)

## ආර්ථික සංවර්ධන උපාය මාර්ග (Economic Development Projects)

### 1. යෝජිත ආර්ථික මධ්‍යස්ථානය (Economic Center)

| | |
|---|---|
| ව්‍යාපෘති මාතෘකාව<br>Project Title | යෝජිත ආර්ථික මධ්‍යස්ථානය |
| ව්‍යාපෘතිය<br>Project | කලාපයේ පවතින කෘෂි කාර්මික නිශ්පාදන සඳහා තොග අලෙවි මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම. |
| ව්‍යාපෘති යෝජනාව<br>Project Proposal | තොග අලෙවි මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම තුලින් කලාපයේ පවත්නා කෘෂි නිශ්පාදන සඳහා හොඳ වෙළඳපලක් නිර්මාණය කිරීම සහ ඒ තුලින් කෘෂි නිශ්පාදකයින්ගේ ආර්ථික මට්ටම වර්ධනය කිරීම. |

ව්‍යාපෘති ස්ථානය (Project Location)

| | | | | |
|---|---|---|---|---|
| ස්ථානය<br>(Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රික්කය<br>( District ) | කුරුණෑගල |
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පළාත් පාලන ආයතනය<br>(LA ) | මහව |
| මායිම්<br>(Boundary) | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ<br>(South) | බටහිර<br>(West ) |
| | පුද්ගලික ඉඩම | මහව නාගොල්ලාගම මාර්ගය | ලංකා බැංකුව | වැව |
| ප්‍රවේශ (Access) | මහව නාගොල්ලාගම මාර්ගය | | | |
| පිහිටීම සිතියම<br>Location Map | <br> | | | |
| යාබද ඉඩම් භාවිතා (සිතියම සමග විස්තර කරන්න)Adjacent Land Uses (explain with map) | යෝජිත ඉඩම මහව නගර මධ්‍යයෙන් ආරම්භ වන නාගොල්ලාගම මාර්ගයේ මීටර් 60ක් පමණ දුරින් පිහිටා ඇත. යොජිත ඉඩමට මීටර් 75ක් පමණ දුරින් මහව දුම්රිය ස්ථානය පිහිටීමද මීටර් 15ක් පමණ ආසන්නව මහව බස් නැවතුම්පල පිහිටීමද ආර්ථික මධ්‍යස්ථානයක් සඳහා මෙම ඉඩම වඩා යෝග්‍ය වීමට හේතු සාධක වී ඇත. වර්ථමානයේ පොදු වෙළඳපලක් පවතින අතර එය පැරණි ගොඩනැගිල්ලක සුළු වශයෙන් පවතී. | | | |

වයාපෘති සාධාරණීකරණය ( Project Justification )

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වයාපෘති වර්ගය (Project Type) | New | ✓ | වැඩිදියුණුකිරීම (Improvement) | | Extension | | ඉඩම් සංවර්ධනය පමණක්( Land Development only ) | | |
| වයාපෘති අංශය(Project Category) | සංරක්ෂණ (Conservation) | වාණිජ(Commercial) ✓ | භූදර්ශන (Landscape) | උරුමය(Heritage) | නිවාස (Housing) | Relocation | වෙනත් (Other) | | |
| වයාපෘති දර්ශනය (Project Aspect) | ආර්ථික(Economic ) ✓ | | සමාජ(Social ) | | | | | | |
| වයාපෘතිඅරමුණ (Project Objective) | 1. කෘෂි නිශ්පාදන සඳහා ජාතික වශයෙන් ව්‍යාප්ත වූ වෙළඳපලක් නිර්මානය කිරීම<br>2. කෘෂි නිශ්පාදකයින්ගේ ආර්ථික මට්ටම වර්ධනය කිරීම<br>3. කෘෂි කර්මාන්තය සඳහා තරුණ පරපුර යොමු කිරීම | | | | | | | | |
| වයාපෘති තාර්කිකත්වය Rational of project | වර්තමානයේ කෘෂී නිශ්පාදන අලෙවි කිරීම සඳහා මහව නගරයෙන් බාහිර වූ දඹුල්ල තඹුත්තේගම හා කුරුණෑගල වැනි නගර කරා ජනතාවට යාමට සිදුවී ඇති ඉහත යෝජනා තුලින් එම තත්වය අවම වනු ඇත. | | | | | | | | |

දේපල විස්තරය (Property Description)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම(Present Land Ownership) | නාගරික සංවර්ධන අධිකාරිය (UDA) | | පුද්ගලික (Private) | | රජයේ (State ) | ප්‍රාදේශීය සභාව මහව | |
| Free Encumbrances | ඔව්(Yes ) | නැත විස්තර දෙන්න | | | | | |
| | නැත(No) | If No give details | | | | | |
| හිමිකම පිළිබඳ විස්තර(Details of the Ownership ) | | | | | | | |
| මැනුම් සැලැස්ම විස්තර(Survey Plan Detail) | සමීක්ෂණ සැලසුම් අංක(Survey Plan No. ) | මිනින්දෝරු සැලැස්ම සකස් කළ නිළධාරීයාගේ නම (Name of the Surveyor) | දිනය (Date ) | ඉඩම් ප්‍රමාණය (Land Extent) | | | |
| දැනට පත්කර නොමැත | | | | 01 A | 1 R | 0 P | |

ව්‍යාපෘති විස්තරය

| ව්‍යාපෘති කාලය(Project Period) | කෙටි කාලීන(Short term) (1> year) | | මධ්‍ය කාලීනව(Mid Term ) (1-3 year) | ✓ | දීර්ඝ කාලීන(Long term ) (3< year) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (Total Estimated Cost) (Rs. Mn) | මිලියන 200 |
|---|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය ක්‍රමය (Financing Method) | පළාත් සභාව - වයඹ | | | | | | | |
| ව්‍යාපෘති විස්තරය Description of the Project (with map) | වර්ථමානයේ පොදු වෙළඳපල වශයෙන් පවත්නා භූමිය ආර්ථිකමධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමට සැලසුම් කෙරේ. | | | | | | | |

| පවතින යටිතල පහසුකම් (Infrastructure Availability ) | ජලය | අවශ්‍ය ධාරිතාවය පවතී (Required Capacity) | | | | |
|---|---|---|---|---|---|---|
| | විදුලිය | | | | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ | ප්‍රාදේශීය සභාව මගින් කරනු ලබයි | | | | |
| කලාපය(Zone ) | ඉහළ ඝනත්වයෙන් යුතු නාගරික කලාපය | කලාපීය අනුකූලතාව (Zoning compatibility) | ඔව් (Yes ) | ✓ | නැත (No) | |
| ඉතිහාසය (අදාළනම්)(History (if it relevant) **- නාගරික සංවර්ධන අධිකාරිය මගින් මෙම ව්‍යාපෘතිය අවුරුදු 20ක පමණ පෙර හඳුනාගත් ව්‍යාපෘතියකි** | | | | | | |

වර්තමාන තත්වය (මිනුම් සමග විස්තර කරන්න) (Present Status (Explain details with measurements))

පවත්නා තත්ත්වය (Existing Situation)

| විස්තර (Description) | වර්ථමාන භාවිතය | ඒකක ගණන (No.of units) | දිග(length) | පළල(width) |
|---|---|---|---|---|
| පැරණි ගොඩනැගිලි - 01 | පොදු වෙළඳපල | 01 | 50 අඩි | 30 අඩි |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

පිරිසැලසුම් සිතියම (Layout Map)

ව්‍යාපෘති අයවැය

| කටයුතු(Activity) | පිරිවැය(රු.මි.)( Cost (Rs. Mn)) |
|---|---|
| ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | මිලියන 200 |
| | |

අනුමත කරන ආයතන (Approval Agencies )

| කටයුතු (Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා (Authorized person ) |
|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | ප්‍රාදේශීය සභාව | සභාපති - ප්‍රාදේශීය සභාව |
| | | |
| | | |

**යෝජිත වාණිජ හා මූල්‍ය සංකීර්ණය. (Proposed Commercial and financial Complex at Daladagama Junction)**

## 2. යෝජිත වාණිජ හා මූල්‍ය සංකීර්ණය

| | |
|---|---|
| ව්‍යාපෘති මාතෘකාව Project Title | යෝජිත වාණිජ හා මූල්‍ය සංකීර්ණය |
| ව්‍යාපෘතිය Project | මහව නගර මධ්‍යයේ පැරණි බස් නැවතුම්පල පිහිටි ඌන භාවිතයේ පවත්නා ඉඩම් වාණිජ භාවිතයන්ට පරිවර්ථනය කිරීම |
| ව්‍යාපෘති යෝජනාව Project Proposal | මහව නගර මධ්‍යයේ පැරණි බස් නැවතුම්පල පිහිටි ඉඩම කිසිදු භාවිතයකට නොගෙන හිස් ඉඩමක් ලෙස පවතී. එම ඉඩම නවීන පහසුකම් වලින් යුතු වාණිජ සංකීර්ණයක් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් කෙරේ. |

ව්‍යාපෘති ස්ථානය (Project Location)

| | | | | |
|---|---|---|---|---|
| ස්ථානය (Location) | පළාත(Province) | වයඹ පළාත | දිස්ත්‍රික්කය ( District ) | කුරුණෑගල |
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පළාත් පාලන ආයතනය (LA ) | මහව |
| මායිම් (Boundary) | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | පුද්ගලික ඉඩම් | පුද්ගලික ඉඩම් | නිකවැරටිය - මඩගල්ල මාර්ගය | පුද්ගලික ඉඩම් |
| ප්‍රවේශ (Access) | පාදෙණිය - අනුරාධපුර මාර්ගය | | | |
| පිහිටීම සිතියම Location Map |  | | | |
| යාබද ඉඩම් භාවිතා (සිතියම සමග විස්තර කරන්න)Adjacent Land Uses (explain with map) | මෙම ඉඩම නගර මධ්‍යයේ පිහිටි පර්චස් 80ක පමණ ඉඩමක් වේ. වර්ථමානයේ බස් නැවතුම්පල වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම තුලින් මෙම ඉඩම ------------- පැරණි බස් නැවතුම්පල සහිතව හිස් ඉඩමක් වශයෙන් පවතී. ප්‍රධාන මාර්ගය දෙපස වාණිජ භාවිතයක් පවතී. | | | |

ව්‍යාපෘති සාධාරණීකරණය ( Project Justification )

| ව්‍යාපෘති වර්ගය (Project Type) | **New** නව **ව්‍යාපෘතියකි** | ✓ | වැඩිදියුණු කිරීම (Improvement) | | Extension | | ඉඩම් සංවර්ධනය පමණක්( Land Development only ) | |
|---|---|---|---|---|---|---|---|---|

| ව්‍යාපෘති අංශය (Project Category) | සංරක්ෂණ (Conservation) | වාණිජ (Commercial) | භූදර්ශන (Landscape) | උරුමය (Heritage) | නිවාස (Housing) | Relocation | වෙනත් (Other) |
|---|---|---|---|---|---|---|---|
| | | ✓ | | | | | |

| ව්‍යාපෘති දර්ශනය(Project Aspect) | ආර්ථික (Economic ) | ✓ | සමාජ (Social ) | |
|---|---|---|---|---|

| | |
|---|---|
| ව්‍යාපෘති අරමුණ (Project Objective) | 1. නගරයේ බස් නැවතුම්පල වෙනත් ස්ථානයක් කරා ගෙනයාම තුලින් එම ඉඩම නවීන පහසුකම් සහිත වාණිජ සංකීර්ණයක් ඉදිකිරීම<br>2. මහව පෝෂක ප්‍රදේශයේ ජනාතවට උපරිම වාණිජ මූල්‍ය සේවාවන් ලබාදීම. |
| ව්‍යාපෘති තාර්කිකත්වය Rational of project | නගර මධ්‍යයේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සතු මෙම ඉඩම බස් නැවතුම්පල නැවත ස්ථානගත කිරීම හේතුවෙන් කිසිම භාවිතයකට නොගෙන පවතී. මෙම නගර මධ්‍යයේ වාණිජ හා මූල්‍ය කටයුතු සඳහා වඩාත් යෝග්‍ය භූමියක් වේ. පොදු රථවාහන නැවතුම් වලින් සහිත නවීන වාණිජ සංකීර්ණයක් නගරය තුල දැනට ස්ථානගත වී නොමැත. |

දේපල විස්තරය (Property Description)

| වර්තමාන ඉඩම් හිමිකම(Present Land Ownership) | නාගරික සංවර්ධන අධිකාරිය | | පුද්ගලික (Private) | ✓ | රජයේ(State ) | |
|---|---|---|---|---|---|---|

| මැනුම්සැලැස්ම විස්තර (Survey Plan Detail) | සමීක්ෂණ සැලසුම් අංක (Survey Plan No. ) | මිනින්දෝරු සැලැස්ම සකස් කළ නිළධාරියාගේ නම (Name of the Surveyor) | දිනය (Date ) | ඉඩම් ප්‍රමාණය (Land Extent) | | |
|---|---|---|---|---|---|---|
| | දැනට සකස්කර නොමැත | | | -----A | 3R | ------P |

ව්‍යාපෘති විස්තරය

| ව්‍යාපෘති කාලය (Project Period) | කෙටි කාලීන(Short term) (1> year) | | මධ්‍ය කාලීනව(Mid Term ) (1-3 year) | ✓ | දීර්ඝකාලීන (Longterm) (3< year) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය(Total Estimated Cost) (Rs. Mn) | |
|---|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය ක්‍රමය (Financing Method) | නාගරික සංවර්ධන අධිකාරිය අරමුදල් (UDAFunding ) | | | | | | | |
| ව්‍යාපෘති විස්තරය Description of the Project (with map) | **1.** යෝජිත ඉඩම තුල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සමග එකඟතාවයකට එළඹීම.<br>**2.** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් කටටි කිරීම්. | | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පවතින යටිතල පහසුකම් (Infrastructure Availability ) | ජලය | ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත්ය | | | | |
| | විදුලිය | ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත්ය | | | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකාරණය | මහව ප්‍රාදේශීය සභාව මගින් කරනු ලබයි | | | | |
| කලාපය(Zone ) | ඉහල ඝනත්ව යුතු නාගරික කලාපය | කලාපීය අනුකූලතාව (Zoning compatibility) | ඔව් (Yes ) | ✓ | නැත(No) | |

වර්තමාන තත්වය(මිනුම් සමග විස්තර විස්තර කරන්න) (Present Status (Explain details with measurements))

පවත්නා තත්ත්වය (Existing Situation) - පැරණි බස් නැවතුම් පල පිහිටි භූමිය වේ

| විස්තර (Description) | ඒකක ගණන(No.of units) | දිග(length) | පළල (width) |
|---|---|---|---|
| | | | |
| පැරණි බස් නැවතුම්පල ගොඩනැගිල්ල | 01 | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

පිරිසැලසුම් සිතියම(Layout map)

යෝජිත සැලැස්ම හා ගොඩනැගිලි සැලසුම් අවශ්‍යතා(තිබේ නම්)( Proposed Plan & Building Design Requirements (if available))

ව්‍යාපෘති අයවැය

| කටයුතු(Activity) | පිරිවැය (රු.මි.)( Cost (Rs. Mn)) |
|---|---|
| | |
| | |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ඉදිරිකිරීම් කටයුතු | |
| | 300 |
| | |

අනුමත කරන ආයතන(Approval Agencies )

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| ගිවිසුමකට එළඹවීම | ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය | සභාපති - ශ්‍රී.ලං.ග.ම. |
| | නාගරික සංවර්ධන අධිකාරිය | සභාපති - නාගරික සංවර්ධන අධිකාරිය |
| | | |
| ඉදිකිරීම් කටයුතු | නාගරික සංවර්ධන අධිකාරිය | සභාපති - නාගරික සංවර්ධන අධිකාරිය |
| | | |
| | | |

රෙගුලාසි සහ මාර්ගෝපදේශ(Regulations and Guidelines)

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ(Regulations and Guidelines) | රෙගුලාසි(Regulations) | මාර්ගෝපදේශ(Guidelines) |
|---|---|---|
| විස්තර ඇමුණුම්(Details of Attachments) | | |

**යෝජිත වාණිජ හා මූල්‍ය සංකීර්ණය. (Proposed Commercial and financial Complex at Daladagama Junction)**

## 3. යෝජිත වාණිජ හා මූල්‍ය සංකීර්ණය

| | |
|---|---|
| ව්‍යාපෘති මාතෘකාව<br>Project Title | යෝජිත වාණිජ හා මූල්‍ය සංකීර්ණය |
| ව්‍යාපෘතිය<br>Project | මහව නගරයට ප්‍රධාන ප්‍රවේශකත්වය සලසන දළදාගම මංසන්ධිය ආශ්‍රිතව වාණිජ සංවර්ධනය ව්‍යාප්ත කිරීම. |
| ව්‍යාපෘති යෝජනාව<br>Project Proposal | නාගරික ප්‍රදේශයේ ප්‍රධාන ප්‍රවේශකත්වය සලසන අනුරාධපුර - පාදෙනිය ප්‍රවේශ මාර්ගය ආශ්‍රිතව පවත්නා ඌන භාවිතයේ පවතින ඉඩම් සංවර්ධනය කිරීම සහ කුඹුරු ඉඩම් තුල සිදුවන අනවසර ඉදිකිරීම වැලැක්වීම තුලින් සැලසුම් සහගත නාගරික සංවර්ධනය ව්‍යාප්ත කිරීම. |

### ව්‍යාපෘති ස්ථානය (Project Location)

| | | | | |
|---|---|---|---|---|
| ස්ථානය<br>(Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රිකය<br>( District ) | කුරුණෑගල |
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පළාත් පාලන ආයතනය<br>(LA ) | මහව |
| මායිම්<br>(Boundary) | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ<br>(South) | බටහිර<br>(West ) |
| | රන්කෙත හෝටලය | අනුරාධපුර - පාදෙනිය මාර්ගය | පෞද්ගලික කුඹුරු ඉඩම් | පුද්ගලික ඉඩම් |
| ප්‍රවේශ (Access) | අනුරාධපුර - පාදෙනිය මාර්ගය | | | |
| පිහිටීම සිතියම<br>Location Map |  | | | |
| යාබද ඉඩම් භාවිතා (සිතියම සමග විස්තර කරන්න)Adjacent Land Uses (explain with map) | දළදාගම මංසන්ධිය කලාපයේ ප්‍රධාන මංසන්ධියක් වේ. මහව - නිකවැරටිය- අනුරාධපුර හා කුරුණෑගල යන දිශාවන්ට සහ ජනගහනය එම මංසන්ධිය මගින් ප්‍රවේශකත්වය ලබාගනී. ඒ හේතුවෙන් මෙම මංසන්ධිය තුල ඉඩම් භාවිතා සිතියම අනුව වැඩි වශයෙන් කුඹුරු ඉඩම් පවතී. කොටසක් වාණිජ භාවිතයන් එම කුඹුරු ඉඩම් තුලින් අනවසර වාණිජ ඉදිකිරීම් වැඩි වශයෙන් සිදුවෙමින් පවතී.<br><br>අත්හරින ලද කුඹුරු ඉඩම් අනවසර ඉදිකිරීම් (වාණිජ භාවිතයන්) | | | |

| | |
|---|---|
| | |

ව්‍යාපෘති සාධාරණීකරණය ( Project Justification )

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය (Project Type) | New | ✓ | වැඩිදියුණු කිරීම (Improvement) | | Extension | | ඉඩම් සංවර්ධනය පමණක්( Land Development only ) | |
| ව්‍යාපෘති අංශය (Project Category) | සංරක්ෂණ (Conservation) | වාණිජ (Commercial) | භූදර්ශන (Landscape) | උරුමය (Heritage) | නිවාස (Housing) | Relocation | වෙනත් (Other) | |
| | | ✓ | | ✓ | | | | |
| ව්‍යාපෘති දර්ශනය(Project Aspect) | ආර්ථික (Economic ) ✓ | | | | සමාජ (Social ) ✓ | | | |
| ව්‍යාපෘති අරමුණ (Project Objective) | 1. නගරයේ අවභාවිතයේ පවතිව ඉඩම් සංවර්ධනය කිරීම.<br>2. නගරයේ අනවසර ඉදිකිරීම් වලක්වා ක්‍රමවත් සංවර්ධනයක් ඇති කිරීම<br>3. දළදාගම උප නගරය ආශ්‍රිතව සංවර්ධනය ධෛර්යමත් කිරීම<br>4. මහව නගරය ව්‍යාප්ත කිරීම සහ ඒ තුලින් සංක්‍රමණික ජනගහනයක වැඩි කිරීම | | | | | | | |
| ව්‍යාපෘති තාර්කිකත්වය Rational of project | නගරයේ ප්‍රධාන මාර්ග දෙපස ඉහල ඵලදායකත්වයක් ඇති ඉඩම් අත්හරින ලද කුඹුරු ඉඩම් වශයෙන් පැවතීම තුලින් නගරයේ සංවර්ධන ව්‍යාප්ත වීමක් සිදු නොවන අතර ඒ තුලින් අනවසර ඉදිකිරීම් ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමක් සිදුවේ. යෝජිත ව්‍යාපෘතිය තුලින් මෙම තත්වය අවම කිරීමට අපේක්ෂිතය. | | | | | | | |

දේපල විස්තරය (Property Description)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම (Present Land Ownership) | නාගරික සංවර්ධන අධිකාරිය (UDA ) | | පුද්ගලික (Private) | ✓ | රජයේ (State ) | | |
| මැනුම් සැලැස්ම විස්තර (Survey Plan Detail) | සමීක්ෂණ සැලසුම් අංක(Survey Plan No. ) | මිනින්දෝරු සැලැස්ම සකස් කළ නිළධාරීයාගේ නම (Name of the Surveyor) | | දිනය (Date ) | ඉඩම් ප්‍රමාණය (Land Extent) | | |
| | දැනට සකස් කර නොමැත | | | | 4A | 0R | 0P |

ව්‍යාපෘති විස්තරය

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය (Project Period) | කෙටි කාලීන (Short term) (1> year) | | මධ්‍ය කාලීනව(Mid Term ) (1-3 year) | ✓ | දීර්ඝ කාලීන (Longterm ) (3< year) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (Total Estimated Cost) (Rs. Mn) | |
| මූල්‍ය ක්‍රමය (Financing Method) | නාගරික සංවර්ධන අධිකාරිය (UDA Funding ) | | | | | | | |
| ව්‍යාපෘති විස්තරය Description of the Project (with map) | 1. ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය මගින් අත්කර ගැනීම<br>2. ඉඩම් ක්‍රමවත් කාණු පද්ධතියක් ඇතිව සංවර්ධනය කිරීම.<br>3. ඉඩම් හිමිකරුවන් වෙත සාධාරන ඉඩම් කොටස් බෙදා දීම සහ අනෙකුත් කොටස් පුද්ගලික අංශයේ දායකත්වය ඇතිව සංවර්ධනය කිරීම | | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පවතින යටිතල පහසුකම් (Infrastructure Availability ) | ජලය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත්ය | | | | |
| | විදුලිය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත්ය | | | | |
| | අපද්‍රව්‍ය කළමනාකරණය | මහව ප්‍රාදේශීය සභාව මගින් කරනු ලැබේ. | | | | |
| කලාපය (Zone ) | මධ්‍යම සනත්වයෙන් යුතු නාගරික කලාපය | කලාපීය අනුකූලතාව (Zoning compatibility) | ඔව් (Yes ) | ✓ | නැත (No) | |
| ඉතිහාසය (අදාළ නම්) (History (if it relevant))<br><br>යෝජිත ඉඩම දිගුකාලනීව අත්හරින ලද කුඹුරු ඉඩම් වශයෙන් පවතී. ඒ සමගම මෙම ඉඩම තුල මාර්ග දෙපස අනවසර ඉදිකිරීම් විශාල වශයෙන් පවතී. | | | | | | |

වර්තමාන තත්වය (මිනුම් සමග විස්තර විස්තර කරන්න)(Present Status (Explain details with measurements))

පවත්නා තත්ත්වය (Existing Situation) - අත්හරින ලද කුඹුරු ඉඩම් වශයෙන් පවතී.

ව්‍යාපෘති අයවැය

| කටයුතු(Activity) | පිරිවැය (රු.මි.)( Cost (Rs. Mn)) |
|---|---|
| 1. ඉඩම අත්පත් කර ගැනීම | 16,000,000 |
| 2. ඉඩම් ගොඩකර සංවර්ධනය කිරීම | 5,000,000 |
| | |
| එකතුව | **21,000,000** |
| | |

අනුමත කරන ආයතන(Approval Agencies )

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| 1. ඉඩම් අත්පත් කර ගැනීම | නාගරික සංවර්ධන අධිකාරිය | සභාපති- නාගරික සංවර්ධන අධිකාරිය |
| 2. ඉඩම ගොඩකර සංවර්ධනය කිරීම | ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | සභාපති-ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව |
| 3. ඉඩම් සංවර්ධනය කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය | සභාපති නාගරික සංවර්ධන අධිකාරිය |
| | | |
| | | |
| | | |

| |
|---|
| |
| රෙගුලාසි සහ මාර්ගෝපදේශ (Regulations and Guidelines) |

| | |
|---|---|
| විස්තර ඇමුණුම් (Details of Attachments) | |

## 4. නිකවැරටිය - මඩගල්ල මාර්ගයේ දුම්රිය හරස් මාර්ගය හරහා ගුවන් පාලමක් ඉදිකිරීම

ව්‍යාපෘතිය හඳුනාගැනීම

| | |
|---|---|
| ව්‍යාපෘති **මාතෘකාව**<br>Project Title | යෝජිත ගුවන් පාලම |
| ව්‍යාපෘතිය<br>Project | දුම්රිය හරස් මාර්ගය දිනකට පැය 05කට ආසන්න වේලාවක් වසා දැමීම තුලින් ඇතිවන මාර්ග තදබදය අවම කිරීම. |
| ව්‍යාපෘති යෝජනාව<br>Project Proposal | නගරයේ ප්‍රධාන මාර්ගය දුම්රිය මාර්ගය හරහා ගමන් කිරීම සහ දුම්රිය මංසන්ධිය හේතුවෙන් ප්‍රධාන මාර්ගය වසා දැමීම නිසා ඇතිවන මාර්ග තදබදය අවම කිරීම. |

ව්‍යාපෘති **ස්ථානය (**Project Location)

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය**<br>(Location) | **පළාත** (Province) | වයඹ පළාත | දිස්ත්‍රික්කය<br>( District ) | කුරුණෑගල |
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පළාත් පාලන ආයතනය<br>(LA ) | මහව |
| ප්‍රවේශ (Access) | නිකවැරටිය - මඩගල්ල මාර්ගය | | | |
| පිහිටීම සිතියම<br>Location Map |   | | | |
| යාබද ඉඩම් භාවිතා (සිතියම සමග විස්තර කරන්න)Adjacent Land Uses (explain with map) | යෝජිත ව්‍යාපෘතිය ආසන්න ප්‍රදේශය පුද්ගලික අයිතිය යටතේ පවතින වාණිජ භාවිතයන් වේ. | | | |

ව්‍යාපෘති සාධාරණීකරණය( Project Justification )

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය (Project Type) | New | ✓ | වැඩිදියුණු කිරීම (Improvement) | | Extension | | ඉඩම් සංවර්ධනය පමණක්( Land Development only ) | |
| ව්‍යාපෘති අංශය (Project Category) | සංරක්ෂණ (Conservation) | වාණිජ (Commercial) | භූදර්ශන (Landscape) | උරුමය (Heritage) | නිවාස (Housing) | Relocation | වෙනත් (Other) ✓ | |
| ව්‍යාපෘති දර්ශනය(Project Aspect) | ආර්ථික (Economic ) | | | | සමාජ (Social ) ✓ | | | |
| ව්‍යාපෘති අරමුණ (Project Objective) | 1. දුම්රිය හරස් මාර්ගය නගරයේ ප්‍රධාන මාර්ගය හරහා ගමන් කිරීම හේතුවෙන් ඇතිවන මාර්ග තදබදය අවම කිරීම.<br>2. මාර්ගය දිනකට 50 වතාවක් පමණ වසා තැබීම හේතුවෙන් ඇතිවන මාර්ග තදබදය අවම කිරීම. | | | | | | | |
| ව්‍යාපෘති තාර්කිකත්වය Rational of project | වර්ථමානයේ දිනකට පැය 05ක් පමණ එසේම වාර 50ක් පමන ප්‍රධාන මාර්ගය වසා දැමීම සිදුවේ. ඒ අනුව, නගර මධ්‍යයේ වාහන තදබදයන් ඇතිවේ. එය වැලැක්වීම ව්‍යාපෘතියේ අරමුණයි. | | | | | | | |

දේපල විස්තරය(Property Description)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම (Present Land Ownership) | නාගරික සංවර්ධන අධිකාරිය (UDA ) | | පුද්ගලික (Private) | ✓ | රජයේ (State ) | | ✓ |
| මැනුම් සැලැස්ම විස්තර (Survey Plan Detail) | සමීක්ෂණ සැලසුම් අංක (Survey Plan No. ) | මිනින්දෝරු සැලැස්ම සකස් කළ නිළධාරියාගේ නම (Name of the Surveyor) | | දිනය (Date ) | ඉඩම් ප්‍රමාණය (Land Extent) | | |
| | මිනින්දෝරු සැලැස්ම සකස් කර නැත | | | | ……A | ……R | …..P |

ව්‍යාපෘති විස්තරය

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිකාල ය (Project Period) | කෙටිකාලීන(Short term) (1> year) | | මධ්‍යකාලීනව (Mid Term ) (1-3 year) | | දීර්ඝකාලී න(Longt erm ) (3< year) | ✓ | මුළු ඇස්තෙමින්තුගත පිරිවැය(Total Estimated Cost) (Rs. Mn) | |
| මූල්‍යක්‍රමය(Financing Method) | මාර්ග සංවර්ධන අධිකාරිය | | | | | | | |
| ව්‍යාපෘතිවිස්තරයDescription of the Project (with map) | **1.** ගුවන් පාලම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම තුලින් යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කලාපය(Zone ) | ඉහල සනත්වයෙන් යුතු නාගරික කලාපය | කලාපීයඅනුකූලතාව(Zoning compatibility) | ඔව්(Yes ) | ✓ | නැත(No) | |

| |
|---|
| වර්තමාන තත්වය (මිනුම් සමග විස්තර විස්තර කරන්න)(Present Status (Explain details with measurements)) වර්තමානයේ දිනකට 50 වතාවක් පමණ එනම් පැය 05 පමණ ප්‍රධාන මාර්ගය වැසෙන අතර ඒ හේතුවෙන් ප්‍රධාන මාර්ගය අවහිර වේ. |
| පවත්නාතත්ත්වය (Existing Situation) |

පිරිසැලසුම්සිතියම(Layout map)




ව්‍යාපෘති අයවැය

| කටයුතු(Activity) | පිරිවැය(රු.මි.)( Cost (Rs. Mn)) |
|---|---|
| 1. ඉඩම් අත්පත් කරගැනීම | මිලියන 1000 |
| 2. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | |
| | |
| | |
| | |

අනුමත කරන ආයතන(Approval Agencies )

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| 1. ඉඩම් අත්පත් කර ගැනීම | මාර්ග සංවර්ධන අධිකාරිය | සභාපති- මාර්ග සංවර්ධන අධිකාරිය |
| 2. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | මාර්ග සංවර්ධන අධිකාරිය | සභාපති- මාර්ග සංවර්ධන අධිකාරිය |
| | | |
| | | |
| | | |
| | | |

රෙගුලාසි සහ මාර්ගෝපදේශ (Regulations and Guidelines)

## 5. යෝජිත හෙළ බොජුන්හල, විවේක හා විනෝද මධ්‍යස්ථානය (Relaxing Center )

**ව්‍යාපෘතිය හඳුනා ගැනීම**

| | |
|---|---|
| ව්‍යාපෘති මාතෘකාව<br>Project Title | යෝජිත විනෝද හා විවේක මධ්‍යස්ථානය |
| ව්‍යාපෘතිය<br>Project | අනුරාධපුර - පාදෙනිය ප්‍රධාන මාර්ගයේ ගමන් කරන ජනතාව සඳහා ගිමන් නිවන මධ්‍යස්ථානයන් ස්ථාපිත කිරීම. |
| ව්‍යාපෘති යෝජනාව<br>Project Proposal | මහව නාගරික ප්‍රදේශය හරහා අනුරාධපුර - යාපනය මාර්ගය දක්වා ගමන් කරන මහජනතාව සඳහා රැඳී සිටීමේ මධ්‍යස්ථානයන් සංවර්ධනය කර ඒ තුලින් නගරයේ ආකර්ශනය සංචාරකයින් වෙත ලබාගැනීම. |

ව්‍යාපෘති ස්ථානය (Project Location)

| | | | | |
|---|---|---|---|---|
| ස්ථානය<br>(Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රිකය ( District ) | කුරුණෑගල |
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පළාත් පාලන ආයතනය (LA ) | මහව |
| මායිම්<br>(Boundary) | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | පුද්ගලික ඉඩම් | අනුරාධපුර - පාදෙනිය මාර්ගය | පුද්ගලික ඉඩම් | (කුඹුරු) පුද්ගලික ඉඩම් |
| ප්‍රවේශ (Access) | අනුරාධපුර - පාදෙණිය මාර්ගය | | | |
| පිහිටීම සිතියම<br>Location Map |  | | | |
| යාබද ඉඩම් භාවිතා (සිතියම සමග විස්තර කරන්න)Adjacent Land Uses (explain with map) | අනුරාධපුර - පාදෙණිය මාර්ගය දෙපස මිශ්‍ර සංවර්ධන භාවිතයන් පවතී. එසේම ප්‍රධාන මාර්ගය තුලින් කොළඹ- යාපනය දක්වා ගමන් කරන ජනගහනයක් සිටී. එම ජනතාවට රැඳී සිටීමේ මධ්‍යස්ථානයක් ලෙස මෙම ව්‍යාපෘතිය යෝජනා කෙරේ. | | | |

ව්‍යාපෘති සාධාරණීකරණය ( Project Justification )

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය (Project Type) | New | ✓ | වැඩිදියුණු කිරීම (Improvement) | | Extension | | ඉඩම් සංවර්ධනය පමණක්( Land Development only ) | |
| ව්‍යාපෘති අංශය (Project Category) | සංරක්ෂණ (Conservation) | වාණිජ (Commercial) | භූදර්ශන (Landscape) | උරුමය (Heritage) | නිවාස (Housing) | Relocation | වෙනත් (Other) | |
| | | ✓ | | | | | | |
| ව්‍යාපෘති දර්ශනය(Project Aspect) | ආර්ථික (Economic ) | ✓ | සමාජ (Social ) | | | | | |
| ව්‍යාපෘති අරමුණ (Project Objective) | 1. නාගරික ප්‍රදේශය හරහා ගමන් කරන මගීන්ට ගිමන නිවන මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීම (වැසිකිලි, ආපනශාලා, දේශීය නිශ්පාදනන වෙළඳ සැල් සහිතව.<br>2. කලාපයේ කෘෂි නිශ්පාදන සඳහා දේශීය විදේශීය සංචාරකයින් අරමුණු කරගෙන වෙළඳසලක් ලබාදීම.<br>3. මහව නාගරික ප්‍රදේශය පිළිබඳව දේශීය සහ විදේශීය සංචාරක ආකර්ශනය ලබාගැනීම. | | | | | | | |
| ව්‍යාපෘති තාර්කිකත්වය Rational of project | වර්ථමානයේ අනුරාධපුර - පාදෙනිය මාර්ගය ආශ්‍රිතව විශාල මගී ජනතාවක් ගමන් කලද ගිමන් නිවන මධ්‍යස්ථානයක් නොමැති අතර. ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමේ අවශ්‍යතාවය පැවතියද වර්ථමානයේ එවැනි ස්ථානයක් නොමැත.<br><br>යෝජිත ස්ථානයන් සංවර්ධනය කිරීම තුලින් ඉහත අවශ්‍යතාවය සපුරාලිය හැක. | | | | | | | |

දේපල විස්තරය(Property Description)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම (Present Land Ownership) | නාගරික සංවර්ධන අධිකාරිය (UDA ) | | පුද්ගලික (Private) | | රජයේ (State ) | මහව ප්‍රාශීය සභාව |
| මැනුම් සැලැස්ම විස්තර (Survey Plan Detail) | සමීක්ෂණ සැලසුම් අංක(Survey Plan No. ) | මිනින්දෝරු සැලැස්ම සකස් කරන ලද නිළධාරීයාගේ නම (Name of the Surveyor) | දිනය (Date ) | ඉඩම් ප්‍රමාණය (Land Extent) | | |
| | දැනට සකස් කර නොමැත. | | | 0A | 01R | 0P |

ව්‍යාපෘති විස්තරය

| ව්‍යාපෘති කාලය (Project Period) | කෙටි කාලීන (Short term) (1> year) | ✓ | මධ්‍ය කාලීනව(Mid Term ) (1-3 year) | | දීර්ඝ කාලීන (Longterm ) (3< year) | | මුළු ඇස්තෙමින්තුගත පිරිවැය (Total Estimated Cost) (Rs. Mn) | |
|---|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය ක්‍රමය (Financing Method) | 1. ප්‍රාදේශීය සභාව - මහව<br>2. උපදේශකත්වය - නාගරික සංවර්ධන අධිකාරිය | | | | | | | |
| ව්‍යාපෘති විස්තරය Description of the Project (with map) | යෝජිත ව්‍යාපෘතිය පහත අංග වලින් සමන්විත වේ.<br>1. තාවකාලික ආපනශාලා<br>2. දේශීය නිශ්පාදන අලෙවිසැල්<br>3. වැසිකිලි සංකීර්ණය | | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පවතින යටිතල පහසුකම් (Infrastructure Availability ) | ජලය | ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත්ය | | | | |
| | විදුලිය | ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත්ය | | | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකාරණය | මහව ප්‍රාදේශීය සභාව මගින් කරනු ලබයි | | | | |
| කලාපය(Zone ) | ඉහල ඝනත්ව යුතු නාගරික කලාපය | කලාපීය අනුකූලතාව(Zoning compatibility) | ඔව් (Yes ) | ✓ | නැත(No) | |

වර්තමාන තත්වය (මිනුම් සමග විස්තර විස්තර කරන්න) (Present Status (Explain details with measurements))

ප්‍රධාන මාර්ගයට ආසන්නව පිහිටි පැරණි ගම් සහ කාර්යාලය පිහිටි ඉඩමක්

පවත්නා තත්ත්වය (Existing Situation)

| විස්තර (Description) | ඒකක ගණන (No.of units) | දිග (length) | පළල (width) |
|---|---|---|---|
| ප්‍රාදේශය සභාව සතු පැරණි ගොඩනැගිල්ලක් පවතී | 01 | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

පිරිසැලසුම් සිතියම(Layout map)

ව්‍යාපෘති අයවැය

| කටයුතු(Activity) | පිරිවැය (රු.මි.)( Cost (Rs. Mn)) |
|---|---|
| යෝජිත ස්ථානය සංවර්ධනය කිරීම | මිලියන 20 |
| | |
| | |
| | |
| | මිලියන 20 |

අනුමත කරන ආයතන(Approval Agencies )

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| | | |
| 1. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ප්‍රාදේශීය සභාව- මහව | සභාපති - ප්‍රාදේශීය සභාව |
| 2 ව්‍යාපෘති උපදේශකත්වය | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (වයඹ පළාත), නා.සං.අ. |
| | | |
| | | |

රෙගුලාසි සහ මාර්ගෝපදේශ (Regulations and Guidelines)

## 6. සංස්කෘතික හා ප්‍රාදේශීය උරුමයන් සංවර්ධනය හා අරක්ෂා කිරිමේ ව්‍යාපෘතිය (Cultural and Heritage Development Projects)

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

| | |
|---|---|
| ව්‍යාපෘති මාතෘකාව<br>Project Title | යෝජිත සංස්කෘතික මධ්‍යස්ථානය |
